

වාර්ෂික කාර්ය සාධන වාර්තාව

வருடாந்த செயற்றிறன் அறிக்கை

Annual Performance Report

2025

පටුන

01 ආයතනික පැතිකඩ 01-05

02 ප්‍රධාන අංශ 06-11

03 පාලනය සහ කළමනාකරණය 12-27

04 උපාය මාර්ගික විශ්ලේෂණය 28-41

05 පාර්ලිමේන්තු කටයුතු හා පර්යේෂණ අංශයේ ප්‍රගතිය 42-63

06 පරිපාලන සහ මූල්‍ය කාර්යසාධනය 64-90



ආයතනික පැතිකඩ

1947 ඔක්තෝබර් 14 දින ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුවේ විපක්ෂය ආරම්භ වූවේ එවක ලංකා සමසමාජ පක්ෂයේ එන්.එම්. පෙරේරා මහතා විපක්ෂ නායක වෙමිනි. 1947, 1972 සහ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ මගින් විපක්ෂ නායක තනතුර තවත් තහවුරු විය. විපක්ෂය යනු විරුද්ධ වන්නන් නොව "ඊළඟ රජය කරවන්නන්ය (Government in Waiting)" විකල්ප මත අරමුණ ප්‍රකාරව මහජන වගවීමට අදාළ විධායක වගකීමක් එම කාර්යාලයට පැවරේ.

ප්‍රජාතන්ත්‍රවාදී භාවිතය හා පහසුකම් මත ප්‍රධාන කුළුනක් වන මෙය තම රාජකාරිය සඳහා පර්යේෂණ කටයුතු, පාර්ලිමේන්තු සභාවේ කටයුතු වෙනුවෙන් විපක්ෂයේ මන්ත්‍රීන්ට සහාය වීම, පාර්ලිමේන්තු කමිටු පවත්වාගෙන යාම සඳහා සහාය වීම සහ පාර්ලිමේන්තු විපක්ෂයේ කාර්යභාරය මහජනයාට සන්නිවේදනය කිරීම යන කාර්යයන් පක්ෂග්‍රාහී නොවන ආකාරයෙන් ඉටු කරනු ලබයි.

පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය තුළ පාර්ලිමේන්තුවේ කාර්යභාරය අංශ හතරකින් සිදු වේ. නියෝජනය, නීති සම්පාදනය, මූල්‍ය පාලනය සහ අධීක්ෂණය එම කරුණු හතරයි. මෙම ක්‍රියාවලිය ඉටු කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන, ස්ථාවර නියෝග, කථානායකවරයාගේ තීන්දු සහ සාම්ප්‍රදායිකව භාවිත කරනු ලබන පරිචයන් උපයෝගි කර ගනු ලැබේ. එම සිවිවැදෑරුම් අරමුණු ක්‍රියාවට නැංවීමට මූලික නීතිය හා පාර්ලිමේන්තුව මගින් සම්මත කොට ඇති වෙනත් නීති රීති තුළින් පාර්ලිමේන්තුවට පැවරී ඇති වගකීම් සහ වගවීම් පාර්ලිමේන්තුව තුළ ශක්තිමත් කිරීම පවත්වාගෙන යාමේ ප්‍රධාන කාර්යභාරය පැවරී ඇත්තේ විපක්ෂයටයි.

වාර්ෂික අයවැය ලේඛනය පිළිබඳ වූ විවාදය සංවිධානය කිරීම පවත්වාගෙන යාම පිළිබඳ වූ වගකීම පමණක් විමසා බැලුව ද එය තහවුරු වේ. වෙස්මිනිස්ටර් පාර්ලිමේන්තු සම්ප්‍රදාය අපට හඳුන්වා දුන් මහා බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ විපක්ෂය හඳුන්වනු ලබන්නේ රැජිනගේ හෝ රජුගේ විපක්ෂය ලෙසයි. මෙම අර්ථ ගැන්වීම තුළ ද පැහැදිලි වන්නේ පාර්ලිමේන්තු ක්‍රමය තුළ විපක්ෂයේ ඇති වගකීමයි.

පසුගිය කාල සීමාව තුළ විපක්ෂ නායක කාර්යාලය පාර්ලිමේන්තුව තුළ සිය කාර්යභාර්ය ඉටු කළේ මෙම මූලික අරමුණු ඉටු කර ගැනීම සඳහා වූ වගවීමකින් යුතුවයි. සමාලෝචිත වසර තුළ විපක්ෂ නායක කාර්යාලය ඉටු කළ කාර්යභාර්ය විචාරශීලීව විමසා බැලීමටත්, එය හඳුනා ගැනීමටත් මෙම වාර්තාව මඟපෙන්වීමක් වන බව අපගේ විශ්වාසයයි.

දැක්ම



ආණ්ඩුව සුපරීක්ෂාවට යටත්කොට තැබීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමේ විශිෂ්ටතම ආයතනය බවට පත්වීම.

මෙහෙවර

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සහතික කොට ඇති ජනතා පරමාධිපත්‍ය සුරක්ෂිත කිරීමට, පාර්ලිමේන්තුව සතු වගකීම සහ ක්‍රියාකාරිත්වය ශක්තිමත් කරමින්, රටේ ස්වාධිපත්‍ය සුරකින, සියලු ජන කොටස් සඳහා වූ සාධාරණත්වය ඉටුකරන සමාජයක් සඳහා ආණ්ඩුකරණ දුර්වලතා තුළින් මතුවන තර්ජන, අභියෝග පිළිබඳව පූර්වාවවාදය සපයන, ආන්තිකකරණයට ලක්වූ ජනතාවගේ හඬ නියෝජනය කරමින් ප්‍රගාමී අධීක්ෂණය සහ ධනාත්මක විකල්ප ප්‍රතිපත්ති සහ විසඳුම් සියලු ජන කොටස් සඳහා ලබාදීම.



අරමුණු



පාර්ලිමේන්තුවේ කටයුතු, පොදු වගකීම් පිළිබඳ කාර්යයන් ඉටු කිරීම සඳහා පරිපාලන සම්බන්ධීකරණය, උපලේඛන සැකසීම, තොරතුරු සම්පාදනය සහ භෞතික පහසුකම් සැපයීම තුළින් විපක්ෂ නායකතුමාට සහාය වීම.



රාජ්‍ය ආයතන සහ අමාත්‍යාංශ නිරීක්ෂණය කරමින් තොරතුරු ඒකරාශී කිරීම සහ රාජ්‍ය ප්‍රතිපත්ති විමසුමට ලක් කරමින් කාර්ය සාධන වාර්තා සම්පාදනය කරමින් විපක්ෂයේ උපාය මාර්ගික ප්‍රතිචාර සඳහා අවශ්‍ය කටයුතු කිරීම.



ආණ්ඩුව විසින් ගෙන එනු ලබන යෝජනා පිළිබඳ විශේෂඥ මත සහ සාක්ෂි පදනම්ව සංක්ෂිප්ත ප්‍රතිපත්ති සටහන් සැකසීම හා පාර්ලිමේන්තු පටිපාටීන්ට අනුගතව ප්‍රතිචාර දැක්වීමට පහසුකම් සැලසීම.



ආණ්ඩුකරණයේ දුර්වලතා පුරෝකථනය කරගනිමින් ප්‍රජාතන්ත්‍රවාදයට එරෙහි තර්ජන පිළිබඳව කාලානුරූපී සුපරීක්ෂණය තුළින් විපක්ෂයේ ප්‍රතිචාර සඳහා ජාලගත ක්‍රමවේදයක් සහතික කිරීම.



සංවර්ධනය සඳහා විකල්ප ප්‍රතිපත්ති රාමුවක් හා සාධනීය විසඳුම් සැකසීමට විශේෂඥ ප්‍රතිපත්ති සම්පාදකයන් සම්බන්ධ කරගනිමින් පර්යේෂණ පැවැත්වීම හා විධිමත් සර්වව්‍යාපී විකල්ප තුළින් ආණ්ඩුවේ යෝජනා ජාතික අභියෝග ආමන්ත්‍රණය සඳහා සකස් කිරීමට කටයුතු කිරීම.



තොරතුරු ප්‍රවේශ අවස්ථා සහතික කරමින්, ආණ්ඩුවේ වගවීම් පිළිබඳව විපක්ෂයේ අභියෝග කිරීම් පාර්ලිමේන්තු ප්‍රශ්න තුළින් හා කාරක සභා තුළින් විමසීමට පහසුකම් සැපයීම.



විපක්ෂයේ සියලු පාර්ශ්ව සහ මන්ත්‍රීවරුන් ඒකාබද්ධ ක්‍රියාකාරිත්වයක් සඳහා සංවිධානය කිරීම, ඒ සඳහා වූ සම්පත් හුවමාරුව තුළින් ආණ්ඩුවට උපරිම පීඩනයක් එල්ල කිරීමට වගවීම.



විපක්ෂයේ අරමුණු සාධනය කිරීමට හා අධීක්ෂණ හැකියාවන් වැඩි දියුණු කිරීමට සිවිල් සමාජය, මාධ්‍ය, නීති ක්ෂේත්‍රයේ පුරවැසි කණ්ඩායම් සමඟ සෘජු සබඳතා ගොඩනැගීම.

ප්‍රධාන කාර්යයන්

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට සිය කාර්යයන් විශිෂ්ට අයුරින් ඉටු කිරීමට හැකිවනු පිණිස විපක්ෂයට එහි කාර්යයන් කාර්යක්ෂමව හා ඵලදායී අයුරින් ඉටු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සපයා දීම විපක්ෂ නායක කාර්යාලයේ ප්‍රධාන කාර්යයි. මීට අමතරව මහජන ගැටලු පාර්ලිමේන්තුවේ සහ ඉන් පිටත රාජ්‍ය යාන්ත්‍රණය ඔස්සේ විසඳා ගැනීම සඳහා අවශ්‍ය පහසුකම්කරණය සිදු කරනු ලබන අතර ඒ අනුව, විපක්ෂ නායක කාර්යාලය විසින් පහත සඳහන් කාර්යයන් ඉටු කරනු ලැබේ.

පාර්ලිමේන්තුවේ ගරු විපක්ෂ නායකතුමා වෙනුවෙන් සිදු කරනු ලබන කාර්යයන්


- කාලීන වැදගත් සිදුවීම් හා මහජන ගැටලු සම්බන්ධයෙන් පර්යේෂණ සාරාංශ/කෙටි සටහන් සකස් කිරීම.
- පාර්ලිමේන්තුවේ විවාදයට ගැනීමට නියමිත අයිතමයනට අදාළ න්‍යාය පත්‍රය හා සම්බන්ධ පනත් කෙටුම්පත්, ගැසට් නිවේදන, රෙගුලාසි පිළිබඳව සංක්ෂිප්ත වාර්තා ලබා දීම සහ පනත් කෙටුම්පත් සංශෝධන ඉදිරිපත් කිරීම.
- ගරු විපක්ෂ නායකතුමා හමුවීමට අපේක්ෂා කරන විදේශ දූත කණ්ඩායම්, රාජ්‍ය තාන්ත්‍රිකයන්, විදේශීය සම්භාවනීය අමුත්තන් සහ සෙසු ප්‍රභූන් සමඟ සාකච්ඡා සඳහා එම රැස්වීම් සංවිධානය අවශ්‍ය සංධාන (Protocol) හා සම්පාදන සහාය ලබා දීම.
- කාලීන වැදගත් සිදුවීම් සම්බන්ධ විමර්ශන කටයුතු සිදුකර වාර්තා ලබාදීම.
- විවිධ ගැටලු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට ගරු විපක්ෂ නායකතුමා හමුවීමට පැමිණෙන කණ්ඩායම් සඳහා රැස්වීම් සම්බන්ධීකරණය.
- විවිධ ජාත්‍යන්තර සංවිධාන, පර්යේෂණ ආයතන විසින් නිකුත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ඇගයීම් කර සටහන් සකස් කිරීම.
- ගරු විපක්ෂ නායකතුමා වෙත ලැබෙන මහජන ගැටලු, පැමිණිලි හා දුක්ගැනවිලි සම්බන්ධව සුබදායී ප්‍රතිචාරයක් ලබාගනු පිණිස අදාළ ආයතනයන් වෙත ඉදිරිපත් කිරීම හා ඒවා සම්බන්ධ පසු විපරම් සිදුකිරීම.

විපක්ෂයේ ප්‍රධාන සංවිධායක හා නියෝජ්‍ය සංවිධායකවරුන් වෙනුවෙන් සිදු කරනු ලබන කාර්යයන්

- විපක්ෂය වෙනුවෙන් පාර්ලිමේන්තු විවාදවලට සහභාගි වන ගරු මන්ත්‍රීවරුන්ගේ නම් ඇතුළත් කර කටික ලැයිස්තුව සකස් කිරීම.
- විපක්ෂයේ පාර්ලිමේන්තු කණ්ඩායම් රැස්වීම පැවැත්වීම සඳහා අදාළ කටයුතු සම්පාදනය කිරීම.
- පාර්ලිමේන්තුවේ පැවැත්වෙන ඡන්ද විමසීම් සඳහා පහසුකම්කරණය.
- විපක්ෂයේ සියලු දේශපාලන පක්ෂ කණ්ඩායම් සමඟ පාර්ලිමේන්තු කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- පාර්ලිමේන්තු කමිටු සඳහා මන්ත්‍රීවරුන් නම් කිරීම හා එම ලැයිස්තුව පාර්ලිමේන්තු මහ ලේකම් වෙත ඉදිරිපත් කිරීම හා එම කමිටු තුළ කාර්යයන් අධීක්ෂණය කිරීම.
- පාර්ලිමේන්තුවේ පක්ෂ නායක රැස්වීම් සඳහා සහභාගිවීමට සහායවීම.
- පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය අධීක්ෂණය කිරීම හා විපක්ෂයේ කාර්යභාරය නිවැරදිව සිදුවන බවට සහතික වීම.

විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් වෙනුවෙන් සිදු කරනු ලබන කාර්යයන්

- පාර්ලිමේන්තු රැස්වීම් සතිවල න්‍යාය පත්‍රය අනුව පනත් කෙටුම්පත් සහ රෙගුලාසි සම්බන්ධ පර්යේෂණ හා සංක්ෂිප්ත සටහන් ලබාදීම.
- අයවැය විවාද හා කාරක සභා විවාද සඳහා අවශ්‍ය පර්යේෂණ සිදු කර දීම.
- සභාව කල්තැබීමේ විවාද සඳහා අවශ්‍ය පසුබිම් තොරතුරු සම්බන්ධ පර්යේෂණ සිදුකිරීම.
- සභාව කල්තබන අවස්ථාවේ යෝජනා හා ප්‍රශ්න සැකසීම සඳහා අවශ්‍ය සහාය ලබා දීම සහ ඒවා පාර්ලිමේන්තුවේ මහලේකම් වෙත භාරදීමට අදාළ කටයුතු සම්බන්ධීකරණය.
- පාර්ලිමේන්තු විවාද සඳහා සූදානම් වීමට විවාදයට අදාළ විෂයය පිළිබඳ විශේෂඥයන් හා වෘත්තීය සමිති නියෝජිතයින් විසින් ප්‍රකාශ කිරීමට අවශ්‍ය අදහස් ගරු මන්ත්‍රීවරුන් වෙත සන්නිවේදනය කිරීම සඳහා අවශ්‍ය රැස්වීම් සංවිධානය.
- පාර්ලිමේන්තුවේ විවිධ කමිටු සඳහා සහ අනෙකුත් පාර්ලිමේන්තු කටයුතු සඳහා ගරු විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ උපරිම ඵලදායිතාවකින් යුතුව ඔවුන්ට දායකත්වය සැපයීම සඳහා අවශ්‍ය පහසුකම්කරණය.
- පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව විසින් තීරණය කරනු ලබන යෝජිත දින, කාලවේලාවන් සහ පාර්ලිමේන්තු වැඩසටහන භාෂාත්‍රයෙන් සකස් කොට එය විපක්ෂයේ සියලු ගරු මන්ත්‍රීවරුන් වෙත සන්නිවේදනය කිරීම.
- පක්ෂ කණ්ඩායම් රැස්වීමේ දී පාර්ලිමේන්තු සතියේ විවාදයට ගනු ලබන කරුණු සම්බන්ධව දැනුම්වත් කිරීම.



ප්‍රධාන අංශ

පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කාර්යාලය පාර්ලිමේන්තු කටයුතු අංශය, පර්යේෂණ අංශය, පරිපාලන හා ආයතන අංශය, මාධ්‍ය අංශය, ප්‍රසම්පාදන කළමනාකරණ ඒකකය, ගිණුම් අංශය හා අභ්‍යන්තර විගණන අංශය යන අංශ ඔස්සේ ක්‍රියාත්මක වේ.

පාර්ලිමේන්තු කටයුතු අංශයේ කාර්යයන්

- පාර්ලිමේන්තු රැස්වීම් සතිවලට අදාළ පාර්ලිමේන්තු වැඩසටහන් සහ වෙනත් තීරණ පිළිබඳ දැනුවත් වී ඒවා පිළිබඳ වාර්තා පවත්වාගෙන යාමට පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීම්වලට විපක්ෂ නායක කාර්යාලය නියෝජනය කරමින් සහභාගි වීම.
- පාර්ලිමේන්තුවේ කාරක සභා සඳහා විපක්ෂයේ නියෝජනයන් නම් කර පාර්ලිමේන්තු මහලේකම් වෙත ඉදිරිපත් කිරීම.
- ගරු විපක්ෂ නායකතුමා ඇතුළු විපක්ෂයේ පක්ෂ නායකයන් විසින් ස්ථාවර නියෝග අංක (27(2)) යටතේ ඉස්මතු කරනු ලබන හදිසි පොදු වැදගත්කමකින් යුත් කරුණුවලට අදාළ ප්‍රශ්න පාර්ලිමේන්තුවේ මහලේකම් වෙත ඉදිරිපත් කිරීම.
- විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන පාර්ලිමේන්තු ප්‍රශ්න, කල් තැබීමේ යෝජනා, කල් තැබීමේ ප්‍රශ්න සහ වරප්‍රසාද කඩවීම් සඳහා පහසුකම් සැලසීම.
- ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් පිළිතුරු අපේක්ෂාවෙන් විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් විසින් ඉස්මතු කරන ප්‍රශ්න පාර්ලිමේන්තුවේ මහලේකම් වෙත ඉදිරිපත් කිරීම.
- විසර්ජන පනත් කෙටුම්පත තුන්වන වර කියවීම සඳහා වාර්ෂික අයවැය වැඩසටහනේ කාරක සභා අවස්ථා වැඩසටහන භාෂාත්‍රයෙන් සකස් කොට, එය මුද්‍රණය කරවා, අදාළ රජයේ ආයතන වෙත එහි මුද්‍රිත පිටපත් බෙදාදීම.
- විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් වෙත අවශ්‍ය සහාය ලබාදෙනු පිණිස සියලු පාර්ලිමේන්තු රැස්වීම් දිනයන්හිදී විපක්ෂ නායක ලේකම් සඳහා වෙන්කර ඇති නිල මැදිරියෙහි නිලධාරීන් රාජකාරියෙහි යෙදවීම.
- පාර්ලිමේන්තු කමිටු හරහා රජයේ කාර්ය සාධනය අධීක්ෂණය කිරීමට පහසුකම් සැලසීම.
- විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් සඳහා පාර්ලිමේන්තු කාලසටහන් සහ රැස්වීම් වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම.
- විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ගේ පැමිණීම සහ කථා කරන කාලය සම්බන්ධීකරණය කිරීම.
- විපක්ෂය වෙනුවෙන් පාර්ලිමේන්තු විවාදවලට සහභාගිවන ගරු මන්ත්‍රීවරුන්ගේ නම් ඇතුළත් කර ඒ සඳහා අවශ්‍ය කාල වේලාවන් වෙන් කර කටික ලැයිස්තුව සකස් කිරීම.
- පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ දිනපොතක් පවත්වාගෙන යාම. (විපක්ෂ පාර්ලිමේන්තු දිනපොත සභාවේ කටයුතු, කාරක සභා කටයුතු, පාර්ලිමේන්තු කටයුතු සම්බන්ධ විශේෂ සිදුවීම් ඇතුළත්).

පර්යේෂණ අංශයේ කාර්යයන්

- සෑම පාර්ලිමේන්තු රැස්වීම් සතියකම පාර්ලිමේන්තුවේ විවාදයට ගැනීමට නියමිත අයිතමයනට අදාළ න්‍යාය පත්‍රය හා සම්බන්ධ පනත් කෙටුම්පත්, ගැසට් නිවේදන, රෙගුලාසි කෙටුම්පත්, පනත් කෙටුම්පත් සංශෝධන ආදිය ඇතුළත් පසුබිම් සටහන් පත් සකස් කොට, නිසි අවධානය පිණිස ඒවා විපක්ෂයේ පක්ෂ නායකයන් වෙත ලබාදීම.
- රජයේ අමාත්‍යාංශ සහ ආයතනවල කාර්ය සාධනය නිරීක්ෂණය කිරීම.
- විකල්ප ප්‍රතිපත්ති යෝජනා සහ රාමු සංවර්ධනය කිරීම.
- ආංශික අධීක්ෂණ කාරක සභාවන්හි කටයුතු නිරීක්ෂණය කිරීම.
- ගරු විපක්ෂ නායකවරයා ඇතුළු විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් වෙත පාර්ලිමේන්තු විවාද සඳහා තොරතුරු, සටහන් හා ලිපිලේඛන ලබා දීම.
- කාලීන සිදුවීම් සම්බන්ධයෙන් තොරතුරු රැස් කිරීම, වාර්තා තබා ගැනීම හා විවාද සටහන් සැකසීම.
- කාර්යාලීය නිල වෙබ් අඩවිය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.
- අයවැය කාරක සභා අවස්ථාවන්වලදී විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් දැනුවත් කිරීම සඳහා වැඩමුළු, සම්මන්ත්‍රණ, සම්පත්දායක හමුවීම් සංවිධානය හා සම්බන්ධීකරණය කිරීම.
- ගරු විපක්ෂ නායකවරයා හා ගරු විපක්ෂ මන්ත්‍රීවරුන් සමඟ ආන්තිකකරණයට ලක්වූ ජන කණ්ඩායම්, පුරවැසි සංවිධාන, වෘත්තීය සමිති නියෝජිතයන් හමුවී සිදුකරනු ලබන සාකච්ඡා සම්බන්ධීකරණය කිරීම.
- කාර්යාලය විසින් හඳුන්වාදෙන ලද දැනුම් කළමනාකරණ වැඩසටහන (KMLOP) ක්‍රියාත්මක කිරීම.
- එම වැඩසටහන සඳහා දත්ත හා තොරතුරු ඇතුළත් කරනු ලබන ප්‍රධාන ප්‍රවේශකයන් ලෙස ක්‍රියා කිරීම.
- ගරු විපක්ෂනායකතුමා හා විපක්ෂ මන්ත්‍රීවරුන්ගේ පාර්ලිමේන්තු විවාද සඳහා අවශ්‍ය කාලීන තොරතුරු සහ සටහන් සම්පාදනය කිරීම.
- ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විවාද සඳහා අවශ්‍යවන ඇතැම් කාලීන තොරතුරු හා සිදුවීම් පිළිබඳව පර්යේෂණ සටහන් සහ පත්‍රිකා සම්පාදනය.
- ගරු විපක්ෂනායකතුමා හා ගරු විපක්ෂ මන්ත්‍රීවරුන් සහභාගිවන නිල රැස්වීම් හා පාර්ශවකරුවන් අතර නිල සාකච්ඡා සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.
- නිල මැදිරි රාජකාරි.

පරිපාලන හා ආයතන අංශයේ කාර්යයන්

- කාර්ය මණ්ඩලයේ පුද්ගලික ලිපිගොනු නිසි පරිදි පවත්වාගෙන යාම.
- කාර්යාලයේ සේවක සංඛ්‍යාවේ පවත්නා පුරප්පාඩු පිරවීම.
- තාර්කික අයුරින් කාර්ය මණ්ඩලයට කාර්යාලයීය රාජකාරි වෙන් කිරීම.
- රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගැනීමට නියමිත කාර්යාලයේ කාර්ය මණ්ඩලයට අදාළ වැඩකටයුතු සිදු කිරීම.
- ගරු විපක්ෂ නායකතුමාගේ, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ සහ විපක්ෂයේ නියෝජ්‍ය සවිධායකතුමන්ලාගේ පුද්ගලික කාර්ය මණ්ඩලය වෙත පත්වීම් ලිපි, සේවය අවසන් කිරීමේ ලිපි නිකුත් කිරීම.
- විපක්ෂ කණ්ඩායමේ ගරු මන්ත්‍රීවරුන් විදේශගත වීමට අදහස් කරන විටදී ගරු විපක්ෂ නායකතුමාගේ අනුමැතිය ලබාගැනීම.
- තාවකාලික කාර්ය මණ්ඩලය සඳහා රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල වෙත අයඳුම්පත් සහතික කිරීම.
- කාර්ය මණ්ඩලයේ ණය, අතිකාල හා නිවාඩු අනුමත කිරීම.
- පුහුණු සංවර්ධන සැලැස්මක් සකස් කිරීම.
- කාර්යාලයේ කාර්ය මණ්ඩලයට අදාළ පුහුණු වැඩසටහන්වලට යොමු කිරීම.
- වාහන සංචිතය කළමනාකරණය සහ නඩත්තුව.
- කාර්ය සාධන වාර්තාව හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.
- කාර්යාලයේ ගබඩාව නිසි ලෙස නඩත්තු කිරීම.
- වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය හා භාණ්ඩ ලේඛනය නිසි පරිදි පවත්වාගෙන යාම.
- කාර්යාලයේ ලිපිගොනු කළමනාකරණය
- කොළඹ 07, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 30 දරන ස්ථානයේ පිහිටි විපක්ෂ නායක කාර්යාලයට අදාළ පරිපාලන කටයුතු.

ප්‍රසම්පාදන කළමනාකරණ ඒකකයේ කාර්යයන්

- පර්යේෂණ සහ ප්‍රතිපත්ති සංවර්ධනය සඳහා සේවා සහ සම්පත් ප්‍රසම්පාදනය.
- ප්‍රසම්පාදන සැලසුම් සකස් කිරීම.
- ප්‍රසම්පාදන කමිටු පත් කිරීම.
- සේවා සහ සැපයුම් සඳහා ගිවිසුම්වලට එළඹීම.

ගිණුම් අංශයේ කාර්යයන්

- විපක්ෂ නායක කාර්යාලය සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුව සකස් කිරීම.
- සියලුම ලැබීම් හා ගෙවීම් පිළිබඳ ගිණුම් පවත්වාගෙන යාම හා ඒ සම්බන්ධ කටයුතු.
- CIGAS සහ ITMIS මඟින් ලෙජර, වාර්තා පවත්වාගෙන යාම සහ දෛනික ගනුදෙනු සැසඳීම.
- දෙපාර්තමේන්තු පොත් භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශ සමග සැසඳීම.
- මාසික වැටුප් සකස් කිරීම හා ගෙවීම.
- මාසික ගිණුම් සාරාංශය සැකසීම හා ඉදිරිපත් කිරීම.
- මාසික බැංකු සැසඳුම් ප්‍රකාශ සකස් කිරීම.
- විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම.
- රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු සහ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තු මාර්ගෝපදේශයනට අනුව වාර්ෂික ගිණුම් වසා දැමීම.
- රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් සම්බන්ධ කටයුතු.

මාධ්‍ය අංශයේ කාර්යයන්

- සෑම පාර්ලිමේන්තු රැස්වීම් සතියකම සහා ගර්භය තුළ සහ පාර්ලිමේන්තු කමිටු රැස්වීම් වලදී විපක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් හා මන්ත්‍රිවරියන් විසින් ඉටු කරනු ලබන කාර්යභාරය ක්‍රමානුකූලව වාර්තා කොට, විපක්ෂ බුලටිනය ඇතුළු ලිඛිත, ශ්‍රව්‍ය හා දෘශ්‍ය මාධ්‍ය හරහා එකී ක්‍රියාකාරකම් රට පුරා ජනතාව අතරේ සමාජගත කිරීම.
- විශේෂ මාධ්‍ය හමු, ප්‍රවෘත්ති සාකච්ඡා සහ මාධ්‍ය වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම මඟින්, ජාතික හා ජාත්‍යන්තර මාධ්‍ය ආයතන සමග විපක්ෂ නායක කාර්යාලයේ ස්ථාවර සන්නිවේදන සබඳතාවයක් ගොඩනංවා, පාර්ලිමේන්තු විපක්ෂයේ ස්ථාවරයන් හා ක්‍රියාකාරකම් ජාතික හා ජාත්‍යාන්තර මට්ටමින් ප්‍රචාරය කිරීම.
- විපක්ෂ නායක කාර්යාලයේ ප්‍රතිපත්තිමය අරමුණු, නිල ප්‍රකාශ සහ ස්ථාවරයන් ජනතාව අතරේ පුළුල් ලෙස ව්‍යාප්ත කිරීම සඳහා අන්තර්ගත නිෂ්පාදනය, ඩිජිටල් සන්නිවේදනය සහ සමස්ත මාධ්‍ය සම්බන්ධීකරණය කිරීම.

අභ්‍යන්තර විගණන අංශයේ කාර්යයන්

- විගණන කළමනාකරණ රැස්වීම් පැවැත්වීම
- අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශයන්ට අනුකූලව විගණන කටයුතු සිදු කිරීම.

විපක්ෂ නායක කාර්යාලයේ සංයුතිය

විපක්ෂ නායක කාර්යාලයේ ස්ථිර කාර්ය මණ්ඩලය 2025.12.31 දිනට

තනතුරු නාමය	අනුමත තනතුරු	දැනට සිටින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු
ලේකම්	01	01	–
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්	01	–	01
ගණකාධිකාරි	01	01	–
සහකාර ලේකම්	02	02	–
පරිපාලන නිලධාරි	01	01	–
භාෂා පරිවර්තක	02	01	01
සම්බන්ධීකරණ ලේකම්	01	01	
සංඛ්‍යා ලේඛන නිලධාරි	01	–	01
සංවර්ධන නිලධාරි	05	05	–
කළමනාකරණ සේවා නිලධාරි	12	12	–
රියදුරු	13	11	02
කාර්යාල සේවක සේවය	10	08	02
එකතුව	50	43	07

විපක්ෂ නායකතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය 2025.12.31 දිනට

තනතුරු නාමය	අනුමත තනතුරු	දැනට සිටින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු
පෞද්ගලික ලේකම්	01	01	–
සම්බන්ධීකරණ ලේකම්	02	02	–
මාධ්‍ය ලේකම්	01	01	–
මහජන සම්බන්ධතා නිලධාරි	01	01	–
පුද්ගලික සහකාර	01	01	–
කළමනාකරණ සේවා නිලධාරි	05	04	01
රියදුරු	02	02	–
කාර්යාල සේවක සේවය	02	–	02
එකතුව	15	12	03

විපක්ෂ නායක කාර්යාලයේ තාවකාලික කාර්ය මණ්ඩලය 2025.12.31 දිනට


තනතුරු නාමය	අනුමත තනතුරු	දැනට සිටින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු
කළමනාකරණ සේවා නිලධාරි	08	08	–
පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු	02	02	–
ඡායාරූප ශිල්පී	01	01	–
විඩියෝ කැමරා ශිල්පී	01	01	–
රියදුරු	07	07	–
කාර්යාල සේවක සේවය	02	02	–
බංගලා භාරකරු	02	02	–
මුරකරු	01	01	–
අරක්කැමි	02	02	–
සනීපාරක්ෂක කම්කරු	01	01	–
එකතුව	27	27	–

විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය 2025.12.31 දිනට

තනතුරු නාමය	අනුමත තනතුරු	දැනට සිටින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු
පෞද්ගලික ලේකම්	01	01	–
සම්බන්ධීකරණ ලේකම්	02	02	–
මාධ්‍ය ලේකම්	01	01	–
මහජන සම්බන්ධතා නිලධාරි	01	01	–
කළමනාකරණ සේවා නිලධාරි	03	03	–
රියදුරු	02	02	–
කාර්යාල සේවක සේවය	02	02	–
එකතුව	12	12	–

විපක්ෂයේ නියෝජ්‍ය සංවිධායකවරුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය (i) හා (ii)
2025.12.31 දිනට

තනතුරු නාමය	අනුමත තනතුරු	දැනට සිටින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු
පෞද්ගලික ලේකම්	02	02	–
සම්බන්ධීකරණ ලේකම්	04	04	–
මාධ්‍ය ලේකම්	02	02	–
මහජන සම්බන්ධතා නිලධාරි	02	02	–
කළමනාකරණ සේවා නිලධාරි	06	06	–
රියදුරු	04	04	–
කාර්යාල සේවක සේවය	04	04	–
එකතුව	24	24	–



පාලනය සහ කළමනාකරණය

විපක්ෂ නායක කාර්යාලයේ පරිපාලන සහ මෙහෙයුම් ව්‍යුහය ඉතා විධිමත් ය. ආණ්ඩුව විසින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රතිපත්ති විමර්ශනය කිරීම සහ පාර්ලිමේන්තුව තුළ විපක්ෂයේ කාර්යභාරය ප්‍රශස්ත මට්ටමින් පවත්වාගෙන යාම මෙම කාර්යාලයේ මූලික අරමුණ වේ.



ප්‍රධාන නායකත්වයේ පැතිකඩ

විපක්ෂයේ උපායමාර්ගික සහ ව්‍යවස්ථාදායක කටයුතු මෙහෙයවනු ලබන්නේ පහත සඳහන් ප්‍රධාන නායකත්වය විසිනි.



විපක්ෂ නායක: ගරු සජිත් ප්‍රේමදාස මහතා



විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
ගරු ගයන්ත කරුණාතිලක මහතා



විපක්ෂයේ නියෝජ්‍ය සංවිධායක
ගරු ජේ. සී. අලවතුවල මහතා



විපක්ෂයේ නියෝජ්‍ය සංවිධායක
ගරු අජිත් පී. පෙරේරා මහතා

පාර්ලිමේන්තු කාරක සභාවල විපක්ෂයේ නායකත්වය

ව්‍යවස්ථාදායකය තුළ වූ කාර්යයන් විධිමත් කිරීම සඳහා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව පිහිටුවා ඇති සියලුම කාරක සභා තුළ විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් සිය දායකත්වය සහ නායකත්වය කැපී පෙනෙන ලෙස පෙන්නුම් කර ඇත.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව - COPA

සභාපති: ගරු කබීර් හෂීම් මහතා, පා.ම.
විපක්ෂය නියෝජනය කරන සාමාජිකයන්:

- ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා, පා.ම.
- ගරු ජේ. සී. අලවතුවල මහතා, පා.ම.
- ගරු හෙක්ටර් අප්පුහාමි මහතා, පා.ම.
- ගරු කවින්දිරන් කෝඩීස්වරන් මහතා, පා.ම.
- ගරු චානක මාදුගොඩ මහතා, පා.ම.
- ගරු රෝහිත අබේගුණවර්ධන මහතා, පා.ම.
- ගරු චාමර සම්පත් දසනායක මහතා, පා.ම.
- ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා, පා.ම.
- ගරු එම්. ඒ. එම්. තාහිර් මහතා, පා.ම.

රජයේ මුදල් පිළිබඳ කාරක සභාව - COPF

සභාපති: ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා, පා.ම.
විපක්ෂය නියෝජනය කරන සාමාජිකයන්:

- ගරු රවී කරුණානායක මහතා, පා.ම.
- ගරු හර්ෂණ රාජකරුණා මහතා, පා.ම.
- ගරු රවුෆ් හකීම් මහතා, පා.ම.
- ගරු චිත්‍රාල් ප්‍රනාන්දු මහතා, පා.ම.
- ගරු ශානක්‍යන් රාජපුත්තිරන් රාසමානික්කම් මහතා, පා.ම.

තේරීම් කාරක සභාව

විපක්ෂය නියෝජනය කරන සාමාජිකයන්:

- ගරු ගයන්ත කරුණාතිලක මහතා, පා.ම.
- ගරු රවුෆ් හකීම් මහතා, පා.ම.
- ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා, පා.ම.
- ගරු රවී කරුණානායක මහතා, පා.ම.

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව

විපක්ෂය නියෝජනය කරන සාමාජිකයන්:

- ගරු සජිත් ප්‍රේමදාස මහතා, පා.ම.
- ගරු ගයන්ත කරුණාතිලක මහතා, පා.ම.
- ගරු රවුෆ් හකීම් මහතා, පා.ම.
- ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා, පා.ම.
- ගරු ගරු ඥාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම්, පා.ම.
- ගරු රවී කරුණානායක මහතා, පා.ම.
- ගරු ඩී. වී. චානක මහතා, පා.ම.

ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව

විපක්ෂය නියෝජනය කරන සාමාජිකයන්:

- ගරු ඉම්රාන් මහරූෆ් මහතා, පා.ම.
- ගරු චමින්ද විජේසිරි මහතා, පා.ම.
- ගරු අජිත් පී. පෙරේරා මහතා, පා.ම.

ගෘහ්‍ය කාරක සභාව

විපක්ෂය නියෝජනය කරන සාමාජිකයන්:

- ගරු රෝහිනී කුමාරි විජේරත්න මහත්මිය, පා.ම.
- ගරු දිලීප් වෙදආරච්චි මහතා, පා.ම.
- ගරු ජේ. සී. අලවතුවල මහතා, පා.ම.
- ගරු කින්ස් නෙල්සන්, පා.ම.
- ගරු සුජිත් සංජය පෙරේරා, පා.ම.
- ගරු එම්. එස්. උතුමාලෙබ්බේ, පා.ම.

ආචාරධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව

විපක්ෂය නියෝජනය කරන සාමාජිකයන්:

- ගරු අජිත් පී. පෙරේරා මහතා, පා.ම.
- ගරු හේෂා විතානගේ මහතා, පා.ම.
- ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා, පා.ම.
- ගරු ඥානමුත්තු ශ්‍රීනේෂන් මහතා, පා.ම.
- ගරු අනුරාධ ජයරත්න මහතා, පා.ම.
- ගරු අමීර්තනාදන් අඩෙක්කලනාදන් මහතා, පා.ම.

ක්‍රම හා විධි පිළිබඳ කාරක සභාව

විපක්ෂය නියෝජනය කරන සාමාජිකයන්:

- ගරු අජිත් පී. පෙරේරා මහතා, පා.ම.
- ගරු මනෝ ගනේෂන් මහතා, පා.ම.
- ගරු චතුර ගලප්පත්ති මහතා, පා.ම.
- ගරු රෝහණ බණ්ඩාර මහතා, පා.ම.
- ගරු සුජිත් සංජය පෙරේරා මහතා, පා.ම.
- ගරු අර්ජුන සුජීව සේනසිංහ මහතා, පා.ම.
- ගරු චාමර සම්පත් දසනායක මහතා, පා.ම.
- ගරු දිලිත් ජයවීර මහතා, පා.ම.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව

විපක්ෂය නියෝජනය කරන සාමාජිකයන්:

- ගරු මුජිබුර් රහුමාන් මහතා, පා.ම.
- ගරු එස්. එම්. මරික්කාර් මහතා, පා.ම.
- ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා, පා.ම.
- ගරු දයාසිරි ජයසේකර මහතා, පා.ම.
- ගරු චමින්ද විජේසිරි මහතා, පා.ම.
- ගරු අර්ජුන සුජීව සේනසිංහ මහතා, පා.ම.
- ගරු මනෝ ගනේෂන් මහතා, පා.ම.
- ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා, පා.ම.
- ගරු ඩී. වී. චානක මහතා, පා.ම.
- ගරු අනුරාධ ජයරත්න මහතා, පා.ම.
- ගරු දිලිත් ජයවීර මහතා, පා.ම.

ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව

විපක්ෂය නියෝජනය කරන සාමාජිකයන්:

- ගරු චමින්ද්‍රානි කිරිඇල්ල මහත්මිය, පා.ම.
- ගර ජනාදිපති නීතිඥ නිසාම් කාරියප්පර් මහතා, පා.ම.
- ගරු අමීර්තනාදන් අඩෙක්කලනාදන් මහතා, පා.ම.
- ගරු ෆයිසර් මුස්තාපා මහතා, පා.ම.
- ගරු චිත්‍රාල් ප්‍රනාන්දු මහතා, පා.ම.

මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව

විපක්ෂය නියෝජනය කරන සාමාජිකයන්:

- ගරු ජගත් විතාන මහතා, පා.ම.
- ගරු රෝහිණි කුමාරි විජේරත්න මහත්මිය, පා.ම.
- ගරු දිලිප් වෙදආරච්චි මහතා, පා.ම.
- ගරු ඉම්රාන් මහරූෆ් මහතා, පා.ම.
- ගරු වරුණ ලියනගේ මහතා, පා.ම.
- ගරු කේ. කාදර් මස්තාන් මහතා, පා.ම.
- ගරු එම්. ඒ. එම්. තාහිර් මහතා, පා.ම.
- ගරු රෝහිත අබේගුණවර්ධන මහතා, පා.ම.
- ගරු චානක මාදුගොඩ මහතා, පා.ම.
- ගරු අර්ජුන සුජීව සේනසිංහ මහතා, පා.ම.

පසුපෙළ මන්ත්‍රීවරුන්ගේ කාරක සභාව

විපක්ෂය නියෝජනය කරන සාමාජිකයන්:

- ගරු චතුර ගලප්පත්ති මහතා, පා.ම.
- ගරු බී. ආරියවංශ මහතා, පා.ම.
- ගරු චානක මාදුගොඩ මහතා, පා.ම.
- ගරු සුරංග රත්නායක මහතා, පා.ම.
- ගරු (වෛද්‍ය) ඉලෙයිතම්බි සිරිනාත් මහතා, පා.ම.
- ගරු එම්. එස්. අබ්දුල් වාහිද් මහතා, පා.ම.

උසස් නිලතල පිළිබඳ කාරක සභාව

විපක්ෂය නියෝජනය කරන සාමාජිකයන්:

- ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා, පා.ම.
- ගරු චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය, පා.ම.
- ගරු රිෂාඩ් බදියුදීන් මහතා, පා.ම.
- ගරු දයාසිරි ජයසේකර මහතා, පා.ම.
- ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා, පා.ම.
- ගරු ෆයිසර් මුස්තාපා මහතා, පා.ම.
- ගරු කේ. කාදර් මස්තාන් මහතා, පා.ම.

ආංශික අධීක්ෂණ කාරක සභා

එසේම 10 වන පාර්ලිමේන්තුව තුළ සියලුම අමාත්‍යාංශ 25 හි විෂය පථයන් ආවරණය වන පරිදි පිහිටුවා ඇති ආංශික අධීක්ෂණ කාරක සභා 7න් කාරක සභා 3ක සභාපතිත්වය විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් උසුලන අතර, ආංශික කාරක සභා 7 තුළම විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් සාමාජිකත්වය ලබා සිය දායකත්වය ලබා දේ.

අධ්‍යාපන, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව

සභාපති: ගරු හේෂා විතානගේ මහතා, පා.ම.

විපක්ෂය නියෝජනය කරන සාමාජිකයන්:

- ගරු (ආචාර්ය) වී. එස්. රාධාකෘෂ්ණන් මහතා, පා.ම.
- ගරු තුරෙයිරාසා රවිකරන් මහතා, පා.ම.
- ගරු චානක මාදුගොඩ මහතා, පා.ම.

පරිසර, කෘෂිකර්ම සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව

සභාපති: ගරු හෙක්ටර් අප්පුහාමි මහතා, පා.ම.

විපක්ෂය නියෝජනය කරන සාමාජිකයන්:

- ගරු කින්ස් නෙල්සන් මහතා, පා.ම.
- ගරු රෝහිත අබේගුණවර්ධන මහතා, පා.ම.
- ගරු ඥානමුත්තු ශ්‍රීනේෂන් මහතා, පා.ම.
- ගරු චිත්‍රාල් ප්‍රනාන්දු මහතා, පා.ම.

යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව

සභාපති: ගරු එස්. එම්. මරික්කාර් මහතා, පා.ම.

විපක්ෂය නියෝජනය කරන සාමාජිකයන්:

- ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා, පා.ම.
- ගරු ජගත් විතාන මහතා, පා.ම.
- ගරු අජිත් පී. පෙරේරා මහතා, පා.ම.
- ගරු චතුර ගලප්පත්ති මහතා, පා.ම.

ආර්ථික සංවර්ධන සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව

විපක්ෂය නියෝජනය කරන සාමාජිකයන්:

- ගරු සුරංග රත්නායක මහතා, පා.ම.
- ගරු ජීවන් තොන්ඩමන් මහතා, පා.ම.
- ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා, පා.ම.
- ගරු අනුරාධ ජයරත්න මහතා, පා.ම.

රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණ පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව

විපක්ෂය නියෝජනය කරන සාමාජිකයන්:

- ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා, පා.ම.
- ගරු ඥානක්‍යන් රාජපුත්තිරන් රාසමානික්කම් මහතා, පා.ම.
- ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා, පා.ම.
- ගරු අජිත් පී. පෙරේරා මහතා, පා.ම.
- ගරු මුජිබුර් රහුමාන් මහතා, පා.ම.



විද්‍යා, තාක්ෂණ සහ ඩිජිටල් පරිණාමනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව

විපක්ෂය නියෝජනය කරන සාමාජිකයන්:

- ගරු චතුර ගලප්පත්ති මහතා, පා.ම.
- ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා, පා.ම.

සෞඛ්‍ය, ජනමාධ්‍ය සහ කාන්තා සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව

විපක්ෂය නියෝජනය කරන සාමාජිකයන්:

- ගරු දයාසිරි ජයසේකර මහතා, පා.ම.
- ගරු අමීර්තනාදන් අඩෙක්කලනාදන් මහතා, පා.ම.
- ගරු චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය, පා.ම.
- ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා, පා.ම.

විශේෂ කාරක සභා

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 100 සිට 110 දක්වා වූ ප්‍රතිපාදන අනුව යම් සුවිශේෂී විෂය කරුණකට අදාළව පරීක්ෂා කිරීම සිදුකර නිර්දේශ ලබාදීම සඳහා පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයකින් විශේෂ කාරක සභා පත්කරනු ලැබේ. එම කාරක සභාවලදී පහත දැක්වෙන ගරු මන්ත්‍රීවරුන් සිය දායකත්වය සක්‍රීයව ලබා දීම සිදු කරයි.

කොළඹ වරායේ සිට බහාලුම් 323ක් අනිවාර්ය භෞතික පරීක්ෂණවලට භාජනය කිරීමකින් තොරව නිදහස් කිරීම සම්බන්ධයෙන් සොයා බලා වාර්තා කිරීමටත් ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන විශේෂ කාරක සභාව

විපක්ෂය නියෝජනය කරන සාමාජිකයන්:

- ගරු අජිත් පී. පෙරේරා මහතා, පා.ම.
- ගරු මුජිබර් රහුමාන් මහතා, පා.ම.
- ගරු දයාසිරි ජයසේකර මහතා, පා.ම.
- ගරු ඩී. වී. චානක මහතා, පා.ම.

පළාත් සභා ඡන්ද විමසීම කුමන මැතිවරණ ක්‍රමය යටතේ පැවැත්විය යුතු ද යන්න සොයා බලා වාර්තා කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන විශේෂ කාරක සභාව

විපක්ෂය නියෝජනය කරන සාමාජිකයන්:

- ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා, පා.ම.
- ගරු මනෝ ගණේෂන් මහතා, පා.ම.
- ගරු ශානක්‍යන් රාජපුත්තිරන් රාසමානික්කම් මහතා, පා.ම.
- එම්. නිසාම් කාරියප්පර් මහතා, පා.ම.

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා

එක් එක් අමාත්‍යාංශ සංඛ්‍යාවට සමාන වන අයුරින් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 112 අනුව අමාත්‍යාංශීය උපදේශක කාරක සභා 25 ක් පිහිටුවා ඇති අතර ඒවා තුළ පහත ගරු මන්ත්‍රීවරුන් සිය දායකත්වය සහ නායකත්වය සපයයි.

ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

විපක්ෂය නියෝජනය කරන සාමාජිකයන්:

- ගරු රවුෆ් හකීම් මහතා, පා.ම.
- ගරු දයාසිරි ජයසේකර මහතා, පා.ම.
- ගරු අනුරාධ ජයරත්න මහතා, පා.ම.
- ගරු ඩී. වී. චානක මහතා, පා.ම.
- ගරු ඡානක්‍යන් රාජපුත්තිරන් රාසමානික්කම් මහතා, පා.ම.

මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

විපක්ෂය නියෝජනය කරන සාමාජිකයන්:

- ගරු කබීර් හෂීම් මහතා, පා.ම.
- ගරු දයාසිරි ජයසේකර මහතා, පා.ම.
- ගරු රවී කරුණානායක මහතා, පා.ම.
- ගරු දිලිත් ජයවීර මහතා, පා.ම.
- ගරු අර්ජුන සුජීව සේනසිංහ මහතා, පා.ම.
- ගරු කතිරවේලු ෂන්මුගම් කුගතාසන් මහතා, පා.ම.

ඩිජිටල් ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

විපක්ෂය නියෝජනය කරන සාමාජිකයන්:

- ගරු අජිත් පී. පෙරේරා මහතා, පා.ම.
- ගරු චතුර ගලප්පත්ති මහතා, පා.ම.
- ගරු චිත්‍රාල් ප්‍රනාන්දු මහතා, පා.ම.
- ගරු සුරංග රත්නායක මහතා, පා.ම.
- ගරු අනුරාධ ජයරත්න මහතා, පා.ම.



අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

විපක්ෂය නියෝජනය කරන සාමාජිකයන්:

- ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය, පා.ම.
- ගරු ආචාර්ය වී. එස්. රාධාක්‍රිෂ්ණන් මහතා, පා.ම.
- ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා, පා.ම.
- ගරු ඩී. වී. චානක මහතා, පා.ම.
- ගරු ඉම්රාන් මහරූෆ් මහතා, පා.ම.
- ගරු ඥානමුත්තු ශ්‍රීනේෂන් මහතා, පා.ම.
- ගරු ආචාර්ය එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා, පා.ම.
- ගරු අබ්දුල් වාහිද් මහතා, පා.ම.

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

විපක්ෂය නියෝජනය කරන සාමාජිකයන්:

- ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා, පා.ම.
- ගරු රෝහණ බණ්ඩාර මහතා, පා.ම.
- ගරු කිංස් නෙල්සන් මහතා, පා.ම.
- ගරු කේ. කෝඩීස්වරන් මහතා, පා.ම.
- ගරු ඒ. අඩෙක්කලනාතන් මහතා, පා.ම.
- ගරු ඩී. වී. චානක මහතා, පා.ම.
- ගරු එම්. එස්. උතුමාලෙබ්බේ මහතා, පා.ම.
- ගරු දිලිත් ජයවීර මහතා, පා.ම.
- ගරු කාදර් මස්තාන් මහතා, පා.ම.

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

විපක්ෂය නියෝජනය කරන සාමාජිකයන්:

- ගරු හෙක්ටර් අප්පුහාමි මහතා, පා.ම.
- ගරු හර්ෂණ රාජකරුණා මහතා, පා.ම.
- ගරු (වෛද්‍ය) කාවින්ද හේෂාන් ජයවර්ධන මහතා, පා.ම.
- ගරු රවුෆ් හකීම් මහතා, පා.ම.
- ගරු රෝහිත අබේගුණවර්ධන මහතා, පා.ම.
- ගරු ජේ. සී. අලවතුවල මහතා, පා.ම.
- ගරු චමින්ද විජේසිරි මහතා, පා.ම.
- ගරු එම්. නිසාම් කාරියප්පර් මහතා, පා.ම.
- ගරු එම්. ඒ. එම්. තාහිර් මහතා, පා.ම.

ධීවර, ජලජ සහ සාගර සම්පත් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

විපක්ෂය නියෝජනය කරන සාමාජිකයන්:

- ගරු හෙක්ටර් අප්පුහාමි මහතා, පා.ම.
- ගරු දිලිප් වෙදආරච්චි මහතා, පා.ම.
- ගරු ඉම්රාන් මහරූෆ් මහතා, පා.ම.
- ගරු ඥාණමුත්තු ශ්‍රීනේෂන් මහතා, පා.ම.
- ගරු තුරෙරොසා රවිකරන් මහතා, පා.ම.
- ගරු එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා, පා.ම.
- ගරු ඒ. අඩෙක්කලනාතන් මහතා, පා.ම.
- ගරු කාදර් මස්තාන් මහතා, පා.ම.
- ගරු එම්. ඒ. එම්. තාහිර් මහතා, පා.ම.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

විපක්ෂය නියෝජනය කරන සාමාජිකයන්:

- ගරු චමින්ද විජේසිරි මහතා, පා.ම.
- ගරු වරුණ ලියනගේ මහතා, පා.ම.
- ගරු චාමර සම්පත් දසනායක මහතා, පා.ම.
- ගරු දිලිත් ජයවීර මහතා, පා.ම.
- ගරු රිෂාඩ් බදියුදීන් මහතා, පා.ම.

ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

විපක්ෂය නියෝජනය කරන සාමාජිකයන්:

- ගරු මුජිබර් රහුමාන් මහතා, පා.ම.
- ගරු එස්. එම්. මරික්කාර් මහතා, පා.ම.
- ගරු සුජිත් සංජය පෙරේරා මහතා, පා.ම.
- ගරු මනෝ ගනේෂන් මහතා, පා.ම.
- ගරු චමින්ද්‍රානි කිරිඇල්ල මහත්මිය, පා.ම.
- ගරු ජගත් විතාන මහතා, පා.ම.
- ගරු එම්. නිසාම් කාරියප්පර් මහතා, පා.ම.
- ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා, පා.ම.
- ගරු කේ. කෝඩීස්වරන් මහතා, පා.ම.

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

විපක්ෂය නියෝජනය කරන සාමාජිකයන්:

- ගරු නයන වාසලතිලක මහතා, පා.ම.
- ගරු පලනි දිගම්බරම් මහතා, පා.ම.
- ගරු වී. එස්. රාධාකෘෂ්ණන් මහතා, පා.ම.
- ගරු සුජිත් සංජය පෙරේරා මහතා, පා.ම.
- ගරු ජගත් විතාන මහතා, පා.ම.
- ගරු බී. ආරියවංශ මහතා, පා.ම.

සෞඛ්‍ය හා ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

විපක්ෂය නියෝජනය කරන සාමාජිකයන්:

- ගරු (වෛද්‍ය) කාවින්ද හේෂාන් ජයවර්ධන මහතා, පා.ම.
- ගරු එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා, පා.ම.
- ගරු වී. එස්. රාධාකෘෂ්ණන් මහතා, පා.ම.
- ගරු සුජිත් සංජය පෙරේරා මහතා, පා.ම.
- ගරු ජගත් විතාන මහතා, පා.ම.
- ගරු බී. ආරියවංශ මහතා, පා.ම.

වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

විපක්ෂය නියෝජනය කරන සාමාජිකයන්:

- ගරු රෝහණ බණ්ඩාර මහතා, පා.ම.
- ගරු කබීර් හෂීම් මහතා, පා.ම.
- ගරු හේෂා විතානගේ මහතා, පා.ම.
- ගරු ශානක්‍යයන් රාජපුත්තිරින් රාසමානික්කම් මහතා, පා.ම.
- ගරු ඉලෙයියතම්බි ශ්‍රීනාත් මහතා, පා.ම.

කම්කරු කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

විපක්ෂය නියෝජනය කරන සාමාජිකයන්:

- ගරු පලනි දිගම්බරම් මහතා, පා.ම.
- ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා, පා.ම.

නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

විපක්ෂය නියෝජනය කරන සාමාජිකයන්:

- ගරු මුජිබර් රහුමාන් මහතා, පා.ම.
- ගරු එස්. එම්. මරික්කාර් මහතා, පා.ම.
- ගරු පී. පී. පොන්නම්බලම් මහතා, පා.ම.
- ගරු එම්. ඒ. එල්. එම්. හිස්බුල්ලාහ් මහතා, පා.ම.
- ගරු ඒ. අඩෙක්කලනාදන් මහතා, පා.ම.
- ගරු කාදර් මස්තාන් මහතා, පා.ම.
- ගරු කේ. එස්. කුගදාසන් මහතා, පා.ම.

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

විපක්ෂය නියෝජනය කරන සාමාජිකයන්:

- ගරු ජේ. සී. අලවතුවල මහතා, පා.ම.
- ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා, පා.ම.
- ගරු එම්. ඒ. එම්. තාහිර් මහතා, පා.ම.
- ගරු එම්. එස්. නලීම් මහතා, පා.ම.
- ගරු නිසාම් කාරියප්පර් මහතා, පා.ම.
- ගරු කේ. කෝඩීස්වරන් මහතා, පා.ම.

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීමේ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

විපක්ෂය නියෝජනය කරන සාමාජිකයන්:

- ගරු බී. ආරියවංශ මහතා, පා.ම.
- ගරු ඩබ්. එච්. එම්. ධර්මසේන මහතා, පා.ම.
- ගරු කේ. එස්. කුගදාසන් මහතා, පා.ම.
- ගරු මනෝ ගනේෂන් මහතා, පා.ම.
- ගරු ඉස්මයිල් මුත්තු මොහොමඩ් මහතා, පා.ම.
- ගරු පී. සත්‍යලිංගම් මහතා, පා.ම.

විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

විපක්ෂය නියෝජනය කරන සාමාජිකයන්:

- ගරු චතුර ගලප්පත්ති මහතා, පා.ම.
- ගරු අමිල ප්‍රසාද් මහතා, පා.ම.
- ගරු (වෛද්‍ය) රාමනාතන් අර්චිචුනා මහතා, පා.ම.
- ගරු ඥාණමුත්තු ශ්‍රීනේෂන් මහතා, පා.ම.

මහජන ආරක්ෂණ සහ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

විපක්ෂය නියෝජනය කරන සාමාජිකයන්:

- ගරු මුජිබර් රහුමාන් මහතා, පා.ම.
- ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා, පා.ම.
- ගරු චාමර සම්පත් දසනායක මහතා, පා.ම.
- ගරු එම්. එස්. උතුමාලෙබ්බේ මහතා, පා.ම.

බලශක්ති කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

විපක්ෂය නියෝජනය කරන සාමාජිකයන්:

- ගරු අජිත් පී. පෙරේරා මහතා, පා.ම.
- ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා, පා.ම.
- ගරු එම්. එස්. උතුමාලෙබ්බේ මහතා, පා.ම.
- ගරු අර්ජුන සුජීව සේනසිංහ මහතා, පා.ම.

තරුණ කටයුතු හා ක්‍රීඩා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

විපක්ෂය නියෝජනය කරන සාමාජිකයන්:

- ගරු එස්. එම්. මරික්කාර් මහතා, පා.ම.
- ගරු හර්ෂණ රාජකරුණා මහතා, පා.ම.
- ගරු වරුණ ලියනගේ මහතා, පා.ම.
- ගරු අමිල ප්‍රසාද් මහතා, පා.ම.
- ගරු හේෂා විතානගේ මහතා, පා.ම.



කාන්තා හා ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

විපක්ෂය නියෝජනය කරන සාමාජිකයන්:

- ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය, පා.ම.
- ගරු පී. සත්‍යලිංගම් මහතා, පා.ම.
- ගරු තුරෙයිරාසා රවිකරන් මහතා, පා.ම.

පරිසර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

විපක්ෂය නියෝජනය කරන සාමාජිකයන්:

- ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය, පා.ම.
- ගරු දිලිප් වෙදආරච්චි මහතා, පා.ම.
- ගරු කිංස් නෙල්සන් මහතා, පා.ම.
- ගරු ඩබ්. එච්. එම්. ධර්මසේන මහතා, පා.ම.
- ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි ශ්‍රීනාත් මහතා, පා.ම.

බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

විපක්ෂය නියෝජනය කරන සාමාජිකයන්:

- ගරු ගයන්ත කරුණාතිලක මහතා, පා.ම.
- ගරු නයන වාසලතිලක මහතා, පා.ම.
- ගරු තුරෙරාසා රවිහරන් මහතා, පා.ම.
- ගරු ඉස්මයිල් මුත්තු මොහොමඩ් මහතා, පා.ම.

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා කටයුතු පිළිබඳ අමාතයාංශයීය උපදේශක කාරක සභාව

විපක්ෂය නියෝජනය කරන සාමාජිකයන්:

- ගරු රවුෆ් හකීම් මහතා, පා.ම.
- ගරු චමින්ද්‍රානි කිරිඇල්ල මහත්මිය, පා.ම.
- ගරු චිත්‍රාල් ප්‍රනාන්දු මහතා, පා.ම.
- ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා, පා.ම.

වරාය සහ සිවිල් ගුවන් සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව

විපක්ෂය නියෝජනය කරන සාමාජිකයන්:

- ගරු චමින්ද විජේසිරි මහතා, පා.ම.
- ගරු ඉම්රාන් මහරූෆ් මහතා, පා.ම.
- ගරු රිෂාඩ් බදියුදීන් මහතා, පා.ම.
- ගරු චාමර සම්පත් දසනායක මහතා, පා.ම.
- ගරු ඥානක්‍යයන් රාසපුත්තිරන් රාසමානික්කම් මහතා, පා.ම.
- ගරු එම්. ඒ. එම්. තාහිර් මහතා, පා.ම.
- ගරු එම්. එස්. අබ්දුල් වාහිද් මහතා, පා.ම.
- ගරු එම්. එස්. උතුමාලෙබ්බේ මහතා, පා.ම.

විපක්ෂය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්

සමගි ජන බලවේගය - SJB

- ගරු සජිත් ප්‍රේමදාස මහතා, පා.ම. (කොළඹ දිස්ත්‍රික්කය)
- ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා, පා.ම. (කොළඹ දිස්ත්‍රික්කය)
- ගරු එස්. එම්. මරික්කාර් මහතා, පා.ම. (කොළඹ දිස්ත්‍රික්කය)
- ගරු මුජිබුර් රහුමාන් මහතා, පා.ම. (කොළඹ දිස්ත්‍රික්කය)
- ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා, පා.ම. (ගම්පහ දිස්ත්‍රික්කය)
- ගරු හර්ෂණ රාජකරුණා මහතා, පා.ම. (ගම්පහ දිස්ත්‍රික්කය)
- ගරු අමිල ප්‍රසාද් මහතා, පා.ම. (ගම්පහ දිස්ත්‍රික්කය)
- ගරු අජිත් පී. පෙරේරා මහතා, පා.ම. (කළුතර දිස්ත්‍රික්කය)
- ගරු ජගත් විතාන මහතා, පා.ම. (කළුතර දිස්ත්‍රික්කය)
- ගරු රවුෆ් හකීම් මහතා, පා.ම. (මහනුවර දිස්ත්‍රික්කය)
- ගරු චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය, පා.ම. (මහනුවර දිස්ත්‍රික්කය)
- ගරු රෝහිණි කුමාරි විජේරත්න මහත්මිය, පා.ම. (මාතලේ දිස්ත්‍රික්කය)
- ගරු පලනි දිගම්බරම් මහතා, පා.ම. (නුවරඑළිය දිස්ත්‍රික්කය)
- ගරු (ආචාර්ය) වී. එස්. රාධාකෘෂ්ණන් මහතා, පා.ම. (නුවරඑළිය දිස්ත්‍රික්කය)
- ගරු ගයන්ත කරුණාතිලක මහතා, පා.ම. (ගාල්ල දිස්ත්‍රික්කය)
- ගරු චතුර ගලප්පත්ති මහතා, පා.ම. (මාතර දිස්ත්‍රික්කය)
- ගරු දිලිප් වෙදආරච්චි මහතා, පා.ම. (හම්බන්තොට දිස්ත්‍රික්කය)
- ගරු රිසාඩ් බදියුදීන් මහතා, පා.ම. (වන්නි දිස්ත්‍රික්කය)
- ගරු ඉම්රාන් මහරූෆ් මහතා, පා.ම. (ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය)
- ගරු දයාසිරි ජයසේකර මහතා, පා.ම. (කුරුණෑගල දිස්ත්‍රික්කය)
- ගරු ජේ. සී. අලවතුවල මහතා, පා.ම. (කුරුණෑගල දිස්ත්‍රික්කය)
- ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා, පා.ම. (කුරුණෑගල දිස්ත්‍රික්කය)
- ගරු හෙක්ටර් අප්පුහාමි මහතා, පා.ම. (පුත්තලම දිස්ත්‍රික්කය)
- ගරු චිත්‍රාල් ප්‍රනාන්දු මහතා, පා.ම. (පුත්තලම දිස්ත්‍රික්කය)
- ගරු රෝහණ බණ්ඩාර මහතා, පා.ම. (අනුරාධපුර දිස්ත්‍රික්කය)
- ගරු සුරංග රත්නායක මහතා, පා.ම. (අනුරාධපුර දිස්ත්‍රික්කය)
- ගරු කින්ස් නෙල්සන් මහතා, පා.ම. (පොළොන්නරුව දිස්ත්‍රික්කය)
- ගරු චමින්ද විජේසිරි මහතා, පා.ම. (බදුල්ල දිස්ත්‍රික්කය)
- ගරු නයන වාසලතිලක මහතා, පා.ම. (බදුල්ල දිස්ත්‍රික්කය)
- ගරු ඩබ්. එච්. එම්. ධර්මසේන මහතා, පා.ම. (මොණරාගල දිස්ත්‍රික්කය)
- ගරු හේෂා විතානගේ මහතා, පා.ම. (රත්නපුර දිස්ත්‍රික්කය)
- ගරු වරුණ ලියනගේ මහතා, පා.ම. (රත්නපුර දිස්ත්‍රික්කය)
- ගරු බී. ආරියවංශ මහතා, පා.ම. (රත්නපුර දිස්ත්‍රික්කය)
- ගරු කබීර් හෂීම් මහතා, පා.ම. (කෑගල්ල දිස්ත්‍රික්කය)
- ගරු සුජිත් සංජය පෙරේරා මහතා, පා.ම. (කෑගල්ල දිස්ත්‍රික්කය)
- ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා, පා.ම. (ජාතික ලැයිස්තුව)
- ගරු මනෝ ගනේෂන් මහතා, පා.ම. (ජාතික ලැයිස්තුව)
- ගරු අර්ජුන සුජීව සේනසිංහ මහතා, පා.ම. (ජාතික ලැයිස්තුව)
- ගරු එම්. නිසාම් කාරියප්පර් මහතා, පා.ම. (ජාතික ලැයිස්තුව)
- ගරු තාහිර් මරික්කාර් මහතා, පා.ම. (ජාතික ලැයිස්තුව)



ඉලංකෙයි තමිල් අරසු කච්චි - ITAK



- ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා, පා.ම. (යාපනය දිස්ත්‍රික්කය)
- ගරු තුරෙයිරාසා රවිකරන් මහතා, පා.ම. (වන්නි දිස්ත්‍රික්කය)
- ගරු ඥානමුත්තු ශ්‍රීනේෂන් මහතා, පා.ම. (මඩකලපුව දිස්ත්‍රික්කය)
- ගරු ඥානක්‍යන් රාජපුත්තිරන් රාසමානික්කම් මහතා, පා.ම. (මඩකලපුව දිස්ත්‍රික්කය)
- ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා, පා.ම. (මඩකලපුව දිස්ත්‍රික්කය)
- ගරු කවින්දිරන් කෝඩීස්වරන් මහතා, පා.ම. (දිගාමඩුල්ල දිස්ත්‍රික්කය)
- ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා, පා.ම. (ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය)
- ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා, පා.ම. (ජාතික ලැයිස්තුව)

නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ - NDF



- ගරු රෝහිත අබේගුණවර්ධන මහතා, පා.ම. (කළුතර දිස්ත්‍රික්කය)
- ගරු අනුරාධ ජයරත්න මහතා, පා.ම. (මහනුවර දිස්ත්‍රික්කය)
- ගරු චාමර සම්පත් දසනායක මහතා, පා.ම. (බදුල්ල දිස්ත්‍රික්කය)
- ගරු රවී කරුණානායක මහතා, පා.ම. (ජාතික ලැයිස්තුව)
- ගරු ෆයිසර් මුස්තාපා මහතා, පා.ම. (ජාතික ලැයිස්තුව)

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ - SLPP



- ගරු චානක මාදුගොඩ මහතා, පා.ම. (ගාල්ල දිස්ත්‍රික්කය)
- ගරු ඩී. වී. චානක මහතා, පා.ම. (හම්බන්තොට දිස්ත්‍රික්කය)
- ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා, පා.ම. (ජාතික ලැයිස්තුව)

ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය - SLMC




- ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා, පා.ම. (මඩකලපුව දිස්ත්‍රික්කය)
- ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා, පා.ම. (දිගාමඩුල්ල දිස්ත්‍රික්කය)
- ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා, පා.ම. (ජාතික ලැයිස්තුව)

සර්වජන බලය - Sarvajana Balaya



- ගරු දිලිත් ජයවීර මහතා, පා.ම. (ජාතික ලැයිස්තුව)

එක්සත් ජාතික පක්ෂය - UNP



- ගරු ජීවන් තොණ්ඩමන්, පා.ම (නුවරඑළිය දිස්ත්‍රික්කය)

ප්‍රජාතන්ත්‍රවාදී දෙමළ ජාතික සන්ධානය - DTNA



- ගරු අම්‍රිතනාදන් අඩෙක්කලනාදන් මහතා, පා.ම. (වන්නි දිස්ත්‍රික්කය)

අහිල ඉලංකෙයි තමිල් කොංග්‍රස් - ACTC

- ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා, පා.ම. (යාපනය දිස්ත්‍රික්කය)

අහිල ඉලංගෙයි මහජන කොංග්‍රසය - ACMC

- ගරු එම්. ඒ. එම්. තාහිර් මහතා, පා.ම. (දිගාමඩුල්ල දිස්ත්‍රික්කය)

ස්වාධීන කණ්ඩායම 17 - Independent Group 17

- ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චිචුනා මහතා, පා.ම. (යාපනය දිස්ත්‍රික්කය)

ශ්‍රී ලංකා කම්කරු පක්ෂය - SLLP

- ගරු කේ. කාදර් මස්තාන් මහතා, පා.ම. (වන්නි දිස්ත්‍රික්කය)

පරිපාලන සහ කාර්ය මණ්ඩලය

ප්‍රධාන පරිපාලන නිලධාරීන්



විපක්ෂ නායක ලේකම්
සුරංග රණසිංහ මහතා



සහකාර ලේකම් (පරිපාලන)
ආර්. ආර්. එම්. සී. එන්. රන්දෙණිය මහත්මිය



සහකාර ලේකම් (පාර්ලිමේන්තු කටයුතු)
කේ. එස්. එන්. විජේරත්න මහතා



ගණකාධිකාරී
දිල්හානි ජයසිංහ මහත්මිය



පරිපාලන නිලධාරී
ගිහාන් දිසානායක මහතා



විපක්ෂ නායක ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්
එන්. ඩී. වික්‍රමාරච්චි මහත්මිය

කාර්ය මණ්ඩලය - අංශ අනුව

ආයතන / පරිපාලන අංශය

- ආනන්ද ජයසිංහ මයා
- ඉරේෂා ගුණවර්ධන මිය
- දීපා චාන්දනී මිය
- ඩබ්ලිව්. පී. කේ. අනුරාධා මිය
- රසාංජලී රත්නායක මිය
- ධම්මික අමරසිංහ මයා
- මාලක වැන්කියුලන්බර්ග් මයා
- ප්‍රියංකර පුෂ්පකුමාර මයා
- චතුරිකා බුලත්සිංහල මිය
- ප්‍රසන්න පෙරේරා මයා
- චන්දන සේනානායක මයා
- සමන් පුෂ්පකුමාර මයා
- එස්. ආර්. ජී. ඩබ්ලිව්. එස්. පී. ගලහිටියාව මයා
- නිපුන් සිල්වා මයා
- චමින්ද ප්‍රසන්න මයා
- සමන් දිසානායක මයා
- පී. ආර්. ඒ. හර්ෂක මයා
- රුවන් කරම්පොල මයා
- රංජිත් වසන්ත මයා
- ඩී. සී. පී. ගලගොඩ මයා
- බී. ටී. එස්. පෙරේරා මයා

පාර්ලිමේන්තු කටයුතු අංශය

- ආනන්ද ජයසිංහ මයා
- ඉරේෂා ගුණවර්ධන මිය
- දීපා චාන්දනී මිය
- ධම්මික අමරසිංහ මයා
- ප්‍රියංකර පුෂ්පකුමාර මයා
- රසාංජලී රත්නායක මිය
- චතුරිකා බුලත්සිංහල මිය
- ප්‍රසන්න පෙරේරා මයා
- චන්දන සේනානායක මයා

පර්යේෂණ අංශය

- අචලා රත්නායක මිය
- ඉෂාර කරුණාරත්න මයා
- නිරෝධ කාරියවසම් මයා
- රකිත ගුණරත්න මයා
- නලීර් අහමට් මයා
- ඩී. අයි. අයේෂා විජේන්ද්‍ර මිය

ගිණුම් අංශය

- දීපාල් ක්‍රිෂාන්ත මයා
- ජී. ඒ. පී. සංජීවනී මිය

භාෂා පරිවර්තක අංශය

- උපුල් බණ්ඩාර මයා
- එම්. එස්. එම්. රියාස් මයා

නො: 30 කාර්යාලය

- ප්‍රසාද් වික්‍රමසිංහ මයා
- චම්පිකා නන්දනී මිය
- එස්. රජීවන් මයා
- සුපුන් සමරක්කොඩි මයා
- හසිත ගුණරත්න මයා
- කේතක විජේසිංහ මයා

ලේකම් කාර්යාලය


- ගිහාන් සේනානායක මයා
- ලංකා ද සිල්වා මයා
- කුෂාන් රන්දික මයා

අභ්‍යන්තර විගණන අංශය

- ඩබ්ලිව්. පී. කේ. අනුරාධා මිය

අභ්‍යන්තර කටයුතු ඒකකය

කේ. එස්. එන්. විජේරත්න මහතා
ඩබ්ලිව්. පී. කේ. අනුරාධා මිය



උපාය මාර්ගික විශ්ලේෂණය

2024 වර්ෂයේ නොවැම්බර් මාසයේ 10 වන පාර්ලිමේන්තුවට අදාළව විපක්ෂ නායක කාර්යාලය පිහිටුවන ලදි. ඒ හා සමගාමීව විපක්ෂ නායක කාර්යාලයේ උපාය මාර්ගික සැලැස්ම සකස් කිරීම ආරම්භ කරන ලදි. මෙහි පළමු අදියර ලෙස විපක්ෂ නායක කාර්යාලයේ මෙහෙවර හා අරමුණු සංශෝධනය කිරීම සිදුකරන ලදි. **2025 වර්ෂය තුළ 2026-2029 සඳහා උපාය මාර්ගික සැලැස්ම** සකස් කර අවසන් කළ අතර එම හඳුනාගත් උපාය මාර්ගික ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනයේ නිලධාරීන් සතු ධාරිතාව සහ කුසලතා හඳුනාගැනීමේ සහ වැඩිදියුණු කිරීමේ අරමුණින් "අයවැය එනතුරු දින සියය" නමින් විශේෂ ව්‍යාපෘති වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන ප්‍රධාන වශයෙන් තනිපුද්ගල ව්‍යාපෘති සහ කණ්ඩායම් ව්‍යාපෘති ලෙස කොටස් දෙකකින් සමන්විත විය.

උපාය මාර්ගික සැලැස්ම

දහවන පාර්ලිමේන්තුව සඳහා කාර්යාලය ස්ථාපිත කිරීම
2024 දෙසැම්බර් / 2025 ජනවාරි

↓

දැක්ම, මෙහෙවර සහ අරමුණු නිර්වචනය කිරීම

↓

ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ සාකච්ඡා සහ දේශපාලන නායකත්වය සමඟ උපදේශනය

↓

කාර්යාලයේ උපායමාර්ගික ප්‍රවේශය සැකසීම

↓

කාර්යාලයේ සියලුම මට්ටම්වල කාර්ය මණ්ඩලයේ සහභාගිත්වය සහ ප්‍රතිපෝෂණය

↓

උපායමාර්ගික සැලැස්ම අවසන් කිරීම
2025 ජුනි සිට සැප්තැම්බර් දක්වා

↓

සැලැස්ම දේශපාලන නායකත්වයට සහ සියලුම මට්ටම්වල කාර්ය මණ්ඩලයට ඉදිරිපත් කිරීම
2025 දෙසැම්බර්



තනිපුද්ගල ව්‍යාපෘති

කාර්යාලයේ නිලධාරීන්ගේ කුසලතා සහ වෘත්තීය මැදිහත්වීම මත පදනම්ව මෙම තනිපුද්ගල ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී. ලබා දුන් දින 100ක කාලසීමාව තුළ කාර්යාලයේ දෛනික රාජකාරී වඩාත් පහසු සහ තාක්ෂණික වශයෙන් දියුණු කිරීම මෙම ව්‍යාපෘතිවල මූලික අරමුණ විය.

සාර්ථකව නිම කළ තනි පුද්ගල ව්‍යාපෘති පහත පරිදි වේ:

කාර්යාලයීය මෘදුකාංග ප්‍රතිකරණ ව්‍යාපෘතිය

එන්. ජී. එල්. යූ. එස්. බණ්ඩාර මහතාගේ සම්පාදකත්වයෙන් ක්‍රියාත්මක කරන ලද මෙම ව්‍යාපෘතිය මඟින් කාර්යාලයීය පරිගණක 40ක් තුළ පැවති යාවත්කාලීන නොවන පැරණි මෘදුකාංග ඉවත් කොට ඒ වෙනුවට නිරන්තර යාවත්කාලීනයන් ලැබෙන නවතම කාර්යාල පැකේජ සංස්කරණ ස්ථාපනය කිරීම සිදු කරන ලදී. ආයතනික දෛනික රාජකාරී වඩාත් කාර්යක්ෂමව, බාධාවකින් තොරව හා පහසුවෙන් ඉටු කරගැනීමට අවශ්‍ය ඩිජිටල් පසුබිම නිර්මාණය කිරීමේ අරමුණින් අදාළ පරිගණක සඳහා මෙම නව මෘදුකාංග සාර්ථකව යාවත්කාලීන කිරීම සිදුවිය.

කාර්යාලයීය කාර්ය මණ්ඩලයේ අක්ෂි රෝග හෝ පෙනීමේ දුර්වලතාවයක් ඇත්නම් ඒ සඳහා වූ පිළියම් ලබා දීම සඳහා වූ ව්‍යාපෘතිය

එම්. එස්. එම්. රියාස් මහතාගේ සම්පාදකත්වයෙන් ක්‍රියාත්මක කරන ලද මෙම ව්‍යාපෘතිය මඟින් ඇස් කණ්ණාඩි භාවිතය පිළිබඳව කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම සිදු කරන ලදී. කාර්ය මණ්ඩලයෙන් බහුතරයක් සිය දෛනික රාජකාරී කටයුතු ඉටු කිරීමේදී උපැස් යුවළක් භාවිත කරන බැවින්, එය වඩාත් ඵලදායී අයුරින් යොදාගන්නා ආකාරය පිළිබඳව ඔවුන්ට ප්‍රායෝගික මඟපෙන්වීමක් ලබා දීම සහ එමඟින් ඔවුන්ගේ දෘෂ්ටි සෞඛ්‍යය ආරක්ෂා කර ගැනීමට සහාය වීම මෙහි මූලික අරමුණ විය. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ඇස් කණ්ණාඩි සඳහා සුදුසු කාච සහ රාමු නිවැරදිව තෝරාගැනීම පිළිබඳව කාර්ය මණ්ඩලයට පුළුල් අවබෝධයක් ලබා දීමට හැකි වූ අතර, ඇස් කණ්ණාඩි නිසි පරිදි භාවිත කිරීම සහ නඩත්තු කිරීම සම්බන්ධයෙන් සේවකයන් දැනුවත් කර ඔවුන්ගේ අක්ෂි සෞඛ්‍යය ආරක්ෂා කර ගැනීමට ද සාර්ථකව මඟපෙන්වන ලදී.

පර්යේෂණ අංශය ප්‍රතිව්‍යුහගත කිරීමේ ව්‍යාපෘතිය

ඩී. එම්. ඒ. එස්. රත්නායක මහත්මියගේ සම්පාදකත්වයෙන් ක්‍රියාත්මක කරන ලද මෙම ව්‍යාපෘතිය මඟින් පර්යේෂණ අංශය ප්‍රතිව්‍යුහගත කිරීම සිදු කරන ලදී. විපක්ෂ නායක කාර්යාලයේ පර්යේෂණ අංශය ක්‍රියාත්මක වීමේදී මතු වූ ගැටලුකාරී තත්ත්වයන් මඟහරවා ගනිමින්, එය වඩාත් ඵලදායී අයුරින් පවත්වාගෙන යාම සඳහා ඩිජිටල්කරණය සහ දත්ත කළමනාකරණය පදනම් කරගත් ක්‍රමෝපායික වැඩපිළිවෙළක් හරහා අංශයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම මෙහි මූලික අරමුණ විය. ඒ අනුව, පර්යේෂණ අංශය ක්‍රියාත්මක වන ආකාරය සමීපව නිරීක්ෂණය කර, අංශයේ සාමාජිකයන් සහ මාණ්ඩලික නිලධාරීන් සමඟ සාකච්ඡා මාර්ගයෙන් ගැටලු පවතින ක්ෂේත්‍ර හඳුනාගෙන, ඒවාට අදාළ විසඳුම් යෝජනා ලේඛනගත කොට ප්‍රමුඛතා පිළිවෙළකට සකස් කෙරිණි. මෙම ක්‍රියාවලිය හරහා අක්‍රමවත් වැඩ පියවරයන් නිවැරදිව හඳුනාගෙන ඒවා ක්‍රමවත්ව හා විධිමත්ව සැකසීමට හැකි වූ අතර, අංශයේ ඉදිරි කටයුතු සඳහා නව තාක්ෂණික භාවිතයන් යොදාගත හැකි ස්ථාන නිවැරදිව හඳුනාගැනීම ද සාර්ථකව සිදු විය.

විපක්ෂ නායක කාර්යාලීය වෙබ් අඩවිය යාවත්කාලීන කිරීමේ ව්‍යාපෘතිය

විපක්ෂ නායක කාර්යාලයේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීමේ ව්‍යාපෘතිය අංශ කීපයකින් සිදු කරන ලදී. එහි එක් අංගයක් ලෙස රසාංජලිකා රත්නායක මහත්මිය විසින් වෙබ් අඩවිය සඳහා මේ දක්වා කාර්යාලයේ කටයුතු කළ විපක්ෂ නායකයින්ගේ ඡායාරූප හා ජීවදත්ත තොරතුරු ලබා දීමටත්, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකවරුන්ගේ ඡායාරූප වෙබ් අඩවියට ඇතුළත් කිරීමටත් පියවර ගන්නා ලදී.එමඟින් මෙතෙක් වෙබ් අඩවියේ නොතිබූ හිටපු විපක්ෂ නායකවරුන්ගේ ඡායාරූප, හිටපු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකවරුන්ගේ ඡායාරූප වෙබ් අඩවියට එකතු කිරීමටත්, අදාළ තොරතුරු එක් කරමින් වෙබ් අඩවිය යාවත්කාලීන කිරීමට සිදු විය. එසේ ලබාගත් ඡායාරූප කාර්යාලය තුළ රාමුගත කොට තැබීමත් ව්‍යාපෘතියේ තවත් අරමුණක් විය.

ආයතනික දැනුම් කළමනාකරණය සහ කෘත්‍රිම බුද්ධිය ආයතනයේ (AI)කටයුතු සඳහා යොදා ගැනීම සඳහා වූ වැඩපිළිවෙලක් සකස් කිරීමේ ව්‍යාපෘතිය

රකිත ගුණරත්න මහතා සිය ව්‍යාපෘතිය තුළින් අවධානය යොමු කරනු ලැබුවේ ආයතනික පර්යේෂණ අංශය තුළ විධිමත් දැනුම් කළමනාකරණ ව්‍යාපෘතියක් ස්ථාපනය කිරීම සහ කෘත්‍රිම බුද්ධිය කාර්යාලයීය කටයුතු සඳහා යොදාගත හැකි ආකාරය පිළිබඳව ප්‍රායෝගික වැඩපිළිවෙළක් සකස් කිරීම සඳහා වූ යෝජනා සහ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමයි. ඒ සඳහා දැනුම් කළමනාකරණය පිළිබඳ න්‍යායාත්මක කරුණු අධ්‍යයනය කර එම කරුණු ප්‍රායෝගිකව යොදාගත හැකි ආකාරය පිළිබඳව වාර්තාවක් සම්පාදනය කරන ලදී. කෘත්‍රිම බුද්ධිය භාවිතා කිරීම සඳහා වූ හැකියාව ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට නියාමන වැඩපිළිවෙළක් ලෙස දෛනික ප්‍රධාන පුවත් 10 ක් කෘත්‍රිම බුද්ධි මෙලවම් භාවිතා කරමින් විශ්ලේෂණය කොට තොරතුරු ගවේෂණය කිරීම සඳහා අවශ්‍ය නිවැරදි විධාන අත්හදා බලා ඒවා ප්‍රමිතිගත කිරීම සිදු කෙරිණි. මෙහිදී විෂයානුබද්ධ කෘති, පුවත්පත් ලිපි, වෙබ් ලිපි යන ආදී මූලාශ්‍ර හරහා ලබාගත් න්‍යායාත්මක දැනුම පර්යේෂණ අංශයේ ප්‍රායෝගික රාජකාරි සඳහා සාර්ථකව විධිමත්ව යොදා ගැනීමට හැකියාව ලැබුණි






අතිකාල හා ගමන් වියදම් වවුචර් කළමනාකරණ ව්‍යාපෘතිය

එන්.ඒ.ඩී. ක්‍රිශාන්ත මහතා සහ පී.පී.ඒ. සංජීවනී මහත්මිය උක්ත ව්‍යාපෘතිය තුළ සිය අරමුණ ලෙස පෙන්වා දී තිබුණේ ගෙවීම් සිදු කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන විවිධ වවුචර් පරීක්ෂා කිරීමේදී දක්නට ලැබෙන අඩුපාඩු නිරීක්ෂණය කර ගැනීම සඳහා වූ ක්‍රමවේදයක් සකස් කිරීමයි. ඒ සඳහා අතිකාල හා ගමන් වියදම් වවුචර් ඉදිරිපත් කිරීමේදී වවුචරය සකස් කළ යුතු ආකාරය හා අවශ්‍ය දත්ත හා තොරතුරු වවුචරයට ඇතුළත් විය යුතු අන්දම පිළිබඳව කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම සඳහා සරල පැහැදිලි කිරීම් සහිත ලේඛනයක් සකස් කොට බෙදා දුන් අතර, ඒ ඒ වවුචර්පත් සඳහා ආදර්ශ වවුචර්පත් සකස් කොට කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම සිදු කරන ලදී.

පාර්ලිමේන්තුව විපක්ෂය විසින් මතු කළ හෝ ඉදිරිපත් කළ ප්‍රශ්න ඒ හා ආනුෂාංගික කරුණු ඩිජිටල්ගත කිරීම

පාර්ලිමේන්තුව තුළ විපක්ෂයේ වගකීම සහ වගවීම පෙන්නුම් කරන ප්‍රධානතම කාර්යය වනුයේ පාර්ලිමේන්තු විවාද, පාර්ලිමේන්තුව තුළ විපක්ෂය ඉදිරිපත් කරනු ලබන යෝජනා, පාර්ලිමේන්තුව තුළ විමසනු ලබන ප්‍රශ්න, පවත්වනු ලබන විවාද සඳහා දෙනු ලබන තොරතුරු සම්පාදනය ආශ්‍රිත කරුණු වේ. මේ සඳහා ඉරේෂා ගුණවර්ධන මහත්මිය සිය ව්‍යාපෘතිය තුළින් විපක්ෂය පාර්ලිමේන්තුව තුළ සිදු කරනු ලබන ක්‍රියාකාරකම් ඩිජිටල් ගොනුගත කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරමින් වර්තමාන තාක්ෂණය හා කාර්යාලයීය කටයුතු ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලදී. එම ව්‍යාපෘතිය තුළ ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න, සභාව කල් තැබීමේ යෝජනා, සභාව කල් තැබීමේ ප්‍රශ්න, අගමැතිවරයා වෙත යොමු කරනු ලබන ප්‍රශ්න සහ විපක්ෂය විසින් කාලීනව පාර්ලිමේන්තුව වෙත යොමු කළ කටයුතු ඩිජිටල් ගොනුගත කිරීමේ ව්‍යාපෘතිය තුළ අන්තර්ගත කිරීමට පියවර ගෙන ඇත.



පෞද්ගලික ලිපිගොනු යාවත්කාලීන කිරීමේ සතිය

විපක්ෂ නායක කාර්යාලයේ කාර්ය මණ්ඩල නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු තුළ පවත්නා අඩුපාඩු පරීක්ෂා කොට ඒවා යාවත්කාලීන කිරීම සඳහා වූ ව්‍යාපෘතියක් ඩබ්.පී.කේ. අනුරාධා මහත්මිය විසින් සිදු කරන ලදී. පෞද්ගලික ලිපිගොනු පරීක්ෂා කරමින් ඒවායේ පවතින අඩුපාඩු හඳුනා ගැනීම ව්‍යාපෘතියේ මුල්ම පියවර විය. ඉන්පසු අදාළ ලිපිගොනු හිමි නිලධාරීන් වෙත සිය ලිපිගොනු පරීක්ෂා කිරීමට අවස්ථාව ලබාදුන් අතර, එහිදී හඳුනාගත් අඩුපාඩු සහ අවශ්‍ය ලේඛන විෂය භාර නිලධාරියා වෙත ලබා දී ලිපිගොනු යාවත්කාලීන කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදුන් අතර, එම ක්‍රියාවලිය හරහා ලිපිගොනු යාවත්කාලීන කිරීමට හැකියාව ලැබුණි. මේ තුළින් සිදු වූ වැදගත්ම සාධනීය කටයුත්ත වූයේ පෞද්ගලික ලිපිගොනු සම්බන්ධයෙන් පැන නැගී ඇති විගණන විමසුම් අවම කිරීමට හැකියාව ලැබීමයි.

ප්‍රවාහන අංශයේ සේවා විධිමත් කිරීම සඳහා වූ අවශ්‍යතා, කාර්යාලයීය ලේඛන සහ අනෙකුත් අවශ්‍යතා විධිමත් ලෙස සකස් කිරීම

මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රවාහන අංශයේ සේවාවන් වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා වූ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබුවේ ඩී.අයි.ජී. කරුණාරත්න මහතායි. ආරම්භයක් වශයෙන් ව්‍යාපෘතියේ අවධානය යොමු කරනු ලැබුවේ ප්‍රවාහන අංශය භාවිතා කරනු ලබන විවිධ ආකෘති පත්‍ර පිළිබඳවයි. එකම ආකාරයේ කටයුතු සඳහා සරල තොරතුරු සියල්ල ඇතුළත් ආකෘති පත්‍රයක් නොතිබීම, එකිනෙකට වෙනස් විවිධ කටයුතු එකම ආකෘති පත්‍රයක් මගින් ඉදිරිපත් කිරීම සහ දීර්ඝ ලෙස සටහන් යෙදීම නිසා තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී අධික කාලයක් ගතවීම, අනිවාර්යයෙන් ලිපිගොනු සමග ඉදිරිපත් කිරීම නිසා ගතවන කාලය, ආකෘති පත්‍ර අංකනය නොකිරීම, මෘදු පිටපත් යොදා ගැනීමට ඇති අපහසුතාවය හා ආකෘති පත්‍ර එකම වර්ණයකින් තිබීම වැනි ගැටලු නිරාකරණය කිරීම සඳහා වූ ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ විය. ව්‍යාපෘතියේදී දැනට භාවිතා කරන ආකෘතිපත්‍ර අධ්‍යයනය කොට අදාළ ආකෘති පත්‍ර යාවත්කාලීන කරමින් එහි මෘදු පිටපත් පහසුවෙන් සොයා ගැනීමට QR කේතයක් සැකසීමට අවශ්‍ය පියවර ගනු ලැබිය.

සඟරා සහ පත්‍රිකා ප්‍රදර්ශන ඒකකය ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය

විපක්ෂ නායක ලේකම්ගේ කාර්යාලයට විපක්ෂ නායකතුමා, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා, නියෝජ්‍ය සංවිධායකයින්, ගරු මන්ත්‍රීවරුන් හඳුනා ගැනීමට පැමිණෙන අමුත්තන් නිරතුරුවම පැමිණෙන බැවින් එකී අමුත්තන් කාර්යාලය තුළ ගතකරන කාලය තුළ ඔවුනට විපක්ෂ නායක කාර්යාලයේ දැනුවත් වීම සඳහා වූ ප්‍රකාශන, විධිමත් ලෙස කාර්යාලය තුළ ප්‍රදර්ශන අවශ්‍යතාවය දක්නට ලැබුණු බැවින් ඒ සඳහා වූ ව්‍යාපෘතිය ප්‍රියංකර පුෂ්පකුමාර මහතා විසින් ක්‍රියාත්මක කරන ලදී. කාර්යාලයීය පරිසරයේ අලංකරණය ද සැළකිල්ලට ගනිමින් කාර්යාලයට පැමිණෙන අමුත්තන් සඳහා පරිහරණයට පොත්පත්, සඟරා හා පත්‍රිකා සුදුසු ලෙස ප්‍රදර්ශනය කිරීමට හා ගබඩා කිරීමට මෙමගින් පියවර ගනු ලැබිය.



කාර්යාලයීය අභ්‍යන්තර සන්නිවේදනය විධිමත් කිරීම සඳහා 'මැමෝ' ක්‍රමවේදය හඳුන්වා දීම

කාර්යාලයේ අභ්‍යන්තර ලිපි සහ සටහන් විධිමත් ක්‍රමවේදයකට අනුව සන්නිවේදනය කිරීම සඳහා වූ ක්‍රමවේදයක් සැකසීමටත්, ඒ සඳහා විවිධ ආයතන ක්‍රියාත්මක කරන ක්‍රමවේදයන් විමර්ශනය කරමින් වඩාත් ගැළපෙන අභ්‍යන්තර සන්නිවේදනය සඳහා වූ මැමෝ පත්‍රිකාවක් සකස් කිරීම සඳහා වූ ව්‍යාපෘතිය ප්‍රසාද් වික්‍රමසිංහ මහතා ක්‍රියාත්මක කරන ලදී. කාර්යාලයේ විවිධ අංශ හඳුනා ගනිමින් ඒ ඒ අංශ සඳහා නාමකරණය කරන ලද මැමෝ පත්‍රිකාවක් නිර්මාණය කිරීම තුළින් අභ්‍යන්තර සන්නිවේදනය සඳහා වූ ලිපි පොදුවේ හඳුනාගත හැකි කාර්යාලයීය ක්‍රමවේදයකට ඒ තුළින් අනුගත වීමට හැකි විය.

විපක්ෂ නායකතුමාගේ පාර්ලිමේන්තු කාර්යයන් හා විපක්ෂ නායකතුමාගේ නිලධාරීන්ගේ කාර්යයන් විධිමත්ව ගොනුගත කිරීම

මෙය නිරන්තරයෙන්ම යාවත්කාලීන වන ව්‍යාපෘතියකි. මෙම ගොනුගත කිරීමෙන් විපක්ෂ නායකතුමා පාර්ලිමේන්තුවේ කරනු ලබන කථා, ස්ථාවර නියෝග 27(2) යටතේ අසනු ලබන ප්‍රශ්න මෙන්ම විපක්ෂ නායකතුමා විපක්ෂ නායක කාර්යාලයේදී හමුවන යම් පුද්ගලයින්, සංවිධාන සමග කරනු ලබන සාකච්ඡා විධිමත්ව වාර්තාගත කිරීමද සිදුකළ යුතු වේ. අයේෂා විජේන්ද්‍ර මෙනවිය මෙම ව්‍යාපෘතිය යටතේ විපක්ෂ නායකතුමා පාර්ලිමේන්තුවේදී සිදුකළ කථා සහ ස්ථාවර නියෝග 27(2) යටතේ යොමු කළ ප්‍රශ්න මුද්‍රිත ප්‍රකාශනයක් ලෙස එළිදැක්වීමට කටයුතු කරන ලදී. එමෙන්ම විපක්ෂ නායක කාර්යාලයේ දී එතුමා සහභාගී වූ රැස්වීම්, පුද්ගල හමුවීම්, එම අවස්ථාවේ ලබාගත් ඡායාරූප සහ එම වැඩසටහන සම්බන්ධ කෙටි සටහනක් යොදමින් ප්‍රකාශනයක් මුද්‍රණය කරන ලදී.

කාර්ය මණ්ඩලයේ ධනාත්මක චින්තනය ප්‍රවර්ධනය කිරීම, ප්‍රථමාධාර පහසු කිරීම සඳහා වූ ව්‍යාපෘතිය

ආයතන සංග්‍රහයේ xxii වන පරිච්ඡේදයේ සුබසාධක පහසුකම් අවශ්‍යතා සැපයීම වෙනුවෙන් කාර්යාලය තුළ සිදුකළ යුතු කාර්යයන් පිළිබඳව මඟපෙන්වීම් සිදුකොට ඇත. එමෙන්ම වඩාත් කාර්යක්ෂම සහ සතුටුදායක පරිසරයක සේවය කිරීමේ අවස්ථාව සැලසීම සඳහා කාර්ය මණ්ඩලය තුළ ධනාත්මක චින්තනය ප්‍රවර්ධනය කිරීම අත්‍යාවශ්‍ය වූවකි. මෙකී අරමුණ සාධනය සඳහා ගිහාන් සේනානායක මහතා අදාළ කාලය තුළ ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය තුළින් කාර්ය මණ්ඩලය සඳහා කාර්ය මණ්ඩල දායකත්වයෙන් ප්‍රථමාධාර සහ ඖෂධ මිලදී ගැනීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන ලදී. කාර්ය මණ්ඩලයේ ධනාත්මක ප්‍රවර්ධනය කිරීම සඳහා විශේෂ සම්පත්දායකයින්ගේ සහභාගීත්වයෙන් උපදේශන වැඩමුළු සංවිධානය කිරීමට මෙම ව්‍යාපෘතිය යටතේ සංවිධානය කළ අතර එහි පළමු පියවර ලෙස "දිරිය කාන්තා විශේෂ දැනුම්වත් කිරීමේ වැඩසටහනක්" වෛද්‍ය නවාස් පීෆ්ර් මහතාගේ සහභාගීත්වයෙන් පවත්වනු ලැබිය.



සංරක්ෂණ පුස්තකාලයක් නිර්මාණය කිරීම

සංරක්ෂණ පුස්තකාලයක් නිර්මාණය කිරීම විපක්ෂය විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන ලේඛන, පාර්ලිමේන්තුවේ හැන්සාඩ් වාර්තා මෙන්ම පාර්ලිමේන්තු විවාදවලට අවශ්‍ය දැනුම, තොරතුරු සම්පාදනය කිරීමට වැදගත් වන ලේඛන සහ පර්යේෂණ අංශයට අවශ්‍ය වන පොත්පත් සහ ලේඛන සංරක්ෂණය කොට පරිශීලනය සඳහා පුස්තකාලයක් සකස් කිරීම හා එම පුස්තකාලය ක්‍රමානුකූල පිළිවෙළකට ස්ථානගත කිරීම සඳහා වූ ව්‍යාපෘතිය චතුරිකා බුලත්සිංහල මහත්මිය විසින් ක්‍රියාත්මක කරන ලදී.



විපක්ෂ නායක කාර්යාලයේ සුබසාධක සංගමයක් ආරම්භ කිරීම

විපක්ෂ නායක කාර්යාලයේ කාර්ය මණ්ඩලය හා විපක්ෂ නායකතුමා, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය සාමාජිකත්වය දරන විපක්ෂ නායක කාර්යාලයේ සුබසාධක සංගමයක් ආරම්භ කිරීම සඳහා වූ යෝජනාව දින 100 ව්‍යාපෘතිය යටතේ සජිත් ලංකා ද සිල්වා මහතා විසින් ක්‍රියාත්මක කරන ලදී. කාර්ය මණ්ඩලය තුළ සුහදතාවය, එකමුතුකම හා ඒකාකාරී කාර්ය පටිපාටියෙන් මිදී කාර්යාලය තුළ කටයුතු කිරීමට අභිලාෂය, සාධනය කිරීම මූලික අරමුණ ලෙස තබා ගනිමින් සුබසාධක සංගමය ආරම්භ කරන ලදී.





පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කාර්යාලයේ සුබසාධක සංගමයේ නිලධාරී මණ්ඩලය

ගරු අනුශාසක
විපක්ෂ නායක
ගරු.සජිත් ප්‍රේමදාස මැතිතුමා

ගරු අනුශාසක
විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
ගරු.ගයන්ත කරුණාතිලක මැතිතුමා

ගරු අනුශාසක
විපක්ෂයේ නියෝජ්‍ය සංවිධායක
ගරු.ජේ.සී.අලවතුවල මැතිතුමා

ගරු අනුශාසක
විපක්ෂයේ නියෝජ්‍ය සංවිධායක
ගරු.අජිත් පී පෙරේරා මැතිතුමා

ගරු උපදේශක
විපක්ෂ නායක ලේකම්
සුරංග රණසිංහ මහතා

ගරු සභාපති
නිරෝධ කාරියවසම් මහතා

ගරු ලේකම්
එස්.ලංකා ද සිල්වා මහතා

ගරු භාණ්ඩාගාරික
දිල්හානි ජයසිංහ මහත්මිය



කණ්ඩායම් ව්‍යාපෘති

විපක්ෂ නායක කාර්යාලයේ සාමූහික දැක්ම යථාර්ථයක් බවට පත් කිරීම සහ කාර්ය මණ්ඩලය අතර අන්‍යෝන්‍ය අවබෝධය හා කණ්ඩායම් හැඟීම වර්ධනය කිරීමේ මූලික අරමුණින්, "අයවැය එනතුරු දින සියය" වැඩසටහනට සමගාමීව විශේෂ කණ්ඩායම් ව්‍යාපෘති රැසක් සාර්ථකව දියත් කරන ලදී. හුදු තනි පුද්ගල මැදිහත්වීමෙන් ඔබ්බට යමින්, ආයතනයේ පාලන, පර්යේෂණ, මාධ්‍ය, ගිණුම් සහ පාර්ලිමේන්තු කටයුතු යන විවිධ අංශ නියෝජනය කරන නිලධාරීන්ගේ ඒකාබද්ධ දායකත්වයෙන් සහ මනා සම්බන්ධීකරණයෙන් යුතුව මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරිණි. ආයතනික ඵලදායීතාව සහ විනිවිදභාවය ඉහළ නැංවීම, නවීන තාක්ෂණය මුසු කරමින් ආයතනික මෙහෙයුම් සුහුරු හා විධිමත් කිරීම මෙන්ම, ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව තිරසර සංවර්ධන ඉලක්ක සහ පාරිසරික සංරක්ෂණ සංකල්ප ආයතනගත කිරීම වැනි පුළුල් අරමුණු රාශියක් මෙම සාමූහික ප්‍රයත්නයන් හරහා ජයගැනීමට කාර්යාලයට හැකි විය. එකී අරමුණු පෙරදැරිව, නිලධාරීන්ගේ එකමුතුවෙන් යුතුව සාර්ථකව ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන කණ්ඩායම් ව්‍යාපෘති පහත පරිදි වේ:

පාර්ලිමේන්තු නිල මැදිරි තොරතුරු කළමනාකරණ දත්ත පද්ධතිය සකස් කිරීමේ ව්‍යාපෘතිය

නිරාෂා වික්‍රමාරච්චි මහත්මියගේ සම්බන්ධීකරණයෙන් සහ සමීර විජේරත්න මහතා, සවිත් සූරියාරච්චි මහතා ඇතුළු නිලමැදිරි රාජකාරි ඉටුකරන සියලුම නිලධාරීන්ගේ කණ්ඩායම් දායකත්වයෙන් මෙම ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. පාර්ලිමේන්තු නිල මැදිරි තොරතුරු කළමනාකරණ ක්‍රියාවලිය වඩාත් විධිමත් හා කාර්යක්ෂම කිරීම උදෙසා ඊට අදාළ නිසි දත්ත පද්ධතියක (Database) නිර්මාණය කිරීම මෙහි මූලික අරමුණ විය. ඒ අනුව, අදාළ තොරතුරු සියල්ල ක්‍රමානුකූලව ගබඩා කරමින් අවශ්‍ය අවස්ථාවන්හිදී කඩිනමින් හා පහසුවෙන් ප්‍රවේශ විය හැකි පරිදි මෙම නව තොරතුරු දත්ත පද්ධතිය නිර්මාණය කිරීමේ කටයුතු ආරම්භ කළ අතර, 2025 වර්ෂය තුළදී සාර්ථකව නිම කරන ලද්දේ මෙහි පද්ධති පරීක්ෂණ අදියර පමණි.

විපක්ෂයේ පාර්ලිමේන්තු දිනපොත (Opposition Parliament Diary) පවත්වාගෙන යාමේ ව්‍යාපෘතිය

චතුරිකා බුලත්සිංහල මහත්මියගේ සම්බන්ධීකරණයෙන් සහ සමීර විජේරත්න මහතා, නිරාෂා වික්‍රමාරච්චි මහත්මිය, ආනන්ද ජයසිංහ මහතා, ගිහාන් සේනානායක මහතා සහ සජිත් ලංකා මහතා යන අයගෙන් සමන්විත කණ්ඩායමේ දායකත්වයෙන් මෙම ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. සභා ගර්භයේ කටයුතු, කාරක සභා කටයුතු සහ පාර්ලිමේන්තු කටයුතුවලට අදාළ විශේෂ සිදුවීම් ගොනු කරමින් විපක්ෂයේ පාර්ලිමේන්තු දිනපොතක් අඛණ්ඩව පවත්වාගෙන යාම මෙහි මූලික අරමුණ විය. ඒ අනුව, අදාළ සියලුම පාර්ලිමේන්තු ක්‍රියාකාරකම් සහ සුවිශේෂී සිදුවීම් විධිමත්ව ලේඛනගත කරමින්, අනාගත පරිශීලනය සඳහා ද පහසු වන පරිදි මෙම දිනපොත් සටහන අඛණ්ඩව පවත්වාගෙන යාම සිදු කෙරිණි.

ජාතික ඵලදායිතා සම්මාන (National Productivity Programme) ව්‍යාපෘතිය

චතුරිකා රන්දෙනිය මහත්මියගේ ප්‍රධාන සම්බන්ධීකරණයෙන් සහ ගිහාන් දිසානායක මහතා ඇතුළු කාර්යාලයේ සියලුම අංශ ප්‍රධානීන්ගේ පූර්ණ සහයෝගයෙන් යුතුව ක්‍රියාත්මක කරන ලද මෙම ව්‍යාපෘතිය ආයතනික ඉතිහාසයේ සුවිශේෂී සන්ධිස්ථානයක් සනිටුහන් කළේය. රජයෙන් වගවීමක් සහ ඉහළ කාර්ය සාධනයක් අපේක්ෂා කරන විපක්ෂ නායක කාර්යාලය, හුදෙක් අධීක්ෂණ ආයතනයක් ලෙස පමණක් නොව ආදර්ශමත් රාජ්‍ය ආයතනයක් ලෙස ද එම උසස් වටිනාකම් ප්‍රායෝගිකව ප්‍රකට කළ යුතු බවට වූ දැඩි විශ්වාසය මත මෙය දියත් කෙරිණි. ඒ අනුව, ශ්‍රී ලංකා පාර්ලිමේන්තු ඉතිහාසයේ ප්‍රථම වතාවට විපක්ෂ නායක කාර්යාලයක් නියෝජනය කරමින් 2025/2026 ජාතික ඵලදායිතා සම්මාන තරගය සඳහා අයදුම් කිරීම මෙහිදී සාර්ථකව සිදු කරන ලදී. මෙම ඉලක්කය ජයගැනීම උදෙසා කාර්යාලයේ අභ්‍යන්තර ක්‍රියාවලිය සම්පූර්ණ නවීකරණයකට ලක් කෙරුණු අතර, වැනි ඵලදායිතා සංකල්ප ප්‍රායෝගිකව ආයතනගත කිරීම, කාර්ය මණ්ඩලයේ ධාරිතාව වර්ධනය කිරීම සඳහා විශේෂිත පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, පවතින පද්ධති පුළුල් සමාලෝචනයකට ලක් කිරීම සහ සම්මාන නිර්ණායක සමඟ ආයතනික ක්‍රියා පටිපාටි මැනවින් පෙළගැස්වීම යන සියලුම අභ්‍යන්තර සූදානම්කාරිත්ව කටයුතු නිම කරන ලදී. එමෙන්ම, තවද, මෙම ඵලදායිතා වැඩසටහනේ පළමු අදියර 2025 වර්ෂයේදී සාර්ථකව අවසන් කරන ලද අතර, එහි මිළඟ අදියර 2026 වර්ෂයේදී ආරම්භ කර මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී.

එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්ක (SDGs) ප්‍රායෝගිකව ආයතනගත කිරීමේ ව්‍යාපෘතිය

කේෂිණී අනුරාධා මහත්මියගේ ප්‍රධාන සම්බන්ධීකරණයෙන් සහ සවිත් සූරියාරච්චි මහතා, රසාංජලී රත්නායක මහත්මිය, සජිත් ලංකා මහතා මෙන්ම හර්ෂක රාජපක්ෂ මහතාගෙන් සමන්විත ක්‍රියාකාරී කණ්ඩායමේ පූර්ණ දායකත්වයෙන් යුතුව මෙම ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, විපක්ෂ නායක කාර්යාලයේ දෛනික රාජකාරි, පාර්ලිමේන්තු අධීක්ෂණ කටයුතු, පරිපාලන පිළිවෙත් සහ ප්‍රතිපත්ති විශ්ලේෂණය යන සෑම අංශයක්ම මෙම ගෝලීය ඉලක්කයන්ට අනුකූලව පෙළගැස්වීම මෙහිදී ප්‍රායෝගිකව සිදු විය. කාර්යාලයේ අභ්‍යන්තර කටයුතුවලට තිරසර සංවර්ධන මූලධර්ම අදාළ කරගන්නා ආකාරය සම්බන්ධයෙන් මුළු කාර්ය මණ්ඩලයම පුළුල් ලෙස දැනුවත් කරමින්, ඔවුන්ට අවශ්‍ය මඟපෙන්වීම සහ විශේෂ පුහුණු සැසි ලබා දෙන ලදී. රජයේ ප්‍රතිපත්ති සහ පනත් කෙටුම්පත් විමර්ශනය කිරීමේදී හුදෙක් දේශීය දෘෂ්ටිකෝණයකින් පමණක් නොව, ගෝලීයව දැනුවත් වූ තිරසර මානයන්ගෙන් ද ඒ දෙස බැලීමේ හැකියාව මෙමඟින් විපක්ෂ කාර්යාලයට හිමි විය. තවද, තිරසර සංවර්ධනයට ඍණාත්මක ලෙස බලපාන පාලන අසාර්ථකතා සම්බන්ධයෙන් කල්තියා හඳුනාගෙන පූර්ව අනතුරු ඇඟවීම් ලබා දීමටත්, ආයතනික සහ ජාතික මට්ටමින් සමානාත්මතාවය මෙන්ම අන්තර්ග්‍රාහීත්වය (Inclusivity) වඩාත් ශක්තිමත්ව ප්‍රවර්ධනය කිරීමටත් අවශ්‍ය න්‍යායාත්මක හා ප්‍රායෝගික පසුබිම මෙම ව්‍යාපෘතිය හරහා කාර්යාලය තුළ සාර්ථකව හා ස්ථිරසාරව ස්ථාපිත කෙරිණි.



ස්ත්‍රීපුරුෂ සමානාත්මතාවය (Gender Equality) ප්‍රායෝගිකව ආයතනගත කිරීම සහ ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

රසාංජලී රත්නායක මහත්මියගේ ප්‍රධාන සම්බන්ධීකරණයෙන් සහ සවිත් සූරියාරච්චි මහතා, කේෂිණී අනුරාධා මහත්මිය, සජිත් ලංකා මහතා මෙන්ම හර්ෂක රාජපක්ෂ මහතාගෙන් සමන්විත ක්‍රියාකාරී කණ්ඩායමේ පූර්ණ දායකත්වයෙන් යුතුව මෙම ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. රජය විසින් ගෙන එනු ලබන නව නීති, ප්‍රතිපත්ති සහ රෙගුලාසි මඟින් ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවය ප්‍රමාණවත් ලෙස ආරක්ෂා කරන්නේද යන්න පිළිබඳව අර්ථවත් අධීක්ෂණයක් සිදු කිරීමේ අරමුණින්, ආයතනික පර්යේෂණ අංශය හරහා යෝජිත පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් ගැඹුරු ස්ත්‍රී-පුරුෂ සමාජභාව සංවේදීතා විශ්ලේෂණයන් (Gender-sensitive analyses) සිදු කරන ලදී. තවද, හුදෙක් බාහිර ප්‍රතිපත්ති විමර්ශනයට පමණක් සීමා නොවී, කාර්යාලයේ අභ්‍යන්තර පරිපාලන කටයුතු, සම්පත් බෙදාහැරීම ක්‍රියාවලිය තුළ ද ස්ත්‍රී-පුරුෂ සමාජභාවය කෙරෙහි දැඩි ලෙස සංවේදී වූ සාධාරණ හා සමාන අවස්ථා ලබා දීමේ පිළිවෙත් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට පියවර ගැනිණි. මෙම පුළුල් මූලපිරීම හරහා විවිධ හේතූන් මත ආන්තිකකරණයට ලක්වූවන්ගේ හඬ පාර්ලිමේන්තු ක්‍රියාවලීන් තුළ වඩාත් ප්‍රබලව ඉස්මතු කිරීමට හැකි වූ අතර, ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවය යනු හුදෙක් කතාවට පමණක් සීමා වූ මාතෘකාවක් නොව, විපක්ෂ නායක කාර්යාලයේ සෑම කටයුත්තකදීම නිරන්තරයෙන් මිනුම්ගත කෙරෙන සැබෑ ප්‍රමිතියක් බවට පත් කරමින්, ජාතික මට්ටමින් සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීමට කාර්යාලය සතු කැපවීම තවදුරටත් තහවුරු කෙරිණි.

සියලුම විපක්ෂයේ පක්ෂ සඳහා මාධ්‍ය හමුව (Press Conference)

නිරෝධ කාරියවසම් මහතාගේ ප්‍රධාන සම්බන්ධීකරණයෙන් සහ ඒරානන්ද හෙට්ටිආරච්චි මහතා මෙන්ම සවිත් සූරියාරච්චි මහතාගෙන් සමන්විත ක්‍රියාකාරී කණ්ඩායමේ පූර්ණ දායකත්වයෙන් යුතුව මෙම ව්‍යාපෘතිය 2025 වර්ෂයේදී සාර්ථකව ආරම්භ කරන ලදී. පාර්ලිමේන්තුව තුළ විපක්ෂය නියෝජනය කරන සියලුම දේශපාලන පක්ෂ එකම වේදිකාවකට ගෙන එමින්, ඔවුන්ගේ සාමූහික හඬ සහ එකමුතුකම ප්‍රබලව සමාජගත කිරීම මෙහි මූලික අරමුණ විය. ඒ අනුව, ජාතික වශයෙන් වැදගත් වන කාලීන ගැටලු, ආර්ථික ප්‍රතිපත්ති සහ ආණ්ඩුවේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් විපක්ෂයේ ස්ථාවරය පැහැදිලි කරමින් ජනතාව දැනුවත් කිරීම සඳහා 2025 වසර තුළදී ඒකාබද්ධ මාධ්‍ය හමු පහක් ඉතා සාර්ථකව සංවිධානය කොට මෙහෙයවන ලදී.

නිල සමාජ මාධ්‍ය ගිණුම (X / Twitter) ස්ථාපිත කිරීම සහ කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතිය

සවිත් සූරියාරච්චි මහතාගේ ප්‍රධාන සම්බන්ධීකරණයෙන් සහ ඒරානන්ද හෙට්ටිආරච්චි මහතා, සමීර විජේරත්න මහතා මෙන්ම ඉෂාර කරුණාරත්න මහතාගෙන් සමන්විත කණ්ඩායමේ පූර්ණ දායකත්වයෙන් යුතුව මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. මහජනතාව සහ පාර්ලිමේන්තුව අතර සෘජු සන්නිවේදන පාලමක් ගොඩනැගීමේ අරමුණින්, 2025 ජනවාරි මාසයේදී විපක්ෂ නායක කාර්යාලය විසින් "Opposition of Parliament - Sri Lanka" නමින් නිල 'X' (Twitter) ගිණුමක් මේ යටතේ ස්ථාපිත කෙරිණි. එසේ පාර්ලිමේන්තු සභා ගර්භය තුළ සහ විවිධ කාරක සභා අවස්ථාවන්හිදී විපක්ෂ මන්ත්‍රීවරුන් විසින් ඉටු කරනු ලබන ජාතික කාර්යභාරය රටවැසියන් වෙත කඩිනමින් හා විනිවිදභාවයෙන් යුතුව සන්නිවේදනය කිරීම සඳහා වර්තමානයේ මෙම ගිණුම ප්‍රධාන මෙවලමක් ලෙස භාවිත කෙරේ. ඒ යටතේ, අමාත්‍යවරුන් වෙත යොමු කරන ලබන වාචික ප්‍රශ්න, ස්ථාවර නියෝග 27/2 යටතේ විපක්ෂයේ පක්ෂ නායකයින් විසින් මතු කරනු ලබන ප්‍රශ්න, ගරු අග්‍රාමාත්‍යතුමිය වෙත යොමු කරන විශේෂ ප්‍රශ්න මෙන්ම සභාව කල් තැබීමේ අවස්ථාවේදී විපක්ෂ මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා සහ ප්‍රශ්න යනාදී සියලුම වැදගත් පාර්ලිමේන්තු තොරතුරු නිතිපතා මහජනතාව වෙත බෙදා හැරීම මේ හරහා අඛණ්ඩව සිදු කෙරෙමින් පවතී.



විපක්ෂයේ ප්‍රකාශනය (Opposition Bulletin)

උපුල් බණ්ඩාර මහතාගේ ප්‍රධාන සම්බන්ධීකරණයෙන් සහ ඒරානන්ද හෙට්ටිආරච්චි මහතා, සමීර විජේරත්න මහතා, සවිත් සූරියාරච්චි මහතා, ඉෂාර කරුණාරත්න මහතා මෙන්ම නලීර් අහමඩ් මහතාගෙන් සමන්විත කණ්ඩායමේ පූර්ණ දායකත්වයෙන් යුතුව මෙම සුවිශේෂී ව්‍යාපෘතිය 2025 වර්ෂයේදී සාර්ථකව ආරම්භ කරන ලදී. ප්‍රජාතන්ත්‍රවාදී වගවීම සහ මහජනතාවගේ තොරතුරු දැනගැනීමේ අයිතිය තවදුරටත් තහවුරු කිරීමේ අරමුණින්, මාධ්‍යවේදීන්, බුද්ධි මණ්ඩල, සිවිල් සමාජ සංවිධාන සහ සාමාන්‍ය පුරවැසියන් වෙත කිසිදු පෙරහන්කරණයකින් තොර වූ සත්‍ය සහ කාලෝචිත තොරතුරු ලබා දීම මෙහි මූලික අරමුණ විය. ඒ අනුව, සෑම පාර්ලිමේන්තු රැස්වීම් සතියක්ම අවසානයේදී විපක්ෂයේ සමස්ත පාර්ලිමේන්තු ක්‍රියාකාරිත්වය, එනම් මන්ත්‍රීවරුන්ගේ කථා, යොමු කළ ප්‍රශ්න සහ විවාදයන්හි දැක්වූ දායකත්වය සවිස්තරාත්මකව වාර්තා කරමින් 'විපක්ෂයේ පාර්ලිමේන්තු ප්‍රකාශනය (Opposition Bulletin) සම්පාදනය කළ අතර, 2025 වසර තුළදී එහි කලාප කිහිපයක්ම සාර්ථකව මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය ඔස්සේ අදාළ පාර්ශ්වකරුවන් වෙත බෙදා හරින ලදී. සියලුම පාඨකයන්ගේ ප්‍රවේශ්‍යතාවය පුළුල් කිරීම උදෙසා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන ත්‍රිභාෂාවෙන්ම මෙය නිෂ්පාදනය කෙරුණු අතර, විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් ඇතුළු සමස්ත සමාජයටම සමීප වීම සඳහා කෘත්‍රිම බුද්ධියෙන්(AI) බලගන්වන ලද නවීන ශ්‍රව්‍ය-දෘශ්‍ය මෙවලම්වල තාක්ෂණික සහාය ද මීට එලදායී ලෙස යොදා ගැනිණි. මේ යටතේ (2025) වර්ෂය තුලදී සිංහල මාධ්‍යයෙන් බුලටින් ප්‍රකාශන 29ක්, දෙමළ මාධ්‍යය ප්‍රකාශන 27ක් සහ ඉංග්‍රීසි මාධ්‍යය ප්‍රකාශන 16ක් වශයෙන් සාර්ථකව නිකුත්කර තිබේ.



අයවැය ප්‍රගති සමාලෝචනය සහ විධිමත් අධීක්ෂණ වාර්තාකරණ ව්‍යාපෘතිය

කේෂිණී අනුරාධා මහත්මියගේ ප්‍රධාන සම්බන්ධීකරණයෙන් සහ දිල්හානි ජයසිංහ මහත්මිය, අචලා රත්නායක මහත්මිය, ඉෂාර කරුණාරත්න මහතා මෙන්ම මාලක වැන්කියුලැන්බර්ග් මහතාගෙන් සමන්විත කණ්ඩායමේ පූර්ණ දායකත්වයෙන් යුතුව මෙම ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. සෑම රජයේ අයවැයක්ම හුදෙක් පොරොන්දු සමූහයකට පමණක් සීමා නොවිය යුතු බවත්, එම පොරොන්දු ප්‍රකාරව සැබෑ භූමිය තුළ නිසි පරිදි කටයුතු කෙරෙන්නේද යන්න දැන ගැනීමට පුරවැසියන්ට අයිතියක් ඇති බවත් පදනම් කරගනිමින්, ඒ පිළිබඳව පුළුල්ව විමසා බැලීමේ ක්‍රමානුකූල අධීක්ෂණ ක්‍රියාවලියක් විපක්ෂ නායක කාර්යාලය විසින් මේ යටතේ ස්ථාපිත කෙරිණි. ඒ අනුව, ආංශික අධීක්ෂණ කාරක සභා ජාලය හරහා රජය විසින් ඉදිරිපත් කළ එක් එක් අයවැය යෝජනාව වෙන වෙනම පරීක්ෂාවට ලක් කරමින්, ඒවායේ සැබෑ ප්‍රගතිය නිරීක්ෂණය කොට අදාළ සොයාගැනීම් විධිමත් සමාලෝචන වාර්තාවක් ලෙසින් සම්පාදනය කිරීම මෙහිදී සිදු විය. මෙම ක්‍රියාවලියේ සාර්ථක ප්‍රතිඵලයක් ලෙස, 2025 අයවැය සමාලෝචනය මුළුමනින්ම අවසන් කරන ලද අතර, ඊට අදාළව "2025 අයවැය සැලසුම් ප්‍රගති සමාලෝචනය" (2025 Budget Plan Progress Review) නමින් සකස් කළ විශේෂිත ග්‍රන්ථය මුද්‍රිත පිටපතක් ලෙස මෙන්ම වෙබ් අඩවිය හරහා ද සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන ත්‍රිභාෂාවෙන්ම සාර්ථකව එළිදක්වා මහජනතාවට ලබා දෙන ලදී.



ආයතනික සම්මත මෙහෙයුම් කාර්ය පරිපාටි (SOP) හඳුන්වා දීම සහ ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය

සමීර විජේරත්න මහතාගේ ප්‍රධාන සම්බන්ධීකරණයෙන් සහ රකිත ගුණරත්න මහතා, සවිත් සූරියාරච්චි මහතා මෙන්ම ආයතනයේ සියලුම අංශ නියෝජනය කරන නිලධාරීන්ගෙන් සමන්විත පුළුල් කණ්ඩායමේ පූර්ණ දායකත්වයෙන් යුතුව මෙම ව්‍යාපෘතිය 2025 වර්ෂයේදී සාර්ථකව සැලසුම් කොට සම්පාදනය කරන ලදී. විපක්ෂ නායක කාර්යාලයේ මූලික කාර්යභාරයන් වන පාර්ලිමේන්තු සම්බන්ධීකරණය, ප්‍රතිපත්ති විශ්ලේෂණය සහ පරිපාලන කටයුතු වඩාත් කාර්යක්ෂමව, පාලනමය විනිවිදභාවයකින් සහ වගවීමකින් යුතුව ඉටු කිරීම සඳහා ප්‍රමිතිගත රාමුවක් නිර්මාණය කිරීම මෙහි මූලික අරමුණ විය. ඒ අනුව, පාලන අංශය සඳහා SOP 01 ක්, පාර්ලිමේන්තු කටයුතු අංශය සඳහා SOP 15 ක්, පර්යේෂණ අංශය සඳහා SOP 04 ක්, මාධ්‍ය අංශය සඳහා SOP 02 ක් සහ ගිණුම් අංශය සඳහා SOP 04 ක් වශයෙන් සමස්ත සම්මත මෙහෙයුම් කාර්ය පරිපාටි 26ක් විධිමත්ව හඳුන්වා දෙන ලදී.



ආයතනික අනන්‍යතාව තහවුරු කිරීමේ නිල T-Shirt හඳුන්වා දීමේ ව්‍යාපෘතිය

විපක්ෂ නායක කාර්යාලයේ සුබසාධක සංගමයේ පූර්ණ මැදිහත්වීම සහ මූලිකත්වයෙන් සති 3ක් වැනි කෙටි කාලසීමාවක් තුළ මෙම ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. ආයතනයේ සේවය කරන සමස්ත කාර්ය මණ්ඩලයේ ආයතනික අනන්‍යතාවය වඩාත් තහවුරු කරමින්, ඔවුන් අතර වෘත්තීයමය බැඳීමක් සහ සාමූහිකත්වයක් ගොඩනැගීම මෙහි මූලික අරමුණ විය.





ආයතනික සමානාත්මතාවය ප්‍රවර්ධනය කරමින් පානීය කෝප්ප (Hot and Cold Mugs) ලබා දීමේ ව්‍යාපෘතිය

විපක්ෂ නායක කාර්යාලයේ සුබසාධක සංගමයේ පූර්ණ මූලිකත්වයෙන් දින 100ක පමණ කාලසීමාවක් පුරා මෙම ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. ආයතනයේ රියදුරු මහත්වරුන් විසින් සමස්ත කාර්ය මණ්ඩලයේ පොදු ප්‍රයෝජනය සහ පහසුව උදෙසා ඉදිරිපත් කරන ලද ධනාත්මක යෝජනාවක් ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීමක් ලෙස මෙය ආරම්භ විය. ඒ අනුව, කාර්යාලයේ සියලුම නිලධාරීන්ට දෛනික රාජකාරී අතරතුර භාවිත කිරීම සඳහා උණුසුම් සහ සිසිල් පානයන් (Hot and Cold) නිසි උෂ්ණත්වයෙන් පවත්වා ගත හැකි උසස් ප්‍රමිතියෙන් යුත් කෝප්ප (Mug) ලබා දීම මෙහිදී සිදු කෙරිණි.






පාර්ලිමේන්තු කටයුතු හා පර්යේෂණ අංශයේ ප්‍රගතිය

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න

පොදු වැදගත්කමකින් යුත් ජාතික ගැටලු සහ කාලීන කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ සහ රජයේ අවධානය සෘජුවම යොමු කිරීම උදෙසා, ස්ථාවර නියෝග 27(2) යටතේ විපක්ෂයේ ගරු පක්ෂ නායකවරුන් විසින් 2025 වර්ෂය තුළදී සුවිශේෂී ප්‍රශ්න රැසක් සභාවට යොමු කරන ලදී. ජනතා අභිලාෂයන් නියෝජනය කරමින් සහ ආණ්ඩුවේ වගවීම තහවුරු කිරීමේ අරමුණින් එසේ ආසන ලද ප්‍රශ්න සහ ඊට අදාළ සවිස්තරාත්මක තොරතුරු පහතින් දැක්වේ.

1. ගරු විපක්ෂ නායකතුමා විසින් අසා ඇති ප්‍රශ්න සංඛ්‍යාව
2. විපක්ෂයේ වෙනත් පක්ෂ නායකයින් විසින් අසා ඇති ප්‍රශ්න සංඛ්‍යාව
3. අසා ඇති මුළු ප්‍රශ්න සංඛ්‍යාව



ගරු සජිත් ප්‍රේමදාස මහතා විසින් අසනු ලබූ (27/2) ප්‍රශ්න

2025.01.08	ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත
2025.01.23	විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රමාදය
2025.02.06	කොළඹ වරාය බහාලුම් නිෂ්කාශනය කිරීමේ ක්‍රමවේදය
2025.02.19	දරිද්‍රතාව සහ අස්වැසුම් වැඩසටහන පිළිබඳ දත්ත
2025.02.27	ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සහ අපරාධ මැඩලීම සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ග
2025.03.04	මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතතාව පිළිබඳ පනත සංශෝධනය කිරීම සහ ඩිජිටල් සේවා අපනයන මත යෝජිත බදු
2025.03.11	උපාධි ධාරීන්ගේ රැකියා විරහිතභාවය සඳහා විසඳුම්
2025.03.20	ජ්‍යෙෂ්ඨ පුරවැසි තැන්පතු සහ ළමා ගිණුම් සඳහා රඳවා ගැනීමේ බද්ද අය කිරීම
2025.03.21	වර්තමාන රජයේ බලශක්ති උත්පාදන ප්‍රතිපත්තිය
2025.04.08	පරාටේ නීතිය ක්‍රියාත්මක කිරීම හේතුවෙන් කර්මාන්තකරුවන් මුහුණ දෙන ගැටලු
2025.04.09	එක්සත් ජනපද තීරුබදු ගැටළුව නිරාකරණය කර ගැනීම සඳහා රජයේ වැඩපිළිවෙළ
2025.05.08	පිරිවැය ප්‍රතිසාධන විදුලිබිල(SVAT) අහෝසි කිරීම සහ ඩිජිටල් අපනයන සඳහා බද්ද
2025.05.09	ඖෂධ හිඟය නැති කිරීම සඳහා රජයේ වැඩපිළිවෙළ
2025.05.20	රට පුරා සිදුවන වෙඩි තැබීම් සහ ඝාතන වැළැක්වීම
2025.05.23	ණය ගෙවීම සඳහා සාක්ෂාත් කරගතයුතු සාර්ව ආර්ථික ඉලක්ක
2025.06.03	දේශීයව නිෂ්පාදිත සීනි සහ එහි අතුරු නිෂ්පාදන මත පනවන ලද වැට් බද්ද
2025.06.17	ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයට දේශීය සිසුන් බඳවා ගැනීම අත්හිටුවීම
2025.06.20	අස්වැසුම් සුබසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමයේ අරමුණු සහ ප්‍රතිලාභ

2025.07.08	බහාලුම් 323ක් රේගු පරීක්ෂාවකින් තොරව නිදහස් කිරීම පිළිබඳ වාර්තාව
2025.07.09	වී මිලදී ගැනීම සහ සහල් ආනයනය පිළිබඳ රජයේ ප්‍රතිපත්ති
2025.07.22	අලි - මිනිස් ගැටුම අවම කිරීම සඳහා ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම
2025.07.25	ඔසුසල් සඳහා නිකුත් කර ඇති බලපත්‍ර අලුත් කිරීම සහ ඖෂධවේදීන් පුහුණු කිරීම
2025.08.05	යෞවන සමාජ පිහිටුවීම සහ ප්‍රතිසංවිධානය කිරීම
2025.08.07	ආනයනික විද්‍යුත් මානක මත පනවන බදු
2025.09.09	ආනයනික ලොකු ලූණු සහ අර්තාපල් සඳහා විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද වැඩි කිරීම
2025.09.12	අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රවල ගැටලු
2025.09.23	විරැකියාව අවම කිරීම
2025.09.24	2025 අයවැය යෝජනාවල ප්‍රගතිය
2025.10.07	අනාගත සංවර්ධන ඉලක්ක සහ ණය තිරසරභාවය සාක්ෂාත් කර ගැනීම සඳහා ගෙන ඇති පියවර
2025.10.10	අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අංශවල ගැටලු විසඳීම සඳහා රජයේ වැඩපිළිවෙල
2025.10.21	සුවසැරිය ගිලන් රථ සේවාව සහ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ගැටලු
2025.10.24	ඖෂධ හිඟය නැති කිරීම සඳහා රජයේ වැඩපිළිවෙළ
2025.11.12	පිරිවෙන් අධ්‍යාපනය සඳහා ප්‍රතිසංස්කරණ
2025.11.25	පෙර පාසල් අධ්‍යාපනය ප්‍රමිතිකරණය කිරීම
2025.12.19	කොරියාවේ රැකියා සඳහා වන ගිවිසුම් යාවත්කාලීන කිරීම

ගරු රවී කරුණානායක මහතා විසින් අසනු ලබූ (27/2) ප්‍රශ්න

2025.02.18	මෑතකදී දිවයින පුරා සිදු වූ විදුලිය බිඳ වැටීම
2025.02.21	විදේශ සංචිත ඉලක්ක සහ ණය සංචිත සේවා ලබා ගැනීම
2025.03.01	තිරසර හා පිරිවැය ඵලදායී බලශක්ති උත්පාදනයේ අවශ්‍යතාව
2025.03.08	යෝජිත සරල කරන ලද එකතු කළ අගය මත බද්ද අහෝසි කිරීම
2025.03.18	එක්සත් ජනපද නව තීරුබදු ප්‍රතිපත්තිය මත ශ්‍රී ලංකා අපනයන වලට ඇතිවන බලපෑම අවම කිරීමට ගතයුතු ක්‍රියාමාර්ග
2025.04.08	එක්සත් ජනපද තීරුබදු ගැටලුව නිරාකරණය කර ගැනීම සඳහා රජයේ වැඩපිළිවෙල
2025.04.10	සහල් නිෂ්පාදනය පරිභෝජනය සහ ආනයනය
2025.05.09	උසස් පෙළ සිසුන් සඳහා උසස් අධ්‍යාපන අවස්ථා සහ විශ්වවිද්‍යාල තුළ නවක වදය වැළැක්වීම
2025.05.21	තාප විදුලිය සහ පුනර්ජනනීය බලශක්තිය පිළිබඳ රජයේ ප්‍රතිපත්තිය
2025.05.22	මැද පෙරදිග සේවය කරන ශ්‍රී ලාංකික සේවකයින් සඳහා අවම වැටුපක් හඳුන්වා දීම
2025.06.05	පොල් කර්මාන්තය නගා සිටුවීම
2025.06.19	ඖෂධ හිඟය ඇති වීමට බලපාන ප්‍රසම්පාදන ප්‍රමාදය
2025.06.20	ස්වාධීන කොමිෂන් සභාවල පරිපාලන රාමුව සහ වගවීම
2025.07.08	FEED -IN TARIFF අඩු කිරීමෙන් පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රයට ඇතිවන බලපෑම
2025.07.23	SVAT ක්‍රමයේ සිට යෝජිත VAT ආපසු ගෙවීමේ ක්‍රමයට පරිවර්තනය වීමේදී ඇතිවන බලපෑම
2025.07.25	උද්ධමන සහ මූල්‍ය ප්‍රතිපත්ති ඉලක්ක සපුරා ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව අපොහොසත් වීම
2025.08.06	ලීසිං ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම
2025.08.21	අපනයන ඉපැයීම වැඩිදියුණු කිරීම සහ ආයෝජන ආකර්ෂණය කර ගැනීම
2025.08.22	රාජ්‍ය විශ්වවිද්‍යාල උපාධිධාරීන්ගේ බුද්ධිගලනය

2025.09.11	වී සඳහා සාධාරණ අවම සහතික මිලක් නියම කිරීම සහ සහල් මිල නියාමනය කිරීම
2025.09.12	නිල සංචිත වත්කම් ඉලක්ක සපුරා ගැනීමේ අභියෝග
2025.09.24	සරල එකතු කළ අගය මත බද්ද අහෝසි කිරීමෙන් අපනයන ක්ෂේත්‍රයට වන බලපෑම
2025.09.26	සීනි කර්මාන්තයේ තිරසරභාවය
2025.10.08	මත්ද්‍රව්‍ය උවදුර පාලනය කිරීමේ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම
2025.10.10	මැණික් කර්මාන්තය අපනයන ඉලක්කගත කර්මාන්තයක් බවට පත් කිරීම
2025.10.23	Lanka Government Cloud හි මෑත කාලීන බිඳ වැටීමේ බලපෑම
2025.10.24	සියයට 5ක උද්ධමන ඉලක්කයන් පවත්වාගෙන යාමේ තීරණය
2025.11.08	ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුමෙහි ප්‍රතිලාභ සහ "එටිකා" ගිවිසුම පිළිබඳ සාකච්ඡා
2025.11.11	2022 අප්‍රේල් මාසයේදී මූල්‍ය බංකොලොත්භාවය ප්‍රකාශ කිරීමේ නීතිමය පදනම
2025.11.18	කොළඹ ආරක්ෂක සමුළුව මගින් සපයන අවස්ථාවන් සැලසුම් සහගතව භාවිත කිරීම
2025.11.27	ස්වාධීන සේවක අර්ථසාධක අරමුදල් අධිකාරියක් පිහිටුවීම
2025.12.18	2023-2025 දක්වා බලපැවැත්වුණු වාණිජ බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතනවල ණය ප්‍රසාරණය

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා විසින් අසනු ලබූ (27/2) ප්‍රශ්න

2025.01.22	රුසියාවේ රැකියා සඳහා විදේශගත වූ තරුණයන් මුහුණ දෙන ගැටලු
2025.02.06	මෑතකදී ඇති වූ ගංවතුරින් විපතට පත් ගොවීන්ට සහන
2025.02.28	දමිළ දේශපාලන සිරකරුවන් නිදහස් කිරීම
2025.03.06	කයිට්ස්හි පෞද්ගලික ඉඩමක තිස්ස රජමහා විහාරය ඉදි කිරීම
2025.03.20	වාලච්චේන කඩදාසි කම්හල යළි පණ ගැන්වීම
2025.05.08	උතුරු සහ නැගෙනහිර දමිළ ජනතාවගේ පාරම්පරික ඉඩම් අත්පත් කර ගැනීම පිළිබඳ ගැසට් නිවේදනය
2025.05.20	ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල ඩිප්ලෝමාධාරීන් ගුරුවරුන් ලෙස ස්ථානගත කිරීම
2025.06.03	කිලිනොච්චියේ ශ්‍රී ලංකා ජරීමානු තාක්ෂණික පුහුණු ආයතනය ස්වාධීන ආයතනයක් ලෙස ක්‍රියාත්මක කිරීම

2025.06.07	උතුරු සහ නැගෙනහිර සමූහ මිනීවලවල් පිළිබඳ විමර්ශන
2025.07.09	යාපනය දිස්ත්‍රික්කයේ ගොවීන් මුහුණ දෙන ගැටළු
2025.07.23	කන්කසන්තුරේ වරාය ප්‍රතිසංස්කරණය කිරීමේ ප්‍රමාදය
2025.08.06	අංක (2185/74) දරන අතිවිශේෂ ගැසට් පත්‍රය අවලංගු කිරීම
2025.08.20	යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපල සංවර්ධන ව්‍යාපෘතියේ දෙවන අදියර ප්‍රමාද වීම
2025.09.20	වලිකාමම් උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අවතැන් වූ ජනතාව නැවත පදිංචි කිරීම
2025.09.25	යෝජිත අධ්‍යාපන විෂයමාලා ප්‍රතිසංස්කරණය
2025.10.09	කිලිනොච්චි දිස්ත්‍රික් මහරෝහලේ නාරිවේද ඒකකය ක්‍රියාත්මක කිරීම
2025.10.22	මන්නාරමේ ක්‍රියාත්මක වූ වියලි කලාප නාගරික ජල හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය
2025.11.14	වඩමාරච්චි නැගෙනහිර ප්‍රදේශයේ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම
2025.12.03	දෙමළ රජවරුන්ගේ ඉතිහාසය පාසල් විෂය මාලාවට ඇතුළත් කිරීම

ගරු දිලිත් ජයවීර මහතා විසින් අසනු ලබූ (27/2) ප්‍රශ්න

2025.02.25	පාසල් ගුරුවරුන් බඳවා ගැනීමේ ක්‍රමවේදය සහ දහම් පාසල් ගුරුවරුන්ගේ දීමනාව
2025.03.12	ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය නැවත ස්ථාපිත කිරීම
2025.06.04	සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනය සඳහා ගෙන ඇති පියවර
2025.08.05	රේගු පරීක්ෂාවකින් තොරව බහාලුම් 323ක් නිදහස් කිරීම පිළිබඳව සොයා බැලීමට පත් කරන ලද කමිටුවේ වාර්තාව

ගරු අමිර්තනාදන් අඩෙක්කලනාදන් මහතා විසින් අසනු ලබූ (27/2) ප්‍රශ්න

2025.02.28	මන්නාරම් දිස්ත්‍රික්කයේ ක්‍රීඩාපිටිවල ඉදිකිරීම් කටයුතු
2025.03.05	මුලතිව් සහ මන්නාරම දිස්ත්‍රික්කවල ගිනි නිවන සේවා ඒකක ස්ථාපිත කිරීම
2025.03.06	ඔඩිසුසුඩාන් උළු කර්මාන්තශාලාව නැවත විවෘත කිරීම
2025.06.19	මන්නාරම පල්ලිමුණේ ධීවරයින්ට අයත් ඉඩම් රජය විසින් අත්පත් කර ගැනීම
2025.08.21	මන්නාරම සහ රාමේෂ්වරම් අතර සාජු මගී නෞකා සේවාව
2025.08.22	වන්නි දිස්ත්‍රික්කයේ ගවයින් සඳහා තෘණභූමි හිඟය
2025.10.07	උතුරේ ධීවරයින් මුහුණ දෙන අභියෝග
2025.11.26	කොළඹ - මන්නාරම දුම්රිය සේවාවේ ගැටලු

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා විසින් අසනු ලබූ (27/2) ප්‍රශ්න

2025.03.11	වෛද්‍ය වෘත්තිකයන්ගේ හිඟය හේතුවෙන් මන්නාරම සහ චාවකච්චේරි ප්‍රදේශවල සෞඛ්‍ය සේවාවලට සිදුවන බලපෑම
2025.05.23	අලිමංකඩ ලුණු ලේවායේ ගැටලු
2025.06.05	උතුරු පළාතේ රෝහල් සඳහා ලැබුණු පරිත්‍යාග සහ මූල්‍ය ආධාර පිළිබඳ විගණනයක්
2025.07.11	ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ මතුව ඇති ගැටලු
2025.08.19	තෙලිප්පලෙයි මූලික රෝහලේ සිදුව ඇතැයි සඳහන් මූල්‍ය වංචාව
2025.09.11	ධීවර සහ ජලජ සාගර සම්පත් අමාත්‍යාංශයට එරෙහි චෝදනා
2025.09.26	පළාලි ගුවන්තොටුපල සහ කන්කසන්තරේ වරාය සංවර්ධනය කිරීම
2025.11.21	පුත්තලම මූලික රෝහලේ පුරප්පාඩු සහ කාර්ය මණ්ඩල සමාලෝචනය

ගරු කේ. කාදර් මස්තාන් මහතා විසින් අසනු ලබූ (27/2) ප්‍රශ්න

2025.06.04	කොළඹ - කන්කසන්තුරේ දුම්රිය සේවාව නැවත ආරම්භ කිරීම
2025.07.11	රජයේ භාෂා පරිවර්තක සේවයේ ගැටළු
2025.07.24	වන්නි මැතිවරණ දිස්ත්‍රික්කයේ අත්සන් කරගත් පෞද්ගලික ඉඩම් නිදහස් කිරීම
2025.08.20	ශ්‍රී ලංකා රේගුව විසින් රඳවාගෙන තිබෙන ශුද්ධ වූ කුරාණයේ දෙමළ පරිවර්තන නිදහස් කිරීම
2025.09.09	අවතැන් වූ පුද්ගලයන් සඳහා වන සුබසාධන මධ්‍යස්ථාන වෙත ලබා දී ඇති වාහන
2025.09.23	වාහන වායු විමෝචනය පරීක්ෂණවල තත්ත්වය වැඩි දියුණු කිරීම
2025.10.08	වාහන අංක තහඩු නිකුත් නොකිරීම නිසා මුහුණ දෙන ගැටලු
2025.10.21	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සපයන සේවාවන් වැඩිදියුණු කිරීම
2025.11.13	වෙළඳපොලෙහි කීරි සම්බා සහල් හිඟය
2025.11.17	විදෙස්ගත ශ්‍රී ලාංකිකයින් විදෙස් ගමන් බලපත්‍රය අලුත් කිරීමේදී මුහුණ දෙන දුෂ්කරතා
2025.11.24	සියළු සිසුන් සඳහා සමාන අධ්‍යාපන අවස්ථා සැලසීම

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා විසින් අසනු ලබූ (27/2) ප්‍රශ්න

2025.09.10	1990 දී (LTTE) ය විසින් මුස්ලිම් වන්දනාකරුවන් පිරිසක් ඝාතනය කිරීම පිළිබඳ විමර්ශනයක් පැවැත්වීම
2025.09.25	සේවක වැටුප් ගෙවීමේදී පළාත් පාලන ආයතන මුහුණ දෙන ගැටලු
2025.11.20	මුස්ලිම් කාන්තා හෙදියන්ට කලිසම් ඇඳීමට අවස්ථා ලබාදීම

ගරු එම්. ඒ. එම්. තාහිර් මහතා විසින් අසනු ලබූ (27/2) ප්‍රශ්න

2025.10.09	විවාහ ලියාපදිංචි කිරීමේ නීතියේ ඇති නොගැළපීම් නිසා මුස්ලිම්වරුන් මුහුණ දෙන ගැටලු

කල්තබන අවස්ථාවේ යෝජනා

ජාතික වශයෙන් වැදගත් වන කාලීන ගැටලු සහ හදිසි මහජන අවශ්‍යතාවන් සම්බන්ධයෙන් රජයේ සහ පාර්ලිමේන්තුවේ කඩිනම් අවධානය යොමු කිරීමේ අරමුණින්, පාර්ලිමේන්තු ස්ථාවර නියෝග (20) යටතේ විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් විසින් (2025) වර්ෂය තුළදී සභාව කල් තැබීමේ අවස්ථාවේ යෝජනා 36 ක් සභාවට ගෙන එන ලදී.

අනු අංකය	දිනය	යෝජනාවේ මාතෘකාව	යෝජනාව ඉදිරිපත් කළ මන්ත්‍රීතුමා/තුමිය
1	2025.09.25	ජීවන වියදම අඩු කිරීමට කඩිනම් වැඩපිළිවෙළක්	ගරු අමිල ප්‍රසාද් මහතා
2	2025.01.23	ජාත්‍යන්තර නීතියට අනුකූලව රෝහිණ්‍යා සරණාගත ගැටළුව සඳහා විසඳුම් සෙවීම	ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
3	2025.02.07	ක්‍රිකට් ක්‍රීඩාව සංවර්ධනය කිරීමට, වංචා සහ දූෂණ නැති කිරීමට නිසි වැඩපිළිවෙළක්	ගරු හේෂා විතානගේ මහතා
4	2025.02.18	දෙහිවල මිලාද් විද්‍යාලය සඳහා අමතර ගොඩනැගිල්ලක් ලබාදීම	ගරු මුජිබුර් රහුමාන් මහතා
5	2025.02.20	අම්පාර පෙරිය නිලාවනෙ ප්‍රදේශයේ යෝජිත සුරාසැල් සඳහා නිකුත් කරන ලද බලපත්‍ර අත්හිටුවීම	ගරු ශානක්‍යන් රාජපුත්තිරන් රාසමානික්කම් මහතා
6	2025.02.22	උතුරු පළාතේ නීති විරෝධී ධීවර ක්‍රියාකාරකම් වැළැක්වීම	ගරු තුරෙයිරාසා රවිකරන් මහතා
7	2025.02.27	කාර්යාලය හැටන් නගරය තුළ ස්ථානගත කිරීමේ උත්සාහය වැළැක්වීම	ගරු මනෝ ගණේෂන් මහතා
8	2025.03.01	යුක්තිය පසිඳලීම පිළිබඳ විශේෂ කාරක සභාවක් පිහිටුවීම	ගරු නිසාම් කාරියප්පර් මහතා
9	2025.03.04	රත්නපුර දිස්ත්‍රික්කයේ ගංවතුර පාලනය කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක්	ගරු වරුණ ලියනගේ මහතා
10	2025.03.06	වෛද්‍ය වෘත්තිකයන්ට මුහුණ පෑමට සිදුව ඇති අභියෝග	ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහත
11	2025.03.08	ILOC190 සම්මුතිය අපරානුමත කිරීමෙන් වැඩබිම තුළ කාන්තාවන් සවිබල ගැන්වීම	ගරු රෝහිණි කුමාරි විජේරත්න මහත්මිය
12	2025.03.11	මඩකලපුව ගුවන්තොටුපල පුළුල් කිරීමේදී ලබා දී ඇති විකල්ප ඉඩම් සඳහා ඔප්පු ලබාදීම	ගරු ඥානමුත්තු ශ්‍රීනේෂන් මහතා
13	2025.03.14	අර්තාපල් අස්වනු නෙලන සමයේදී අර්තාපල් ආනයනය පාලනය කිරීම	ගරු චාමර සම්පත් දසනායක මහතා
14	2025.03.17	නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීමේ අවශ්‍යතාව	ගරු අජිත් පී. පෙරේරා මහතා
15	2025.03.19	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක (19/2022) මගින් රාජ්‍ය සේවයට ඇතිවන බලපෑම	ගරු නිසාම් කාරියප්පර් මහතා
16	2025.04.09	සූර්ය බලශක්තිය ප්‍රවර්ධනය කිරීම	ගරු අජිත් පී. පෙරේරා මහතා
17	2025.05.20	2430/2025 දරන ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ ගැසට් නිවේදනය	ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා
18	2025.06.05	අම්පාර සහ මඩකලපුව ධීවරයින්ගේ ජීවනෝපායට බලපාන අපරාධ ක්‍රියාකාරකම් වැළැක්වීම	ගරු නිසාම් කාරියප්පර් මහතා
19	2025.07.09	2019.04.21) දින සිදු වූ පාස්කු ඉරිදා ප්‍රහාරය	ගරු ශානක්‍යන් රාජපුත්තිරන් රාසමානික්කම් මහතා
20	2025.07.22	දේශීය සීනි කර්මාන්තය රැක ගැනීම	ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
21	2025.08.05	කෝරළෙපත්තු මධ්‍යම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ගැසට් කිරීම	ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා
22	2025.08.22	උතුරු නැගෙනහිර මලෙයහම් ප්‍රදේශවල ප්‍රජාව මුහුණ දෙන මානව හිමිකම් ගැටළු	ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා
23	2025.09.10	වී සඳහා සාධාරණ මිලක්	ගරු රෝහණ බණ්ඩාර මහතා
24	2025.09.23	2025 නීති විද්‍යාල ප්‍රවේශ විභාගයේ ප්‍රතිඵල නැවත සමීක්ෂණය	ගරු චාමර සම්පත් දසනායක මහතා

අනු අංකය	දිනය	යෝජනාවේ මාතෘකාව	යෝජනාව ඉදිරිපත් කළ මන්ත්‍රීතුමා/තුමිය
25	2025.01.09	යෝජිත විදුලි ගාස්තු අඩු කිරීම	ගරු කබීර් හෂීම් මහතා
26	2025.10.09	පොහොසත් රටක් ලස්සන ජීවිතයක් ප්‍රතිපත්ති ප්‍රකාශය ක්‍රියාවට නැංවීම	ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
27	2025.10.10	ජාතික පොලිස් කොමිෂන් සභාවේ ස්වාධීනත්වය තහවුරු කිරීම	ගරු අර්ජුන සුජීව සේනසිංහ මහතා
28	2025.10.21	දේශගුණික සමෘද්ධි සැලැස්ම ක්‍රියාත්මක කිරීම	ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
29	2025.10.24	දියවඩන නිලමේ තනතුර සඳහා වන ඡන්ද විමසීමේදී කාන්තා ප්‍රඥප්තිය ලේකම්වරුන්ට ඡන්ද අයිතිය ලබා දීම	ගරු චතුර ගලප්පත්ති මහතා
30	2025.11.08	මාවනැල්ල ප්‍රාදේශීය සභාව විසින් අනුමත කළ සංවර්ධන ව්‍යාපෘති අත්හිටුවීම	ගරු කබීර් හෂීම් මහතා
31	2025.11.11	ත්‍රිරෝද රථ සඳහා විදේශීය සංචාරකයින්ට රියදුරු බලපත්‍ර ලබාදීම නතර කිරීම	ගරු චාමර සම්පත් දසනායක මහතා
32	2025.11.13	අක්ෂි සෞඛ්‍ය සඳහා ක්‍රමෝපායික සැලැස්මක් ක්‍රියාත්මක කිරීම	ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චිචුනා මහතා
33	2025.11.19	විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන සීමිත සමාගමක් බවට පත් කිරීමේ යෝජනාව	ගරු චාමර සම්පත් දසනායක මහතා
34	2025.11.21	කින්නියා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ලුණු නිෂ්පාදනයට අවශ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම	ගරු ඉම්රාන් මහරූෆ් මහතා
35	2025.11.24	වෙරුගල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉඩම් ගැටලු	ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා
36	2025.11.26	රජයේ ඉඩම් භුක්ති විඳින ජනතාවට සින්නක්කර ඔප්පු ලබාදීම	ගරු අජිත් පී. පෙරේරා මහතා

සභාව කල් තැබීමේ අවස්ථාවේ ප්‍රශ්න

මහජනතාවට සෘජුවම බලපාන හදිසි අවශ්‍යතාවන් සහ කාලීන වැදගත්කමකින් යුත් ගැටලු සම්බන්ධයෙන් රජයේ කඩිනම් අවධානය යොමු කිරීමේ අරමුණින්, පාර්ලිමේන්තු ස්ථාවර නියෝග (20) යටතේ විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් විසින් (2025) වර්ෂය තුළදී සභාව කල් තැබීමේ අවස්ථාවේ ප්‍රශ්න 17ක් සභාවට යොමු කරන ලදී.

දිනය	මාතෘකාව	ප්‍රශ්න ඉදිරිපත් කල මන්ත්‍රීතුමා
2025.01.08	මැණික් කර්මාන්තය ආශ්‍රිතව	ගරු හේෂා විතානගේ මැතිතුමා
2025.02.06	බණ්ඩාරවෙල, මිල්ලනිය ආයෝජන ප්‍රවර්ධන කලාප වල ප්‍රගතිය සහ බණ්ඩාරගම, ගල්පාත පිහිටි රයිගම්පුර හරිත කාර්මික අධිකලාපය ව්‍යාපෘතියේ ප්‍රගතිය	ගරු අජිත් පී. පෙරේරා මැතිතුමා
2025.05.09	දිගින් දිගටම රට තුළ සිදු වී ඇති වෙඩි තැබීම් සම්බන්ධව	ගරු දයාසිරි ජයසේකර මැතිතුමා
2025.05.21	සෞඛ්‍ය උපාධිධාරීන්ගේ ගැටලු	ගරු දයාසිරි ජයසේකර මැතිතුමා
2025.05.23	පළාත් සභා මැතිවරණය පැවැත්වීමට අදාළ පනත් කෙටුම්පත	ගරු නිසාම් කාරියප්පර් මැතිතුමා
2025.06.04	පාර්ලිමේන්තුවේ සියළු මන්ත්‍රීවරුන් වෙත ලබාදෙන විමධ්‍යගත ප්‍රතිපාදන	ගරු දයාසිරි ජයසේකර මැතිතුමා
2025.06.06	සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් සම්බන්ධව	ගරු චාමර සම්පත් දසනායක මැතිතුමා
2025.06.17	ඇමරිකානු වෙළඳ බද්ද	ගරු රවී කරුණානායක මැතිතුමා

දිනය	මාතෘකාව	ප්‍රශ්න ඉදිරිපත් කල මන්ත්‍රීතුමා
2025.07.11	ධීවර ගැටලු	ගරු ඉම්රාන් මහරූෆ් මැතිතුමා
2025.07.23	ගුරු විදුහල්පති වැටුප් විෂමතාවය	ගරු රෝහිණි කුමාරි විජේරත්න මැතිතුමිය
2025.07.25	තරුණ සංගමයේ තරුණ සමිති සම්බන්ධව	ගරු චාමර සම්පත් දසනායක මැතිතුමා
2025.08.06	ග්‍රාමසේවා වසම් තුළ මහජන ආරක්ෂක කමිටු සහ සිවිල් ආරක්ෂක කමිටු සම්බන්ධ ගැටළු	ගරු දයාසිරි ජයසේකර මැතිතුමා
2025.08.20	ශ්‍රී ලංකාවේ ජාතික ඖෂධ නියාමන ප්‍රතිපත්තිය සම්බන්ධ ගැටළු	ගරු හෙක්ටර් අප්පුහාමි මැතිතුමා
2025.09.09	ෆිනෑන්ස් සමාගම විසින් ණය කාලසීමාව තුළ දඩ පොලී අය කිරීම	ගරු කබීර් හෂීම් මැතිතුමා
2025.09.11	උපාධිධාරීන්ගේ රැකියා අවස්ථා	ගරු ශානක්‍යයන් රාසමානික්කම් මැතිතුමා
2025.09.24	ඇමරිකානු වෙළඳ බද්ද	ගරු රවී කරුණානායක මැතිතුමා
2025.10.07	හැඩඔය ව්‍යාපෘතිය සම්බන්ධව	ගරු අබ්දුල් වාසිත් මැතිතුමා

ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් විමසන ලද ප්‍රශ්න

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග (38) යටතේ ජාතික වැදගත්කමකින් යුත් සුවිශේෂී කරුණු සහ රජයේ ප්‍රතිපත්තිමය තීරණ සම්බන්ධයෙන් ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් සෘජුවම කරුණු විමසීමේ අරමුණින්, (2025) වර්ෂය තුළදී විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් විසින් සුවිශේෂී ප්‍රශ්න මාලාවක් සකස් කරන ලදී.

දිනය	මාතෘකාව	ප්‍රශ්න ඉදිරිපත් කල මන්ත්‍රීතුමා
2025.01.08	ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාව පිළිබඳව වූ විදෙස් පිළිවෙත වැදගත් වන අතර, ඊශ්‍රායල ජාතික සංචාරකයින් පිරිසක් අරඹයා පැන නැඟී ඇති ප්‍රශ්න	ගරු මුජිබර් රහුමාන් මැතිතුමා
2025.01.08	පිරිසිදු කළ, නොකළ පොල්තෙල් සම්බන්ධව	ගරු එස්.එම්.මරික්කාර් මැතිතුමා
2025.02.05	සෞඛ්‍ය උපාධිධාරීන්ගේ ගැටලු	ගරු එස්.එම්.මරික්කාර් මැතිතුමා
2025.02.05	රට මේ වන විට මුහුණ දී ඇති ණය උගුලෙන් බේරීමට කළ යුතු එකම දෙය අපනයන සංවර්ධනය වැඩි කිරීමයි. ඒ සඳහා වූ වැඩපිළිවෙල කෙබඳුද? යන්න	ගරු රවී කරුණානායක මැතිතුමා
2025.04.09	ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විද්‍යාලයේ අලුතෙන් නිර්මාණය කළ පීඨවලට අවශ්‍ය පහසුකම්	ගරු අමිල ප්‍රසාද් මැතිතුමා
2025.04.09	ශ්‍රී ලංකාව තුළ ප්‍රතිසන්ධානගත සම්බන්ධයෙන් පවත්නා බහුවිධ අභියෝග පිළිබඳ ගැටළු	ගරු ශානක්‍යයන් රාසමානික්කම් මැතිතුමා
2025.06.04	පසුගිය වසර ඇතුළත වෛද්‍යවරුන් (2000) කට අධික පිරිසක් රට හැර ගොස් ඇත. ඔවුන් වෙනුවෙන් කළ වියදම් පියවා ගැනීම සඳහා ගෙන ඇති වැඩපිළිවෙළ සම්බන්ධව	ගරු රවී කරුණානායක මැතිතුමා
2025.06.04	ඉන්දීය අගමැති නරේන්ද්‍ර මෝදි මැතිතුමා (2025/04/04) සහ (2025/04/05) දින ශ්‍රී ලංකාවේ කරන ලද සංචාරය අතරතුර ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර ඇතිකරගත් ගිවිසුම් සම්බන්ධ ගැටලු	ගරු අජිත් පී. පෙරේරා මැතිතුමා

දිනය	මාතෘකාව	ප්‍රශ්න ඉදිරිපත් කල මන්ත්‍රීතුමා
2025.07.09	2020-2024 වසර වල විශ්‍රාම ගිය රාජ්‍ය සේවකයින්ගේ වැටුප් විෂමතාවය සම්බන්ධයෙන් පැන නැඟී ඇති ගැටලු	ගරු රෝහිණී කුමාර විජේරත්න මැතිතුමිය
2025.07.09	මෑත කාලීන සෘජු විදේශ ආයෝජන පිළිබඳ ගැටලු	ගරු ඩී.වී. චානක මැතිතුමා
2025.08.06	වංචාව හා දූෂණය පිළිබඳව මෙන්ම ඒ තුළින් මහජන මුදල් අපතේ යෑම හා අවභාවිත වීම පිළිබඳව	ගරු චමින්ද විජේසිරි මැතිතුමා
2025.08.06	සවුදි රජයෙන් අක්කරෙයිපත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සුනාමි ව්‍යසනයට ලක් වූ පවුල් වලට ලබා දී ඇති රු.මිලියන (1500) ක ආධාරය සම්බන්ධව	ගරු කාදර් මස්තාන් මැතිතුමා
2025.09.10	විදුලි බිල සම්බන්ධව පැන නැඟී ඇති ගැටලු	ගරු රවී කරුණානායක මැතිතුමා
2025.09.10	MV-Xpress-pearl නෞකාව නිසා සිදු වූ පාරිසරික හානිය පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයේ පැවති නඩු සම්බන්ධව	ගරු අජිත් පී. පෙරේරා මැතිතුමා
2025.10.08	රජය විසින් LGBTQ ප්‍රජාව ප්‍රවර්ධනය කිරීම සම්බන්ධව	ගරු (වෛද්‍ය) කාවින්ද ජයවර්ධන මැතිතුමා
2025.10.08	මානව හිමිකම් කොමිසන් සභාවේ වාර්තාව සම්බන්ධ ගැටලු	ගරු ශානක්‍යයන් රාසමානික්කම් මැතිතුමා

වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

මහජනතාව මුහුණ දෙන විවිධ ගැටලු සහ පරිපාලනමය දුර්වලතා පිළිබඳව රජයේ අවධානය කඩිනමින් යොමු කිරීමේ අරමුණින්, විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් විසින් අදාළ විෂයභාර අමාත්‍යවරුන්ගෙන් වාචික පිළිතුරු අපේක්ෂාවෙන් සභාවට ප්‍රශ්න යොමු කිරීම නිරන්තරයෙන් සිදු විය. ඒ අනුව, (2025) වර්ෂය තුළදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් වූ සමස්ත වාචික ප්‍රශ්න (1572) ක ප්‍රමාණය අතුරින්, ප්‍රශ්න 448ක්ම විපක්ෂයේ මන්ත්‍රීවරුන් විසින් විධිමත්ව සභාවට යොමු කරන ලදී.

විශේෂ කාරක සභා යෝජනා

ස්ථාවර නියෝග 100 සිට 110 තෙක් වූ ප්‍රතිපාදන යටතේ ජාතික වශයෙන් අතිශය වැදගත් සහ මතභේදාත්මක කරුණු සම්බන්ධයෙන් පුළුල් විමර්ශනයක් සිදු කිරීමේ අරමුණින්, 2025 වර්ෂය තුළදී විපක්ෂය විසින් විශේෂ කාරක සභා යෝජනා තුනක් 03 පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

1. කොළඹ වරායේ සිට බහාලුම් 323ක් අනිවාර්ය භෞතික පරීක්ෂණයට භාජනය කිරීමකින් තොරව නිදහස් කිරීම සම්බන්ධයෙන් සොයා බැලීම.

2. අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් අධිකරණ නිලධාරීන්ට අදාළව පත් කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරු කිරීම්, සේවයෙන් පහ කිරීම් සහ විනය පාලන බලතල ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳව ගැඹුරින් පරීක්ෂා කර බැලීම

3. දිට්වා සුළිකුණාටුවට මුහුණ දීම සඳහා ආණ්ඩුව තුළ පූර්ව සූදානමක් නොමැති වීම සම්බන්ධව පූර්ණ අධ්‍යයනයක් සිදු කිරීම

විශ්වාසභංග යෝජනා

රජයේ ඉහළ වගකීම් දරන අමාත්‍යවරුන්ගේ ක්‍රියාකලාපය සහ වගවීම නිසි පරිදි ප්‍රශ්න කරමින්, (2025) වර්ෂයේදී විපක්ෂය විසින් එක් සුවිශේෂී විශ්වාසභංග යෝජනාවක් පාර්ලිමේන්තුවට ගෙන එන ලදී. ඒ අනුව, පාස්කු ඉරුදින ප්‍රහාරය සිදු වූ සමයේ ආරක්ෂක සේනා (නැගෙනහිර) ලෙස කටයුතු කළ අරුණ ජයසේකර මහතා ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍ය ධුරය දරන රජයක පාස්කු ඉරුදින ප්‍රහාරය සම්බන්ධව විමර්ශනය කිරීම මඟින් එම විමර්ශනවල ස්වාධීනත්වය සම්බන්ධව ගැටලු ඇති විය හැකි බැවින් අරුණ ජයසේකර මහතාට එරෙහිව මෙම විශ්වාසභංග යෝජනාව විධිමත්ව සභාවට ඉදිරිපත් කිරීමට විපක්ෂය විසින් පියවර ගන්නා ලදී.

වරප්‍රසාද ප්‍රශ්න

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නිදහස, ආරක්ෂාව සහ වරප්‍රසාද සුරක්ෂිත කිරීමේ අරමුණින්, සමස්ත විපක්ෂය නියෝජනය කරන ගරු මන්ත්‍රීවරුන් විසින් (2025) වර්ෂය තුළදී වරප්‍රසාද ප්‍රශ්න 22ක් සභාව හමුවට ගෙන එන ලදී. මන්ත්‍රීවරුන්ගේ රාජකාරී ඉටු කිරීමට බාධා වන අන්දමේ සිදුවීම් සහ අයිතිවාසිකම් කඩවීම් පිළිබඳව මෙහිදී කඩිනම් අවධානය යොමු කරමින් අදාළ වරප්‍රසාද ගැටලු මතු කිරීම සිදු කෙරිණි.

පාර්ලිමේන්තු කණ්ඩායම් රැස්වීම් සහ විපක්ෂයේ පක්ෂනායක රැස්වීම්

විපක්ෂයේ කාර්යභාරය වඩාත් ඵලදායීව සහ සංවිධානාත්මකව ඉටු කිරීම සඳහා විපක්ෂයේ පාර්ලිමේන්තු කණ්ඩායම් අතර ක්‍රමවත් සැලසුම් සකස් කිරීම අත්‍යවශ්‍ය වේ. ඒ අනුව, 2025 වර්ෂය තුළදී පාර්ලිමේන්තු කණ්ඩායම් රැස්වීම් 27ක් ඉතා සාර්ථකව පවත්වන ලදී.

පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත්

මහජන සුබසාධනය, නෛතික ප්‍රතිසංස්කරණ සහ සමාජ ප්‍රගමනය උදෙසා නීති සම්පාදන ක්‍රියාවලියට සක්‍රීයව මෙන්ම ඵලදායීව දායක වෙමින්, සමස්ත විපක්ෂය නියෝජනය කරන ගරු මන්ත්‍රීවරුන් විසින් (2025) වර්ෂය තුළදී පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් 03ක් පාර්ලිමේන්තුවට සාර්ථකව ඉදිරිපත් කරන ලදී.

පනත් කෙටුම්පතේ නාමය	ඉදිරිපත් කළ මන්ත්‍රීවරයා
මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පනත ඉවත් කිරීම	ගරු රවී කරුණානායක මැතිතුමා
පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සංශෝධන	ගරු ශානක්‍යයන් රාසමානික්කම් මැතිතුමා
ඉඩම් සංවර්ධන ආඥා පනත සංශෝධන	ගරු රෝහිණී කවිරත්න මැතිණිය

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම්

පාර්ලිමේන්තුවේ දෛනික රැස්වීම් වැඩසටහන ඵලදායීව මෙහෙයවීම සහ සමස්ත පාර්ලිමේන්තු කටයුතු වඩාත් විධිමත්ව හා ක්‍රමානුකූලව සැලසුම් කිරීම සහ ගැබේ සුමට ක්‍රියාකාරිත්වයට අතිශය වැදගත් වේ. ඒ සඳහා අවශ්‍ය පසුබිම සකසමින්, ඉදිරි පාර්ලිමේන්තු සතිවල න්‍යාය පත්‍රය, පනත් කෙටුම්පත් සහ විවිධ යෝජනා විවාදයට ගන්නා දිනයන්, කාල සීමාවන් මෙන්ම අනෙකුත් විශේෂ පාර්ලිමේන්තු කටයුතු සම්බන්ධයෙන් පක්ෂ විපක්ෂ එකඟතාවන්ට එළඹීම උදෙසා (2025) වර්ෂය තුළදී පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා (Committee on Parliamentary Business) රැස්වීම් 27ක් පවත්වන ලදී. පාර්ලිමේන්තු න්‍යාය පත්‍රය සකස්කිරීම තුළ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් ප්‍රමාණවත් නියොජනයක් වන බවට තහවුරු කිරීම සඳහා අවශ්‍ය නියොජනයන් සිදුකරනු ලබුදි.

ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කිරීම

අභාවප්‍රාප්ත වූ හිටපු ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන් අනුස්මරණය කිරීම උදෙසා සභාවට ඉදිරිපත් කරන ලද ශෝක ප්‍රකාශ යෝජනා විවාදයන්හිදී සමස්ත විපක්ෂය සිය කෘතවේදීත්වය සහ ගෞරවය පුද කරන ලදී. ඒ අනුව, ගරු විපක්ෂ නායකතුමා, විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ඇතුළු විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් විසින් (2025) වර්ෂය තුළදී පහත සඳහන් අභාවප්‍රාප්ත මැති ඇමැතිවරුන් (30) දෙනා වෙනුවෙන් පාර්ලිමේන්තුවේදී ශෝක ප්‍රකාශ ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

- ගරු කුමාර වෙල්ගම මහතා
- ගරු ටියුඩර් ගුණසේකර මහතා
- ගරු රුක්මන් සේනානායක මහතා
- ගරු එච්. නන්දසේන මහතා
- ගරු සිරිනාල් ද මෙල් මහතා
- ගරු රාජවරෝදියම් සම්බන්ධන් මහතා
- ගරු ඒ.ඒ. රෙජිනෝල්ඩ් පෙරේරා මහතා
- ගරු අයි.එම්. ඉල්යාස් මහතා
- ගරු ආර්. සම්බන්ධන් මැතිතුමා
- ගරු මාවෙයි එස්. සේනාධිරාජා මැතිතුමා
- ගරු ජේ.ආර්.පී. සූරියප්පෙරුම මැතිතුමා
- ගරු ඩොනල්ඩ් දිසානායක මැතිතුමා
- ගරු කෝසල නුවන් ජයවීර මැතිතුමා
- ගරු රාජවරෝදයම් සම්බන්ධන් මහතා
- ගරු ඒ. පිලපිටිය මහතා
- ගරු මාලනී ෆොන්සේකා මිය
- ගරු ඩබ්.බී. රණතුංග මැතිතුමා
- ගරු හීන්මහත්මයා ලියනගේ මැතිතුමා
- ගරු ඉන්ද්‍රදාස හෙට්ටිආරච්චි මැතිතුමා
- ගරු ආර්.එම්.ආර්. චූල බණ්ඩාර මැතිතුමා
- ගරු එම්.එච්. සේගු ඉසඩීන් මැතිතුමා
- ගරු ඩික්සන් ජේ පෙරේරා මැතිතුමා
- ගරු ඩබ්ලිව්.බී. ඒකනායක මහතා
- ගරු ගාමිණී ලොකුගේ මැතිතුමා
- ගරු ලොහාන් රත්වත්තේ මැතිතුමා
- ගරු පී. දයාරත්න මැතිතුමා
- ගරු ලකී ජයවර්ධන මහතා
- ගරු වයි.පී. පද්මසිරි මැතිතුමා
- ගරු (ආචාර්ය) මර්වින් ඩී. ද සිල්වා මැතිතුමා
- ගරු පී. දයාරත්න මැතිතුමා
- ගරු මාණිකවාසහර් කනගසබාපති ඊලවෙන්දන් මැතිතුමා

පනත් කෙටුම්පත්, නීති හා රෙගුලාසි සම්බන්ධව පර්යේෂණ කටයුතු සිදු කිරීම

ජාතික නීති සම්පාදන ක්‍රියාවලිය වඩාත් විධිමත් සහ ඵලදායී කිරීමේ අරමුණින්, රජය විසින් ගෙන එනු ලබන නව නීති සහ රෙගුලාසි පිළිබඳව පුළුල් පර්යේෂණ සිදු කිරීම විපක්ෂ නායක කාර්යාලයේ පර්යේෂණ අංශය විසින් 2025 වර්ෂය පුරාම අඛණ්ඩව සිදු කරන ලදී. ඒ අනුව, විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ අදාළ රාජ්‍ය ආයතන විසින් 2025 වර්ෂය තුළදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද පනත් කෙටුම්පත් 26ක් සම්බන්ධයෙන් ගැඹුරු විමර්ශනයක් සිදු කර විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ අවශ්‍යතා සඳහා ලබාදෙන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, අදාළ පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් කාරක සභා අවස්ථාවේදී ඉදිරිපත් කිරීම සඳහා විධිමත් සංශෝධන 01ක් විපක්ෂය විසින් සාර්ථකව සභාවට යොමු කරන ලදී.

2025 වර්ෂයේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ අදාළ පනත් කෙටුම්පත් (26) පිළිබඳ තොරතුරු පහත වගුවේ දැක්වේ.

පනත් කෙටුම්පතේ නම	පනතේ අංකය
පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන)	01/2025
දේශීය ආදායම් (සංශෝධන)	02/2025
2025 විසර්ජන පනත් කෙටුම්පත	03/2025
එකතු කළ අගය මත බදු (සංශෝධන)	04/2025
අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ	05/2025
විදේශීය ණය (ඉවත් කිරීමේ)	06/2025
අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන)	07/2025
ජාතික ගමනාගමන කොමිෂන් සභා (සංශෝධන)	08/2025
සේවකයන්ගේ අයවැය සහන දීමනා (සංශෝධන)	09/2025
සේවකයන්ගේ අයවැය සහන දීමනාව (සංශෝධන)	10/2025
සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන)	11/2025
සමාගම් (සංශෝධන)	12/2025
විනිමය පත්‍ර (සංශෝධන)	13/2025
ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන)	14/2025
සමෘද්ධි (සංශෝධන)	15/2025
රබර් පාලන (සංශෝධන)	16/2025
සූදු ක්‍රීඩා නියාමන අධිකාරිය	17/2025
ජනාධිපතිවරයන්ගේ හිමිකම් (ඉවත් කිරීමේ)	18/2025
ජාතික විගණන (සංශෝධන)	19/2025
ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය	20/2025

ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති (සංශෝධන)	21/2025
පෞද්ගලික දත්ත ආරක්ෂණ (සංශෝධන)	22/2025
2025 විසර්ජන පනත් කෙටුම්පත	23/2025
සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන)	24/2025
ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන)	25/2025
ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති (සංශෝධන)	26/2025

මීට අමතරව, (2025) වර්ෂය තුළදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ අතිවිශේෂ ගැසට් නිවේදන හරහා ප්‍රකාශයට පත් කරන ලද පනත් නියෝග සහ රෙගුලාසි 92ක් සම්බන්ධයෙන් විපක්ෂ නායක කාර්යාලය විසින් පුළුල් ලෙස පර්යේෂණ සිදු කර, ඊට අදාළ විස්තීරණ පසුබිම් වාර්තා 17ක් සාර්ථකව සකස් කරන ලදී. එකී නියෝග සහ රෙගුලාසිවලට අදාළ ගැසට් පත්‍ර අංක සහ ප්‍රකාශයට පත් කළ දිනයන් සහිත සවිස්තරාත්මක ලේඛනයක් පහතින් දැක්වේ.

නම	අංකය
ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නිවේදනය	2399/16 2024-08-26
ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය	2401/19 10-09-2024
රේගු (සංශෝධන) පනත යටතේ නියමය	2401/02 09-09-2024
ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි	2384/35 17-05-2024
ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි	2413/37 04-12-2024
විදේශ විනිමය පනත යටතේ නියමය	2389/08 08-06-2024
ගෙවීම් හා බේරුම් කිරීමේ පද්ධති පනත යටතේ නියෝග	2382/11 30-04-2024
කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත යටතේ නියෝග	2386/09 29-05-2024
වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනත යටතේ නියෝගය	2377/39 28-03-2024
කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභා පනත යටතේ නියෝග	2394/68 26-07-2024
විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය	2384/31 17-05-2024
විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය	2395/32 31-07-2024
විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය	2404/19 02-10-2024
විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය	2406/02 14-10-2024
විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය	2408/15 01-11-2024
විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය	2412/38 30-11-2024
සුබසාධක ප්‍රතිලාභ පනත යටතේ යෝජනා ක්‍රමය	2415/66 (21-12-2024

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියමය	2400/25 05-09-2024
විදේශ විනිමය පනත යටතේ නියමය	2415/56 19-12-2024
ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි	2415/35 18-12-2024
ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි	2416/11 24-12-2024
බුද්ධිමය දේපළ පනත යටතේ නියෝග	2407/04 22-10-2024
රක්ෂණ කර්මාන්ත විධිමත් කිරීමේ පනත යටතේ නියෝග	2415/79 22-12-2024
ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි	2421/04 27-01-2025
ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි	2421/44 (31-01-2025
සුරාබදු ආඥා පනත යටතේ නිවේදනය	2418/42 10-01-2025
නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය	2418/43 10-01-2025
රේගු (සංශෝධන) පනත යටතේ නියමය	2421/02 27-01-2025
මුදල් පනත යටතේ නියෝග	2411/56 22-11-2024
විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය	2417/20 2024-12-31
විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය	2421/03 27-01-2025
අපරාධ නඩු විධාන සංග්‍රහය පනත යටතේ නියමය	2418/28 08-01-2025
සුබසාධක ප්‍රතිලාභ පනත යටතේ යෝජනා ක්‍රමය	2429/02 24-03-2025
ආනයන හා ආපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි	2428/07 19-03-2025
මුදල් පනත යටතේ නියෝග	2421/30 31-01-2025
මුදල් පනත යටතේ නිවේදනය	2421/41 31-01-2025
නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමයි	2421/42 31-01-2025
රේගු (සංශෝධන) පනත යටතේ නියමය	2425/18 25-02-2025
දූෂණ විරෝධී පනත යටතේ නියෝග	2428/43 20-03-2025
මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) නියෝගය	2429/39 27-03-2025
ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි	2434/12 29-04-2025
ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි	2435/02 05-05-2025
ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත යටතේ නියෝග	2430/24 03-04-2025
විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යව පිළිගැනීම පනත යටතේ නියමය	2429/51 28-03-2025
ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි	2437/04 2025-05-19
ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත යටතේ නියෝග	2429/32 27-03-2025

දුම්කොළ බදු පනත යටතේ නියමය	2430/16 2025-04-01
තේ (අපනයන බදු සහ පාලන) පනත යටතේ නියෝග	2343/63 2023-08-05
අධිකරණ සංවිධාන පනත යටතේ නියෝග	2439/34 2025-07-04
රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ නියෝග	2443/14 2025-06-30
අධිකරණ සංවිධාන පනත යටතේ නියෝග	2440/27 2025-06-13
විදේශ විනිමය පනත යටතේ නියමය	2441/14 2025-06-18
ක්‍රීඩා පනත යටතේ නියෝග	2434/02 28-04-2025
නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය	2434/04 28-04-2025
මෝටර් වාහන මත සුඛෝපභෝගී බදු පනත යටතේ නියෝගය	2434/05 28-04-2025
රේගු ආඥා පනත යටතේ නියමය	2434/03 28-04-2025
ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත	2430/13 01-04-2025
රේගු (සංශෝධන) පනත යටතේ නියමය	2444/23 09-07-2025
ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි	2449/60 15-08-2025
අත්‍යවශ්‍ය මහජන සේවා පනත යටතේ ප්‍රකාශනය	2454/68 21-09-2025
ජාතික ඖෂධ නියාමන අධිකාරී පනත යටතේ නියෝග	2446/34 21-07-2025
විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය	2451/10 25-08-2025
මත්පැන් නිෂ්පාදනය මත බදු ගෙවීමේ කාලසීමාව සහ අධිභාරය අය කිරීම සම්බන්ධයෙන් පනවන ලද රීති	05-09-2025
කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභා පනත යටතේ නියමය	2445/02 14-07-2025
කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභා පනත යටතේ නියමය	2445/03 14-07-2025
කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභා පනත යටතේ නියමය	2445/04 14-07-2025
කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභා පනත යටතේ නියමය	2445/05 14-07-2025
කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභා පනත යටතේ නියෝග	2454/62 (20-09-2025
විදුලිබල පනත යටතේ නියෝග	2451/11 26-08-2025
සුරාබදු ආඥා පනත යටතේ නිවේදනය	04-10-2025
මුදල් පනත යටතේ නියෝගය	2430/14 01-04-2025
ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි	2458/43 15-10-2025
සිවිල් ගුවන් සේවා පනත යටතේ නියෝග	2422/38 06-02-2025
සිවිල් ගුවන් සේවා පනත යටතේ නියෝග	2422/39 06-02-2025
ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි	2459/46) 24-10-2025

⬢	රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ නියෝග	2459/52 24-10-2025
⬢	විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය	2457/05 09-10-2025
⬢	රේගු ආඥා පනත යටතේ යෝජනා සම්මතය	2457/06 09-10-2025
⬢	රේගු ආඥා පනත යටතේ තීරුබදු සම්බන්ධ යෝජනා සම්මතය	2461/40 07-11-2025
⬢	එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත යටතේ නියෝග	2461/43 07-11-2025
⬢	වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන පදු පනත යටතේ නියෝගය	2461/44 07-11-2025
⬢	ජාතික ඖෂධ නියාමන අධිකාරී පනත යටතේ නියෝග	2452/39 04-09-2025
⬢	එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත යටතේ නියෝග	2460/44 03-10-2025
⬢	අත්‍යවශ්‍ය මහජන සේවා පනත යටතේ ප්‍රකාශනය	2464/29 28-11-2025
⬢	මහජන ආරක්ෂක ආඥා පනත යටතේ යෝජනා සම්මතය	
⬢	මෝටර් වාහන පනත යටතේ නියෝගය	2455/29 25-09-2025
⬢	ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග	2371/35 15-02-2025
⬢	ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ පනත යටතේ නියෝග	2428/13 19-03-2025
⬢	සාජ්පු සහ කාර්යාලීය සේවකයන් පිළිබඳ පනතේ නියෝගය	12-12-2025
⬢	ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි	2465/07 (01-12-2025

අයවැය විවාදයන්

ජාතික ආර්ථිකය කළමනාකරණය කිරීම සහ රජයේ මූල්‍ය ප්‍රතිපත්ති විධිමත්ව විශ්ලේෂණය කිරීමේ අරමුණින්, 2025 වර්ෂය තුළදී සුවිශේෂී ලෙස ප්‍රධාන අයවැය විවාදයන් දෙකක් 02 පාර්ලිමේන්තුවේදී පවත්වන ලදී.

2024-11-21 දින අහිනව පාර්ලිමේන්තුව රැස් වූ නමුත්, 2025 වර්ෂය සඳහා වන විසර්ජන පනත් කෙටුම්පත සම්මත කර ගැනීමට අදාළව ව්‍යවස්ථාපිතව නියම වී ඇති පියවරයන් අනුගමනය කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් නොපවතින බැවින් 2025 වර්ෂයේ කාර්යයන් සහ ණය සේවාකරණය අඛණ්ඩව කරගෙන යාම සඳහා අතුරු සම්මත ගිණුම සකස් කර ඉදිරිපත් විය. පසුව නැවත 2025 වර්ෂය සඳහාම විසර්ජන ගිණුම 2025 අප්‍රේල් මස ඉදිරිපත් විය. එසේම 2026 වර්ෂය සඳහා ද විසර්ජන පනත් කෙටුම්පත් 2025 වර්ෂයේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

මෙහිදි පහත කටයුතු සිදුකරන ලදී.

- කාරක සහා අවස්ථාවේ විවාදයට අවශ්‍ය වැඩසටහන සකස් කර පාර්ලිමේන්තුවට සහ සියලුම අමාත්‍යාංශ වෙත යොමු කිරීම.
- විපක්ෂයේ මන්ත්‍රීවරුන් වෙනුවෙන් පවත්වන ලද පූර්ව අයවැය වැඩමුළුව අයවැයට පෙර විපක්ෂයේ මන්ත්‍රීන් දැනුවත් කිරීම සඳහා එක් දින වැඩමුළුවක් පැවැත්වීම.
- ඒ සඳහා සම්පත් දායකකයින් ලෙස ඇඩ්වොකාටා ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී ධනනාත් මහතා, වෙරිටේ රිසර්ච් ආයතනයේ ආර්ථික විශේෂඥ අනුෂන් කපිලන් මහතා සහ ශෙලොම් ලියනගේ මිය, ආචාර්ය සංජන හත්තොටුව,මහාචාර්ය සිරිමල් අබේරත්න, මහාචාර්ය අර්ජුන පරාක්‍රම ආදි විද්වතුන් සම්පත් දායකත්වය ලබා දෙන ලදී.
- අයවැය කතාවට පසු දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්විය.
- කමිටු අවස්ථාවේ විවාදවලට සුදානම් කිරීම සඳහා කාරක සහා විවාදයට පෙර අමාත්‍යාංශ අනුව වෙන වෙනම දැනුවත් වීමේ උපදේශන සැසි වෘත්තිකයන්, සමාජ ක්‍රියාකරුවන් සහ පර්යේක්ෂකයන් සමග සිදු කරන ලදී.


සහා ගර්භය තුළ කටික කාලය පිළිබඳ ප්‍රගතිය

කාලීන පොදු වැදගත්කමකින් යුත් ස්ථාවර නියෝග 27(2) ප්‍රශ්න, අග්‍රාමාත්‍යතුමියගෙන් අසන ලද ප්‍රශ්න, වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න, කල් තැබීමේ ප්‍රශ්න, කල් තැබීමේ යෝජනා හරහා රටේ වත්මන් තත්වයන් පිළිබඳ පාර්ලිමේන්තුවේ අවධානය යොමුකිරීමට අමතරව විපක්ෂයේ ගරු මන්ත්‍රීවරු විවාද සඳහා සක්‍රීයව සම්බන්ධවීම හරහා ව්‍යවස්ථාදායකයේ කාර්යයන් සඳහා සිය සහයෝගය ලබා දේ.

එහි දී ප්‍රධාන විවාදවලට අමතරව පූර්ණ කල් තැබීමේ යෝජනා සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ දායකත්වය පක්ෂ අනුව දක්වා ඇත. පාර්ලිමේන්තුවේ ප්‍රධාන විවාද සහ පූර්ණ කල්තැබීමේ විවාද සඳහා කථා කාලය වෙන් කිරීමේදී ආණ්ඩු පක්ෂය වෙනුවෙන් 60%ක් ද විපක්ෂය වෙනුවෙන් 40%ක් ද වශයෙන් වෙන් වේ. අයවැය කාරක සහා අවස්ථාවේ විවාද සඳහා පමණක් ආණ්ඩු පක්ෂය වෙනුවෙන් 40%ක් ද විපක්ෂය වෙනුවෙන් 60%ක් ද හිමිවේ. මෙම කාලය වෙන් කිරීමට විපක්ෂයට ලැබෙන මිනිත්තු ගණන පක්ෂ අනුව අනුපාතිකව බෙදනු ලැබේ. එසේ අනුපාතිකව බෙදීමේ දී සලකා බලනු ලබන ගණිත සමීකරණය වන්නේ ඒ එක් එක් පක්ෂය වෙනුවෙන් නියෝජනය වෙන ගරු මන්ත්‍රීවරු ප්‍රමාණයයි.

ඒ අනුව ප්‍රධාන විවාද සහ පූර්ණ කල් තැබීමේ යෝජනා සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ දායකත්වය පක්ෂ අනුව දක්වා ඇත.

දේශපාලන පක්ෂය සහ ලබාගත් කතා කාලයන් ප්‍රතිශත ලෙස



සමගි ජන බලවේගය	52.19%
ඉලංකයි තමිල් අරසු කච්චි	11.90%
නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ	9.52%
ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ	5.85%
ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය	7.79%
සර්වජන බලය	1.95%
එක්සත් ජාතික පක්ෂය	1.08%
ප්‍රජාතන්ත්‍රවාදී දේමළි ජාතික සන්ධානය	2.05%
සමස්ත ලංකා දේමළ කොංග්‍රසය	3.26%
සමස්ත ලංකා මක්කල් කොංග්‍රසය	1.91%
ස්වාධීන කණ්ඩායම 17	1.13%
ශ්‍රී ලංකා කම්කරු පක්ෂය	1.37%

පරිපාලන සහ මූල්‍ය කාර්ය සාධනය



පරිපාලන අංශයේ කාර්ය සාධනය

කාර්ය මණ්ඩල පුහුණුව

ආයතනික ඵලදායීතාව ඉහළ නැංවීමේ අරමුණින් 2025 වර්ෂය තුළදී කාර්ය මණ්ඩලය සඳහා දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් රැසක් සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකා ශාන්ත ජෝන් ගිලන් සේවය මඟින් නිලධාරීන් 24 දෙනෙකු සඳහා දින 04ක ප්‍රථමාධාර පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. නිපුණතා සංවර්ධන අරමුදල හරහා රියදුරන් සහ කාර්යාල කාර්ය සහායකයින් 15 දෙනෙකු සඳහා විනය හා කාර්යාලීය ආචාර විධි පිළිබඳ පුහුණුවක් ලබා දෙන ලදී. මීට සමගාමීව, ඵලදායීතා ප්‍රවර්ධනය ඉලක්ක කරගනිමින් කාර්ය මණ්ඩල 50 දෙනෙකු සඳහා 'දිරිය කාන්තා' වැඩසටහන පවත්වන ලදී. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ කළුතර මධ්‍යම අභ්‍යාස විද්‍යාලයේදී රියදුරන් 06 දෙනෙකු සඳහා බර වාහන ප්‍රවීණතා පුහුණුවක් ද, තවත් රියදුරන් 05 දෙනෙකු සඳහා මගී ප්‍රවාහන රියදුරු බලපත්‍ර පුහුණු පාඨමාලාවක් ද ක්‍රියාත්මක කරන ලදී.

එසේම, ආයතනික නිලධාරීන්ගේ වෘත්තීය සංවර්ධනය උදෙසා ශ්‍රම අධ්‍යයන ආයතනයේ රාජ්‍ය ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ වසරක ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා ඩබ්.ඒ.පී.එස්. වික්‍රමසිංහ මහතා යොමු කරන ලදී. මුද්‍රණ දෙපාර්තමේන්තුවේ පොත් බැඳුම්කරණ පාඨමාලාවක් සඳහා සිවරාජා රජීවන් මහතා යොමු කරන ලදී. විදේශ පුහුණු යටතේ, ඉන්දියාවේ නවදිල්ලි නුවර පැවති 37 වැනි අන්තර් පාර්ලිමේන්තු වැඩසටහන සඳහා ඩී.එම්.ඒ.එස්. රත්නායක මහත්මිය සහභාගී විය.

ප්‍රායෝගික පුහුණුව සහ පුරප්පාඩු පිරවීම

කාර්යාලයේ පැවති පුරප්පාඩු සම්පූර්ණ කරමින් සහකාර ලේකම්වරයෙකු, කළමනාකරණ සේවා නිලධාරීන් සිව්දෙනෙකු සහ කාර්යාල සේවක සේවයේ එක් නිලධාරියෙකු වශයෙන් නව නිලධාරීන් 06 දෙනෙකු 2025 වර්ෂයේදී සේවයට බඳවා ගන්නා ලදී. තවද, 2025 වර්ෂය තුළදී විවිධ වෘත්තීය පුහුණු ආයතන නියෝජනය කළ අභ්‍යාසලාභීන් පස් දෙනෙකු (05) සඳහා ප්‍රායෝගික පුහුණු අවස්ථා ලබා දීමට කාර්යාලය කටයුතු කළේය. ලලිත් ඇතුලත්මුදලි වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, හෝමාගම කාර්මික විද්‍යාලය, ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය සහ ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) යන ආයතනවලින් මෙම අභ්‍යාසලාභීන් යොමු කර තිබිණි.



ප්‍රසම්පාදන කාර්ය සාධනය

විපක්ෂ නායක කාර්යාලය විසින් 2024 නව ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුගතව ප්‍රසම්පාදන ඒකකයක් ස්ථාපනය කළ අතර ආයතනයේ එදිනෙදා මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා 2025 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මට අනුව කාර්යයන් රැසක් ඉටු කරන ලදී. කාර්යාලීය ලිපිද්‍රව්‍ය සහ අනෙකුත් අවශ්‍යතා සපුරාලීම, වාහන නඩත්තුව, යන්ත්‍රෝපකරණ නඩත්තුව සහ කාර්යාලයීය පිරිසිදු කිරීමේ සේවා ලබාගැනීම ඒ අතර ප්‍රධාන විය. මීට අමතරව අංක 30 දරන කාර්යාලයේ වර්ණාලේප කිරීම සහ කොටස් කිරීමේ(Partition) කටයුතු මෙන්ම, අවශ්‍ය ගෘහභාණ්ඩ, පරිගණක, ලැප්ටොප් සහ වායු සමීකරණ යන්ත්‍ර මිලදී ගැනීම්ද සාර්ථකව සම්පූර්ණ කරන ලදී.

ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන

ආයතනික ඵලදායිතාව ඉහළ නැංවීම සහ කාර්යාලීය පරිසරය වඩාත් කාර්යක්ෂම හා සංවිධානාත්මක මට්ටමකට ගෙනයාමේ අරමුණින් රජය විසින් ජාතික මට්ටමින් ප්‍රවර්ධනය කරනු ලබන සෙයිරි සංකල්පය ක්‍රියාත්මක කරමින් සෙයිරි සතිය 2025 වර්ෂය තුළදී සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. ඒ හරහා අනවශ්‍ය ද්‍රව්‍ය හා ලිපිගොනු වෙන් කිරීම, කාර්යාල අවකාශය සංවිධානය කිරීම සහ නිලධාරීන් අතර ඵලදායී කාර්යාල සංස්කෘතියක් ඇති කිරීම ප්‍රවර්ධනය කරන ලදී. ඊට සමගාමීව, ශ්‍රී ලංකා පාර්ලිමේන්තු ඉතිහාසයේ ප්‍රථම වතාවට විපක්ෂ නායක කාර්යාලයක් නියෝජනය කරමින් 2025/2026 ජාතික ඵලදායිතා සම්මාන තරඟය සඳහා අයදුම් කිරීම ද සිදු කරන ලදී. එමෙන්ම, නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු යාවත්කාලීන නොවීම හේතුවෙන් ඇතිවිය හැකි පරිපාලන ගැටලු හඳුනාගෙන ඒවා නිරාකරණය කිරීමේ අරමුණින් පෞද්ගලික ලිපිගොනු සතිය ක්‍රියාත්මක කරන ලදී. මෙම සතිය තුළදී නිලධාරීන්ගේ ලිපිගොනුවල පවතින අඩුපාඩු හඳුනාගෙන ඒවා සම්පූර්ණ කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලද අතර, ලිපිගොනු කළමනාකරණය වඩාත් විධිමත් හා සංවිධානාත්මක ලෙස සිදු කිරීමට කාර්ය මණ්ඩලය දිරිමත් කරන ලදී.

මූල්‍ය අංශයේ කාර්යසාධනය

ගිණුම් පාලනය සහ වාර්තාකරණය

ආයතනයේ මූල්‍ය විනය මැනවින් පිළිබිඹු කරමින්, අභ්‍යන්තර සහ බාහිර මූල්‍ය පාලන ක්‍රියාමාර්ග ඔස්සේ ගිණුම් අංශය ඉතා ශක්තිමත්ව පවත්වාගෙන යන ලදී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් අබණ්ඩව තුන්වන වරටත් විපක්ෂ නායක කාර්යාලයේ මූල්‍ය තත්වය සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගෙන් යහපත් මතයක් ලබා ගැනීමට හැකි වීම සුවිශේෂී ජයග්‍රහණයක් විය.

2025 වර්ෂය තුළදී මූල්‍ය අංශය විසින් මාසික අග්‍රිම සැසඳුම් ප්‍රකාශ 12ක් සකස් කර ඉදිරිපත් කරන ලදී. විපක්ෂ නායක කාර්යාලය සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුව නියමිත කාල සීමාව තුළ සකස් කර නිම කෙරිණි. CIGAS සහ ITMIS පද්ධති හරහා ලෙජර වාර්තා නිසි පරිදි පවත්වාගෙන ගිය අතර, දෛනික ගනුදෙනු සැසඳීම් වාර්තා 200ක් පමණද, වාර්ෂිකව ගිණුම් සාරාංශ 12ක්ද, සකස් කර මහා භාණ්ඩාගාරය වෙත යොමු කරන ලදී. තවද, දෙපාර්තමේන්තු පොත් සහ භාණ්ඩාගාර ගිණුම් සැසඳීම සඳහා ප්‍රකාශ 12ක් ද, මාසික බැංකු සැසඳුම් ප්‍රකාශ 12ක් ද, සකස් කොට විගණන විමසුම් සඳහා නිසි පිළිතුරු සැපයීමට කටයුතු කෙරිණි.

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ සහ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශයන්ට අනුකූලව 2025 ගිණුම් වසා දැමීමේ කටයුතු සාර්ථකව සිදු කරන ලදී. රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්වලට අදාළව මාසික සැසඳුම් ප්‍රකාශ 12ක් සහ කාර්තුමය සැසඳුම් ප්‍රකාශ 04ක් සකස් කළ අතර, පොදු තැන්පතු ගිණුමට අදාළව මාසික වාර්තා 12ක් සහ කාර්තුමය වාර්තා 04ක් ද සකස් කෙරිණි. මුදල් රෙගුලාසිවලට අනුකූලව පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කාර්යාලයේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අරමුදල් නියමිත වේලාවට සපයා දීමට ගිණුම් අංශය පියවර ගත්තේය. කාර්ය මණ්ඩලයේ මාසික වැටුප් ගෙවීම් මෙන්ම, අරමුදල් කළමනාකරණය හරහා පාර්ලිමේන්තු සහ අංක 30 කාර්යාලය වෙත අවශ්‍ය වට්ටෝරු භාණ්ඩ, කාර්යාල උපකරණ හා ලිපිද්‍රව්‍ය ප්‍රමාදයකින් තොරව සැපයීම ද අබණ්ඩව සිදු කරන ලදී.



ප්‍රධාන වැය විෂයය	2024 අයවැය ප්‍රතිපාදන (රු.)	2025 අයවැය ප්‍රතිපාදන (රු.)	වෙනස (රු.)
පුනරාවර්තන වියදම්	270,000,000	321,050,000	51,050,000
පුද්ගල පඩිනඩි	143,000,000	179,500,000	36,500,000
ගමන් වියදම්	4,000,000	4,000,000	-
සැපයීම්	66,300,000	71,000,000	4,700,000
නඩත්තු වියදම්	20,000,000	30,000,000	10,000,000
සේවා	36,200,000	36,050,000	150,000
මාරු කිරීම්	500,000	500,000	-
මූලධන වියදම්	16,000,000	9,950,000	6,050,000
මූලධන වත්කම් පුනරුත්ථාපනය	4,500,000	4,500,000	-
මූලධන වත්කම් අත්පත් කර ගැනීම	10,800,000	4,750,000	6,050,000
හැකියා වර්ධනය	700,000	700,000	-
මුළු වියදම (Total)	286,000,000	331,000,000	45,000,000

අභ්‍යන්තර විගණන අංශයේ කාර්ය සාධනය

ආයතනයට අත්‍යවශ්‍ය වූ අභ්‍යන්තර විගණන කාර්යය නෛතික පදනමක් මත ස්ථාපිත කිරීම සඳහා (2025) වර්ෂය තුළදී අභ්‍යන්තර විගණක ඒකකයක් පිහිටුවා අභ්‍යන්තර විගණකවරයෙකු සහ කළමනාකරණ සේවා නිලධාරියෙකු පත් කරන ලදී. ඒ අනුව, ආයතනික මූල්‍ය විනය හා වගවීම තහවුරු කිරීමේ අරමුණින් වාර්ෂික විගණන සැලසුමක් සකස් කරන ලද අතර, විගණන කළමනාකරණ කමිටු රැස්වීම් දෙකක් ද, සාර්ථකව පවත්වන ලදී. මීට අමතරව, ආයතනයේ මාණ්ඩලික නිලධාරීන්ගේ සක්‍රීය සහභාගිත්වයෙන් අභ්‍යන්තර විගණන කමිටු රැස්වීම් 05ක් පවත්වන ලද අතර, ඒ හරහා ආයතනික කටයුතු වඩාත් විනිවිදභාවයෙන්, අභ්‍යන්තර පාලන ක්‍රමවේද ඇතුළත්ව හා කාර්යක්ෂමව සිදු කිරීමට හැකියාව ලැබිණි.

අභ්‍යන්තර කටයුතු ඒකකයේ කාර්ය සාධනය

ආයතනික කටයුතුවල විනිවිදභාවය හා සේවකයන්ගේ යහපැවැත්ම තහවුරු කිරීමේ අරමුණින් PS/SB/Circular /02/(2025)) චක්‍රලේඛය යටතේ (2025.07.01) දින සිට අභ්‍යන්තර කටයුතු ඒකකය නිල වශයෙන් ස්ථාපිත කරන ලද අතර, එහි කාර්යභාරය ලෙස සේවකයන්ගේ දුක් ගැනවිලි, පැමිණිලි සහ යෝජනා කාර්යක්ෂමව, ස්වාධීනව හා රහස්‍යභාවය රකිමින් ලබාගෙන සලකා බලනු ලැබේ. ඒ සඳහා කාර්යාලය තුළ Suggestion/Complaint Box ස්ථාපිත කර ඇති අතර, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම දුක් ගැනවිලි හා යෝජනා ඉදිරිපත් කිරීමේ අවස්ථාව සේවකයන්ට සලසා දී ඇත. 2025 ජූලි සිට දෙසැම්බර් දක්වා කාල සීමාව තුළදී ලැබුණු සේවකයන්ගේ දුක් ගැනවිලි 06ක් සොයා බලා ඒ සියල්ල සාර්ථකව විසඳා ගැනීමට කටයුතු කරන ලදී. එකී කාල සීමාව සඳහා ලැබුණු දුක් ගැනවිලිවල ස්වභාවය, ගනු ලැබූ පියවර, ප්‍රතිඵල සහ අනාගත නිර්දේශ ඇතුළත් වාර්ෂික වාර්තාවක් සකස් කර ප්‍රකාශනය කරන ලදී. ඉදිරි කාලය තුළ දුක් ගැනවිලිවල ලේඛනගතකරණය ඩිජිටල් ක්‍රමවේදයකට යාවත්කාලීන කිරීම, විධිමත් ලේඛනගත ක්‍රමවේදයක් (SOP) ස්ථාපිත කිරීම සහ සේවකයන් දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම ඉලක්ක කොටගෙන ඇත.

ඒඑපී-එෆ්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025 රු.		සටහන	කණ්ඩායම 2025 රු.	2024 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒඑපී-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		294,329,000	257,900,000	ඒඑපී-3
-	තැන්පතු		731,690	46,631	ඒඑපී-4
-	අන්තිකාරම් ගිණුම්		3,674,915	4,581,552	ඒඑපී-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		298,735,605	262,528,183	
	මුළු ආදායම් ලැබීම් සහ ආදායම්				
-	නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		298,735,605	262,528,183	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		-	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම්				
	නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		298,735,605	262,528,183	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	
179,500,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	173,113,492	132,362,907	
139,780,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	113,664,742	115,593,945	ඒඑපී-2(II)
500,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	151,904	157,464	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
319,780,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		286,930,138	248,114,316	
	මූලධන වියදම්				
4,500,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	3,823,422	3,257,470	
6,020,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	5,951,599	8,592,456	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒඑපී-2(II)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
700,000	හැකියා වර්ධනය	14	474,120	699,796	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
11,220,000	මුළු මූලධන වියදම් (උ)		10,249,141	12,549,722	
	තැන්පතු ගෙවීම්		418,426	46,631	ඒඑපී-4
	අන්තිකාරම් ගෙවීම්		4,775,806	3,995,540	ඒඑපී-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		5,194,232	4,042,171	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		302,373,511	264,706,208	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(3,637,906)	(2,178,025)	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(3,637,906)	(2,178,025)	ඒඑපී-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		0	-	ඒඑපී-3
			0	-	

2025.12.31 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පි

2025 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තක්සා 2025 රු.	2024 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	407,369,577	401,880,591
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	8,061,450	6,960,559
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**415,431,027**	**408,841,150**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		7,625,370	6,837,743
දේපළ පිරියත හා උපකරණ සංචිතය		407,369,577	401,880,591
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(කි)	-	
ප්‍රංගම වගකීම්			
නැන්පතු ගිණුම්	ඒසිඒ-4	436,080	122,816
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		415,431,027	**408,841,150**

පිටු අංක 07 සිට 30 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 31 සිට 54 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත.** ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට පදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යවස්ථාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම : සුරංග රණසිංහ	නම : සුරංග රණසිංහ	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර : විපක්ෂ නායක ලේකම්	තනතුර : විපක්ෂ නායක කාර්යාලය	නම :
දිනය :	දිනය : ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව ශ්‍රී ජයවර්ධනපුර - කෝට්ටේ	දිනය : ගණකාධිකාරි විපක්ෂ නායක කාර්යාලය ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව ශ්‍රී ජයවර්ධනපුර. කෝට්ටේ
2026.02.27	2026.02.27	

එසිඒ-සී

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	කණ්ඩායම	
	2025 රු.	සංශෝධිත 2024 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	2,914,473	2,064,516
වෙනත් ආදායම් ශීර්ෂ වෙතුවෙන් එකතු කරන ලද ආදායම්	-	-
අග්‍රිම් ලැබීම්	294,329,000	257,900,000
අත්තිකාරම් අයකර ගැනීම්	4,289,648	4,288,262
තැන්පතු ලැබීම්	731,690	46,630
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	302,264,811	264,299,408
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනිඩි හා මෙහෙයුම් වියදම්	286,669,534	247,771,152
සහනාධාර සහ මාරුකිරීම්	151,904	157,464
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්, මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම්	10,249,141	12,549,722
වෙනත් වැය ශීර්ෂ වෙතුවෙන් දරන ලද වියදම්	-	-
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම්	-	-
අත්තිකාරම් ගෙවීම්	4,775,806	3,774,440
තැන්පතු ගෙවීම්	418,426	46,630
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	302,264,811	264,299,408
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	0	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
නිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	0	0
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	-	-
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	0	0
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	0	0
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	0	0
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	0	0

ඒසිඒ-ඩී

වාර්තා කරන ආයතනය සඳහා අදාළ ආකෘතීන් සහ ඇමුණුම් විස්තරය

අනු අංකය	ආකෘති අංක	ආකෘතියේ නම	අදාළ	අදාළ නොවන	අදාළ ආකෘතියේ / ඇමුණුමේ පිටු අංකය
1	ඒසිඒ-1	2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය		√	
2	ඒසිඒ-1(i)	2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිහි ආදායම් පිළිබඳ ප්‍රකාශනය		√	
3	ඒසිඒ-1(ii)	මූලික ආදායම් ඇස්තමේන්තුව සහ සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව අතර විචලතා පැහැදිලි කිරීම		√	
4	ඒසිඒ-1(iii)	සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව සහ සත්‍ය ආදායම් අතර විචලතා පැහැදිලි කිරීම		√	
5	ඒසිඒ-2	2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන් අනුව වියදම් සාරාංශය	√		7
6	ඒසිඒ-2(ඒ)	2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන් අනුව වියදම් සාරාංශය (ජාතික අයවැය දෙපාර්තමේන්තුව සඳහා පමණයි)		√	
7	ඒසිඒ-2(ඒ)(i)	විසර්ජන පනතේ 6 වන වගන්තිය අනුව වෙනත් වැය ශීර්ෂ වෙත ප්‍රතාරාවර්තන වියදම් වෙනුවෙන් අතිරේක ප්‍රතිපාදන නිකුත් කිරීම් සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වහකීම් වැය විෂයය යටතේ වෙන් කරන ලද මුළු ඉද්ධි ප්‍රතිපාදන හා එසේ නිකුත් කරන ලද ප්‍රතිපාදන අතර වෙනස පැහැදිලි කිරීම (ජාතික අයවැය දෙපාර්තමේන්තුව සඳහා පමණයි)		√	
8	ඒසිඒ-2(ඒ)(ii)	වර්ෂය තුළ වෙනත් වියදම් ශීර්ෂ වෙත ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වහකීම් වැය විෂයය යටතේ නිකුත් කරන ලද ප්‍රතිපාදන - ප්‍රතාරාවර්තන වියදම් (ජාතික අයවැය දෙපාර්තමේන්තුව සඳහා පමණයි)		√	
9	ඒසිඒ-2(ඒ)(iii)	විසර්ජන පනතේ 6 වන වගන්තිය අනුව වෙනත් වැය ශීර්ෂ වෙත මූලධන වියදම් සඳහා අතිරේක ප්‍රතිපාදන නිකුත් කිරීම් වෙනුවෙන් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වහකීම් වැය විෂයය යටතේ වෙන් කරන ලද මුළු ඉද්ධි ප්‍රතිපාදන හා එසේ නිකුත් කරන ලද ප්‍රතිපාදන අතර වෙනස පැහැදිලි කිරීම (ජාතික අයවැය දෙපාර්තමේන්තුව සඳහා පමණයි)		√	
10	ඒසිඒ-2(ඒ)(iv)	වර්ෂය තුළ වෙනත් වියදම් ශීර්ෂ වෙත ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වහකීම් වැය විෂයය යටතේ නිකුත් කරන ලද ප්‍රතිපාදන - මූලධන වියදම් (ජාතික අයවැය දෙපාර්තමේන්තුව සඳහා පමණයි)		√	
11	ඒසිඒ-2(i)	වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශනය	√		8-10
12	ඒසිඒ-2(ii)	2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශනය	√		11-16
13	ඒසිඒ-2(iii)	මූලික සහ සංශෝධිත වියදම් ඇස්තමේන්තුව අතර විචලතාව පැහැදිලි කිරීම	√		17-23
14	ඒසිඒ-2(iv)	වැඩසටහන් අනුව වියදම් මූල්‍යකරණ සාරාංශය	√		24
15	ඒසිඒ-2(v)	එක් එක් වැඩසටහන් යටතේ ව්‍යාපෘති අනුව වියදම් මූල්‍යකරණය	√		25
16	ඒසිඒ-3	2025 වර්ෂය සඳහා අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශනය	√		26

ඒසිඒ-ඩී

වාර්තා කරන ආයතනය සඳහා අදාළ ආකෘතීන් සහ ඇමුණුම් විස්තරය

අනු අංකය	ආකෘතේ අංක	ආකෘතියේ නම	අදාළ	අදාළ නොවන	අදාළ ආකෘතියේ / ඇමුණුමේ පිටු අංකය
17	ඒසිඒ-4	2025 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම් පිළිබඳ ප්‍රකාශනය	√		27
18	ඒසිඒ-5	2025 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ගිණුම් පිළිබඳ ප්‍රකාශනය	√		28
19	ඒසිඒ-5(ඒ)	2025 දෙසැම්බර් 31 දිනට කුලී හා වැඩ අත්තිකාරම් ගිණුම් පිළිබඳ ප්‍රකාශනය		√	
20	ඒසිඒ-5(බී)	2025 දෙසැම්බර් 31 දිනට කුලී හා වැඩ අත්තිකාරම් සංචිත ගිණුම් පිළිබඳ ප්‍රකාශනය		√	
21	ඒසිඒ-6	මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනය - 2025	√		29
22	ඒසිඒ-7	අග්‍රිම සැසඳුම් ප්‍රකාශනය	√		30
23	ඇමුණුම් -(i)	පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය (මු.රෙ. 106 හා මු.රෙ. 113 යටතේ වන පාඩු)	√		31
24	ඇමුණුම්-(ii)	පොත්වලින් කපාහැරීම් පිළිබඳ ප්‍රකාශනය (වර්ෂය තුළ සිදුවූ මු.රෙ.109 යටතේ වන පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය සහ වර්ෂය තුළ මු.රෙ. 109 යටතේ වන පොතෙන් කපා හැරීම් හා අයකර ගැනීම් පිළිබඳ ප්‍රකාශනය)	√		32
25	ඇමුණුම්-(iii)	දෙසැම්බර් 31 දිනට බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනය	√		33
26	ඇමුණුම්-(iv)	බැරකම් පිළිබඳ ප්‍රකාශනය - (i) මු.රෙ.94 (2) සහ (3) ප්‍රකාරව බැරකම්වලට එළඹෙන ලද බැඳීම් ප්‍රකාශනය	√		34
27	ඇමුණුම්-(v)	බැරකම් පිළිබඳ ප්‍රකාශනය - (ii) මු.රෙ.215 (3) (ආ) සහ (ඇ) ප්‍රකාරව තැන්පත් ගිණුම්ට මාරු කරන ලද ප්‍රතිපාදන		√	
28	ඇමුණුම්-(vi)	ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාරවලට අදාළ හිමිකම් පිළිබඳ ප්‍රකාශනය		√	
29	ඇමුණුම්-(vii)	අස්ථානගත වටුවර් පිළිබඳ ප්‍රකාශනය	√		35
30	ඇමුණුම්-(viii)	2015/10/23 දින නිකුත් කරන ලද භාණ්ඩාගාර මෙහෙයුම් වක්‍රලේඛ අංක 2015/03 හි උපදෙස්වලට අනුකූලව ආරම්භ කරන ලද බැංකු ගිණුම් පිළිබඳ 2025.12.31 දිනට තත්ත්ව වාර්තාව	√		36
31	ඇමුණුම් - ix	CIGAS ඩෙස්ක්ටොප් යෙදුම මඟින් උත්පාදනය කරන ලද ශේෂ පිරික්සුම් සහ නව CIGAS වෙබ් යෙදුම් පද්ධතිය මඟින් ලබාගත් අවසාන භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන	√		37-54

*සටහන - අදාළ ආකෘති පමණක් ගිණුම් සමඟ අමුණා ඇත

එන්. ඩී. ජයසිංහ
ගණකාධිකාරී
විපක්ෂ නායක කාර්යාලය
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමිසාරිස් (මුදල්)
දිනය : 2026-02-27

ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

ආදායම් කේතය	ආදායම් කේත විස්තරය	අය ඇස්තමේන්තුව		රැස්කළ ආදායම	
		ආරම්භක	අවසන්	මුදල (රු)	අවසන් ආදායම් ඇස්තමේන්තුවේ (%) ක් වශයෙන්
අදාළ නැත					

වෙන් කළ මුදල් උපයෝජනයට අදාළ කාර්ය සාධනය

වෙන් කළ මුදල් වර්ගය	වෙන් කළ මුදල		සැබෑ වියදම	වෙන්කළ මුදල් උපයෝජනය වෙන්කළ අවසන් මුදලේ (%) වශයෙන්
	ආරම්භක	අවසන්		
පුනරාවර්තන	321,050,000	319,780,000	286,930,316	90%
ප්‍රාග්ධන	9,950,000	11,220,000	10,249,141	91%

වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතායතනයක් වශයෙන් මෙම දෙපාර්තමේන්තුව/දිසා ලේකම් කාර්යාලය/ පළාත් සභාව වෙත වියදම් සඳහා මු.රෙ. (208) ලබාදුන් මුදල

අනු අංකය	මුදල් ලැබුණේ කවර අමාත්‍යාංශයකින්/ දෙපාර්තමේන්තුවකින්ද යන වග	වෙන් කිරීමේ අරමුණ	වෙන් කළ මුදල		සැබෑ වියදම	වෙන්කළ මුදල් උපයෝජනය වෙන්කළ අවසන් මුදලේ (%) වශයෙන්
			ආරම්භක	අවසන්		
ශූන්‍ය						

මූල්‍යමය නොවන වත්කම් වාර්තාකරණ කාර්ය සාධනය ප්‍රතිපාදන

වත්කකම් කේතය	කේත විස්තරය	2025.12.31 දිනට සමීක්ෂණ මණ්ඩල වාර්තාව ප්‍රකාර ශේෂය රු	2025.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව ප්‍රකාර ශේෂය රු	ගිණුම්ගත කළ යුතුව පවත්නා	වාර්තාකරණ ප්‍රගතිය (%) ලෙස
9151	ගොඩනැගිලි හා ඉදිකිරීම්	39,726,000.00	39,726,000.00		100%
9152	යන්ත්‍ර සූත්‍ර හා උපකරණ	158,363,576.97	158,363,576.42		100%
9153	ඉඩම්	206,340,000.00	206,340,000.00		100%
9154	අස්පෘශ්‍ය වත්කම්	2,940,000	2,940,000		100%

අංකය	අදාළ අවශ්‍යතාව	අනුකූලතා මට්ටම	(අනුකූලයි/ අනුකූල නැත) අනුකූල නොවීම පිළිබඳ කෙටි පැහැදිලි කිරීම	ඉදිරියේදී අනුකූල නොවීමේ තත්ත්වයන් වළකාලීම සඳහා යෝජිත නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග
1	පහත ප්‍රකාශන/ගිණුම් ඉදිරිපත් කළ යුතු දින ඉදිරිපත් කර ඇත			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශනය	අනුකූලයි		
1.2	රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූලයි		
1.3	වෙළඳ හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වෙළඳ අත්තිකාරම්)	අදාළ නැත		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නැත		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නැත		
1.5	වෙනත්	අදාළ නැත		
2	පොත් හා ලේඛන පවත්වාගෙන යාම (මු.රෙ. 445)			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ (267/2018) ප්‍රකාර ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන ගොස් ඇත	අනුකූලයි		
2.2	පුද්ගල පඬිනඩි ලේඛනය/ පුද්ගල පඬිනඩි කාඩ්පත් යාවත්කාලීනව පවත්වාගෙන ගොස් ඇත.	අනුකූලයි		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන ගොස් ඇත.	අනුකූලයි		
2.4	අභ්‍යන්තර විගණන ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන ගොස් ඇත.	අනුකූලයි		
2.5	නියමිත දිනට සියලු මාසික ගිණුම් සාරාංශ (සිගාස්) සකස් කොට භාණ්ඩාගාරයට ඉදිරිපත් කර ඇත.	අනුකූලයි		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන ගොස් ඇත.	අනුකූලයි		
2.7	භාණ්ඩ ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන ගොස් ඇත.	අනුකූලයි		

2.8	තොග ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන ගොස් ඇත.	අනුකූලයි
2.9	භාණ්ඩ ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන ගොස් ඇත.	අනුකූලයි
2.10	වගකීම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන ගොස් ඇත.	අනුකූලයි
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA -N20) යාවත්කාලීනව පවත්වාගෙන ගොස් ඇත.	අනුකූලයි
3	මූල්‍ය පාලනය පිණිස කාර්යයන් පැවරීම (මු.රෙ. 135)	
3.1	ආයතනය තුළ මූල්‍ය අධිකාරිය පවරා දී ඇත.	අනුකූලයි
3.2	මූල්‍ය අධිකාරිය පවරා දීම පිලිබඳව ආයතනය තුළ සන්නිවේදනය සිදු කෙරී ඇත.	අනුකූලයි
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ එයට වැඩි සංඛ්‍යාවක් මගින් ඉදිරියට ගෙන යන අයුරින් අධිකාරිය පවරා දී ඇත.	අනුකූලයි
3.4	රජයේ පේරෝල් මෘදුකාංග ගොනුව භාවිත කිරීමේදී ගණකාධිකාරිවරුන් විසින් (2014.05.11) දිනැති අංක (171/2004) දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාර කටයුතු කර ඇත.	අනුකූලයි
4	වාර්ෂික සැලසුම් සකස් කිරීම	අනුකූලයි
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කොට ඇත.	අනුකූලයි
4.2	වාර්ෂික ප්‍රසසම්පාදන සැලැස්ම සකස් කොට ඇත.	අනුකූලයි
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්සම සකස් කොට ඇත.	අනුකූලයි
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ලබාදිය යුතු දිනට ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත භාරදී ඇත.	අනුකූලයි
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහය කල්තබා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත භාරදී ඇත.	අනුකූලයි
5	විගණන විමසුම්	
5.1	සියලු විගණන විමසුම්වලට විගණකාධිපතිවරයා විසින් නිශ්චිත කාල පරාසය තුළ පිළිතුරු සපයා ඇත	අනුකූලයි

6	අභ්‍යන්තර විගණනය	
6.1	මුදල් රෙගුලාසි 134(2) DMA/1-2019 ප්‍රකාර විගණකාධිපතිවරයා විමසීමෙන් අනතුරුව වසර ආරම්භයේදී අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කොට ඇත.	අනුකූලයි
6.2	සියලු අභ්‍යන්තර විගණන වාර්තාවනට මසක් තුළ පිළිතුරු සපයා ඇත.	අනුකූලයි
6.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (40(4)) උප-වගන්තිය ප්‍රකාර සියලු අභ්‍යන්තර විගණන වාර්තා පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ලබාදී ඇත	අනුකූලයි
6.4	මුදල් රෙගුලාසි (134(3)) ප්‍රකාර සියලු අභ්‍යන්තර විගණන වාර්තා පිටපත් විගණකාධිපතිවරයා වෙත භාරදී ඇත.	අනුකූලයි
7	විගණන හා කළමනාකරණ කමිටුව	
7.1	කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක (1-2009) ප්‍රකාර අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් වාර 04ක් පවත්වා ඇත.	අනුකූලයි
8	වත්කම් කළමනාකරණය	
8.1	අංක (01/2017) දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ (07) ඡේදය ප්‍රකාර වත්කම් මිලදී ගැනීම හා බැහැර කිරීමට අදාළ තොරතුරු පාලක ජනරාල්වරයාගේ කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලදී.	අනුකූලයි
8.2	චක්‍රලේඛ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කටයුතු සම්බන්ධීකරණය සඳහා යෝග්‍ය සම්බන්ධීකරණ නිලධාරියෙකු පත් කරන ලද අතර, එසේ නම් කරන ලද නිලධාරියාගේ තොරතුරු ඉහත කී චක්‍රලේඛයේ 13වන ඡේදය ප්‍රකාර පාලක ජනරාල්වරයාගේ කාර්යාලය වෙත යවන ලදී.	අනුකූලයි
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක (05/2016) ප්‍රකාර සමීක්ෂණ මණ්ඩල පවත්වා නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර ඇත.	අනුකූලයි

8.4	සමීක්ෂණ මණ්ඩල හා අදාළ සෙසු නිර්දේශ මගින් අනාවරණය කෙරුණු අතිරික්තයන් හා හිඟයන් සම්බන්ධයෙන් චක්‍රලේඛයේ පනවා ඇති කාල පරිච්ඡේදය තුළ නිසි ක්‍රියාමාර්ග ගන්නා ලදී. අනුකූලයි	අනුකූලයි
8.5	මු.රෙ (772) ප්‍රකාර පරිහරණය කළ නොහැකි ද්‍රව්‍ය බැහැර කිරීම සිදු කරන ලදී	අනුකූලයි
9	වාහන කළමනාකරණය	
9.1	සංචිත වාහන සම්බන්ධ දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ සකසා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කරන ලදී.	අනුකූලයි
9.2	පරිහරණය කළ නොහැකි බවට තීරණය කොට මාස 6කට අඩු කාලයක් ඇතුළත එසේ පරිහරණය කළ නොහැකි වාහන බැහැර කරන ලදී.	අනුකූලයි
9.3	වාහන ලොග් සටහන් පොත යාවත්කාලීනව නඩත්තු කර තිබිණි.	අනුකූලයි
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ (103, 104,) (109) හා (110) ප්‍රකාර ක්‍රියාමාර්ග ගෙන ඇත.	අනුකූලයි
9.5	2016.12.29 දිනැති අංක (30/2016) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (3.1) ඡේදයේ විධිවිධාන ප්‍රකාර වාහනවල ඉන්ධන දහනය නැවත පරීක්ෂා කර ඇත.	අනුකූලයි
9.6	කල්බදු කාල පරිච්ඡේදයෙන් අනතුරුව කල්බදුකරණය කළ වාහන ලොග් සටහන් පොත්වල පූර්ණ අයිතිය මාරු කර ඇත.	අනුකූලයි
10	බැංකු ගිණුම් කළමනාකරණය	
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශන සකසා, සහතික කොට විගණනය සඳහා සූදානම් කරන ලදී.	අනුකූලයි
10.2	සමාලෝචිත වර්ෂය තුළ හෝ පසුගිය වර්ෂවල සිට පැවති අක්‍රිය ගිණුම් පියවන ලදී.	අනුකූලයි

10.3	බැංකු සැසඳුම් ප්‍රකාශන මගින් අනාවරණය කොට ගැලපුම් සිදුකළ යුතුව පැවති ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කරන ලදුව, මාසයක් ඇතුළත එම ශේෂ පියවන ලදී.	අනුකූලයි
11	ප්‍රතිපාදන උපයෝජනය	
11.1	සීමාව ඉක්මවීමෙන් තොරව වෙන්කළ ප්‍රතිපාදන වැය කොට ඇත.	අනුකූලයි
11.2	මු.රෙ. (94(1)) ප්‍රකාර වසර අවසානය වනවිට ඉතිරිව පැවති ප්‍රතිපාදන නොඉක්මවන බැරකම්	අනුකූලයි
12	රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	
12.1	සීමාවන් හා අනුගතව කටයුතු කර ඇත.	අනුකූලයි
12.2	හිඟ ණය පිළිබඳ කාල විග්‍රහයක් සිදුකොට ඇත.	අනුකූලයි
12.3	වසරකට වැඩි කාලයක් හිඟව පැවති ණය ශේෂ පියවා තිබිණි.	අනුකූලයි
13	පොදු තැන්පතු ගිණුම	
13.1	කල්පිනූ තැන්පතු බැහැර කිරීම සම්බන්ධයේන මු.රෙ. (571) ප්‍රකාර කටයුතු කර තිබිණි. අනුකූලයි	අනුකූලයි
13.2	පොදු තැන්පතු සඳහා වූ පාලක ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන ගොස් තිබිණි.	අනුකූලයි
14	අක්මුදල් ගිණුම	
14.1	සමාලෝචිත වර්ෂාවසානයේදී මුදල් පොතෙහි පැවති ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කරන ලදී.	අනුකූලයි
14.2	මු.රෙ. 371 ප්‍රකාර නිකුත් කරන ලද ආවස්ථික අක්මුදල්, කාර්යය අවසන් කිරීමෙන් මසක් ඇතුළත පියවන ලදී.	අනුකූලයි
14.3	මු.රෙ. 371 ප්‍රකාර අනුමත සීමාව ඉක්මවා තදුවිත අනු-අක්මුදල් නිකුත් කොට තිබිණි.	අනුකූලයි
14.4	මාසික පදනමින් අක්මුදල් ගිණුම් ශේෂයේ භාණ්ඩාගාර පොත් හා සසඳා තිබිණි.	අනුකූලයි

15	ආදායම් ගිණුම.	
15.1	ආදායමෙන් ආපසු ගෙවීම් රෙගුලාසි ප්‍රකාර සිදුකොට තිබිණි	අනුකූලයි
15.2	ආදායම් රැස් කිරීම තැන්පතු ගිණුමට බැර කිරීමෙන් තොරව සෘජුවම ආදායම් ගිණුමට බැර කොට තිබිණි	අනුකූලයි
15.3	ආදායම් හිඟ මුදල් ආපසු ලැබීම් මු.රෙ. (176) ප්‍රකාර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කරන ලදී.	අදාළ නැත
16	මානව සම්පත් කළමනාකරණය.	
16.1	අනුමත සේවක සංඛ්‍යාව ඇතුළත කාර්ය මණ්ඩලය වෙත ගෙවීම් සිදුකොට තිබිණි.	අනුකූලයි
16.2	සියලු කාර්ය මණ්ඩල සාමාජිකයන් වෙත ලිඛිතව රාජකාරි ලැයිස්තුවක් නිකුත් කොට තිබිණි.	අනුකූලයි
16.3	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ (2017.09.20) දිනැති අංක (04/2017) දරන චක්‍රලේඛය ප්‍රකාර සියලු වාර්තා එම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කොට ඇත.	අනුකූලයි
17	ජනතාවට තොරතුරු ලබාදීම.	
17.1	තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත හා නියෝග ප්‍රකාර තොරතුරු නිලධාරියෙකු පත්කොට නිසි තොරතුරු ලේඛනයක් යාවත්කාලීනව පවත්වාගෙන යමින් පවතී.	අනුකූලයි
17.2	වෙබ් අඩවියෙන් හෝ විකල්ප ක්‍රියාමාර්ග මගින් ආයතනය පිළිබඳ තොරතුරු ජනතාව වෙත ලබාදී ඇති අතර මෙම වෙබ් අඩවිය හෝ විකල්ප ක්‍රියාමාර්ග මගින් පොදු අධිකාරියට එරෙහි මහජන ඇගයුම්/චෝදනා ලබාදීමට පහසුකම් සලසා තිබිණි.	අනුකූලයි
17.3	තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතේ (08) හා (10) වගන්ති ප්‍රකාර ද්වි-වාර්ෂික හා වාර්ෂික වාර්තා ඉදිරිපත් කොට ඇත.	අනුකූලයි

18	පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක	
18.1	රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ අංක (05/2(01)8) හා (05/2018(1)) දරන චක්‍රලේඛය ප්‍රකාර ආයතනය විසින් පුරවැසි ප්‍රඥප්තියක්/පුරවැසි සේවාදායක ප්‍රඥප්තියක් සකසා ක්‍රියාත්මක කොට ඇත.	අනුකූලයි
18.2	චක්‍රලේඛයේ (2.3) ඡේදය ප්‍රකාර පුරවැසි ප්‍රඥප්තිය/පුරවැසි සේවාදායක ප්‍රඥප්තිය සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම නිරීක්ෂණය කොට තක්සේරු කරනු පිණිස ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට ඇත.	අදාළ නැත
19	මානව සම්පත් සැලැස්ම සකස් කිරීම	
19.1	2018.01.24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 ඇමුණුමෙහි එන ආකෘතිය ප්‍රකාර මානව සම්පත් සැලැස්මක් සකස් කොට ඇත.	අනුකූලයි
19.2	ඉහත කී මානව සම්පත් සැලැස්ම තුළ කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වසරකට පැය 12කට අඩු නොවන අවම පුහුණු අවස්ථාවක් ලබාදීම සහතික කොට ඇත.	අනුකූලයි
19.3	තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත හා නියෝග ප්‍රකාර තොරතුරු නිලධාරියෙකු පත්කොට නිසි තොරතුරු ලේඛනයක් යාවත්කාලීනව පවත්වාගෙන යමින් පවතී.	අනුකූලයි
19.4	ඉහත කී චක්‍රලේඛයේ අංක (6.5) දරන ඡේදය ප්‍රකාර ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීමේ, ධාරිතා වර්ධන වැඩසටහන් සංවිධානය කිරීමේ හා නිපුණතා සංවර්ධන වැඩසටහන් මෙහෙයවීමේ වගකීම ඔහු වෙත පවරන ලදී.	අනුකූලයි
20	ප්‍රතිචාර විගණන ඡේදය	අනුකූලයි
20.1	පසුගිය වර්ෂයන් සඳහා විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද විගණන ඡේදයන්හි පෙන්වා දී ඇති දුර්වලතා නිවැරදි කර ඇත.	

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } පිඅයිසි/ඒ/එල්ඹ /02/24/02

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2025 මැයි 14 දින

ප්‍රධාන ගණන් දීමේ නිලධාරී
පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කාර්යාලය.

ශීර්ෂය - 019 පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය - 019 පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කාර්යාලය, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කාර්යාලය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රදා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 දේපල හා උපකරණ සංචිතය

ජංගම නොවන වත්කම් වටිනාකම් තුළ ඇතුළත් මෝටර් වාහන වටිනාකම රු.239,550,000 ක් ලෙස තක්සේරු කර තිබුණද සිගාස් වත්කම් ලේඛනයේ එය යාවත්කාලීන නොවීම හේතුවෙන් රු. 184,818,700ක් ලෙස සළකා තිබීම හේතුවෙන් මූල්‍ය තත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් වටිනාකම රු. 54,731,300කින් අඩුවෙන් දක්වා තිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3 මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

3.1.1 ප්‍රතිපාදන උපයෝජනය

මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව, සකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය ගැන නිසි සැලකිල්ලෙන් යුක්තව ඇස්තමේන්තු සම්පාදනය කර තිබෙන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විශේෂයෙන් වගබලා ගත යුතුත්, පහත දැක්වෙන කරුණු හේතුවෙන් වාර්ෂික ඇස්තමේන්තු සම්පූර්ණවත් නිවැරදිවත් පිළියෙල කර නොමැති බව නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ වැය විෂය අංක 019-1-1-0-1202-10 යටතේ වෙනත් කටයුතු සඳහා ඉන්ධන වෙනුවෙන් සලසා තිබුණු රු.600,000 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරිව තිබුණු අතර තවත් පුනරාවර්තන වැය විෂයයන් 05 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.11,000,000 ක ශුද්ධ ප්‍රතිපාදන වලින් රු.5,760,598 ක් හෙවත් සියයට 22 සිට සියයට 92 දක්වා සැලකිය යුතු ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයය අංක 019-1-1-0-2106 යටතේ මෘදුකාංග සංවර්ධනය සඳහා සලසා තිබුණු රු.2,000,000 ක ශුද්ධ ප්‍රතිපාදනය සම්පූර්ණයෙන්ම ඉතිරිව තිබුණු අතර තවත් ප්‍රාග්ධන වැය විෂයයන් 02ක් සඳහා සලසා තිබුණු එකතුව රු2,500,000 ක ප්‍රතිපාදනයෙන් රු.1,238,955ක් හෙවත් පිළිවෙලින් සියයට 36 ක් හා සියයට 59 ක් ඉතිරි වී තිබුණි.

(ඇ) පරිපුරක ඇස්තමේන්තු මඟින් වැය විෂය අංක 019-1-1-0-1003 යටතේ වෙනත් දීමනා සඳහා ලබාගත් රු.8,099,000 ක මුදල් කිසිදු වියදමක් වෙනුවෙන් වැය නොකර සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 02 ක් සඳහා මු.රෙ. 66 යටතේ මාරු කර තිබුණු එකතුව රු.4,000,000 කින් රු.3,451,196 ක් හෙවත් සියයට 82 සිට 100 දක්වා ඉතිරි වී තිබුණි.

3.2 බැරකම් හා බැඳීම්වලට ඵලදීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2025 ජනවාරි මාසය තුළ ගෙවා නිබුණු සමාලෝචිත වර්ෂයට අදාළ එකතුව රු. 200,457 ක්වූ දුරකතන හා ජල ගාස්තු පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශන වල ඇමුණුම iv හි බැරකම් පිළිබඳ ප්‍රකාශනය (i) යටතේ දක්වා නොතිබුණි.

(ආ) වැය විෂයය අංක 019-1-1-0-1402 යටතේ තැපැල් හා සන්නිවේදන වියදම් ඉතිරිය රු.111,050 ක් වූ අතර සමාලෝචිත වර්ෂය සඳහා රු.178,531 ක බැරකම් ඇති කරගෙන තිබීම නිසා ඉතිරිය ඉක්මවා රු.67,481 ක බැරකම් වෙනුවෙන් බැඳී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 වාර්ෂික කාර්ය සාධන වාර්තාව

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.2 වන ඡේදය අනුව මාර්ගෝපදේශ 14 ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාවේ 4 වන පරිච්ඡේදය මඟින් ආයතනයේ කාර්යසාධන දර්ශක, ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව ඉදිරිපත් කල යුතු වුවත් එසේ ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව ආයතනයේ කාර්යසාධන දර්ශක ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 වන ඡේදය ප්‍රකාරව සියළුම ගණන්දීමේ නිලධාරීන් විසින් තම ආයතනයට පැවරී ඇති විෂයයන් සහ කාර්යයන් අනුව ඉදිරි වර්ෂයේ පුනරාවර්තන සහ ප්‍රාග්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කල යුතු වුවද, විපක්ෂ නායක කාර්යාලය විසින් ඉදිරිපත් කර තිබූ ප්‍රසම්පාදන සැලැස්මෙහි ප්‍රාග්ධන වැඩසටහන් පමණක් ඇතුළත් කර තිබුණි.

5. මානව සම්පත් කළමණාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයතනය විසින් සමාලෝචිත වර්ෂයේ කාර්යමණ්ඩල පුහුණු වෙනුවෙන් රු.699,795 ක් වියදම් කර තිබූ අතර 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.2 වන ඡේදය, මාර්ගෝපදේශ අංක 14 හි ඇමුණුම 1 හි 6.3 ආකෘතිය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධනය යටතේ ආයතනයේ සංවර්ධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වූ ආකාරය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ආයතනය විසින් සකස් කර තිබුණු මානව සම්පත් සංවර්ධන සැලැස්ම 2018 ජනවාරි 24 දිනැතිව නිකුත් කරන ලද අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුකූල නොවුණු බව නිරීක්ෂණය විය.

ඒ.ජී.ඒ. හෙල්මිණි
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති (වැ.බ.) වෙනුවට


කාර්ය සාධන දර්ශක

නිශ්චිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් % ලෙස සැබෑ නිමැවුම		
	100%- (90%	75%-89%	50%- 74%
පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීම්වලට සහභාගි වීම	✔		
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව තුළ සිය කාර්යභාරය ඉටු කිරීමේදී ගරු විපක්ෂ නායකතුමාට අවශ්‍ය සහාය ලබා දීම	✔		
ගරු විපක්ෂ නායකතුමා වෙනුවෙන් රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන්, විදේශීය නියෝජිතයින් සහ අනෙකුත් අමුත්තන් සම්බන්ධයෙන් සාකච්ඡා සංවිධානය කිරීම, සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම සහ පහසුකම් සැපයීම	✔		
ගරු විපක්ෂ නායකතුමා වෙත ඉදිරිපත් කරන ලද මහජන පැමිණිලි හා ගැටලු සම්බන්ධයෙන් කටයුතු කිරීම	✔		
ගරු විපක්ෂ නායකතුමාගේ උපදෙස් පරිදි විපක්ෂයේ පාර්ලිමේන්තු කණ්ඩායම් රැස්වීම් කැඳවීම.	✔		
සෑම රැස්වීම් සතියකම විවාදයට ගැනීමට නියමිත පනත් කෙටුම්පත්, රෙගුලාසි සහ නියෝගවලට අදාළ සියලුම ලේඛන ඇතුළුව ලිපිගොනු සකස් කර විපක්ෂ පක්ෂ නායකයින්ට ලබා දීම.	✔		
පාර්ලිමේන්තුවේ විපක්ෂය නියෝජනය කරන සියලුම පක්ෂ සමඟ සාකච්ඡා කර පාර්ලිමේන්තු කාරක සභා සඳහා සාමාජිකයින් නම් කිරීම.	✔		
පාර්ලිමේන්තු සැසිවාර සඳහා විපක්ෂයේ කථිකයන්ගේ ලැයිස්තු සකස් කිරීම	✔		
විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන ලද කල් තැබීමේ යෝජනා පාර්ලිමේන්තු මහලේකම්වරයා වෙත යොමු කිරීම.	✔		
විපක්ෂයේ පක්ෂ නායකයින් විසින් ස්ථාවර නියෝග අංක (27/2) යටතේ මතු කරන ලද ප්‍රශ්න පාර්ලිමේන්තු මහලේකම්වරයා වෙත ඉදිරිපත් කිරීම.	✔		
විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් විසින් ගරු අග්‍රාමාත්‍යතුමා වෙත ඉදිරිපත් කරන ලද ප්‍රශ්න පාර්ලිමේන්තුවේ මහලේකම්වරයා වෙත යොමු කිරීම.	✔		
අයවැයේ තුන්වන වර කියවීමේ විවාද කාලසටහන් කෙටුම්පත සඳහා විපක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයාගෙන් අනුමැතිය ලබා ගැනීම.	✔		
අයවැයේ කාරක සභා අවස්ථාවට අදාළ කාලසටහන ඇතුළත් අත්පොත භාෂා තුනකින් සකස් කිරීම.	✔		
අයවැය කාරක සභා අවස්ථාවේ විවාදය සඳහා මන්ත්‍රීවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම.	✔		

ගරු විපක්ෂ නායකතුමාට සහ විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට කාලීන තොරතුරු සැපයීම.	✔		
රටේ වැදගත් කරුණු සම්බන්ධයෙන් පර්යේෂණ සිදු කිරීම, දත්ත රැස් කිරීම සහ ඒ අනුව කෙටි වාර්තා සකස් කිරීම.	✔		
පුහුණු වැඩසටහන් සහ දැනුම බෙදා ගැනීමේ සැසි පැවැත්වීම.	✔		
2024 වර්ෂයට අදාළ වාර්ෂික පරීක්ෂණ මණ්ඩල Board of Survey කටයුතු අවසන් කිරීම	✔		
ප්‍රසම්පාදන කළමනාකරණ අංශය පිහිටුවීම	✔		
දෙපාර්තමේන්තු පොත් භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන සමඟ සැසඳීම.	✔		
මාසික ගිණුම් සාරාංශය සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම.	✔		
විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම.	✔		
පුහුණු සංවර්ධන සැලැස්මක් සකස් කිරීම	✔		
ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම	✔		


ප්‍රකාශන

ස්ථාවර නියෝග 27(2) යටතේ අසනු ලැබූ ප්‍රශ්න



Opposition Leader's Reach – out Diary





2025 අයවැය ප්‍රගති සමාලෝචනය



ප්‍රකාශන

පනත් කෙටුම්පත් සහ විපක්ෂනායක විසින් ඉදිරිපත් කළ සංශෝධන





ගුරුදා සංවාදය






Opposition Bulletin






ප්‍රකාශන

පසුබිම් වාර්තා සංග්‍රහය



කාලීන සිදුවීම්



පත්තර උපුටන



ලාංකික පාර්ලිමේන්තු පූර්වාදර්ශ සහ ක්‍රියාපටිපාටි ලේඛන

